වාර්ෂික වාර්තාව
2023

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

කෙටුම්පත් වාර්ෂික වාර්තාව
2023

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

1981 වර්ෂයේ අංක 59 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත අනුව සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය ස්ථාපනය කරන ලදී. සමුද්‍ර දූෂණය වැළැක්වීම, අවම කිරීම හා පාලනය සඳහා කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා රජයට අදාළ වන සමුද්‍ර දූෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම උදෙසා අධිකාරිය වෙත පැවරී තිබුණු නෛතික බලතල ශක්තිමත් කිරීමට එවකට පැවති පනත අවලංගු කර 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ නව පනත සම්මත කරන ලදු ව, එය 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

සංස්ථාමය තොරතුරු

අධිකාරියේ නම
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

නෛතික පුද්ගලභාවය
2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ ස්ථාපිත කර ඇති නියාමන ආයතනයකි.

ලියාපදිංචි ලිපිනය සහ ප්‍රධාන කාර්යාලය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන	:	011 2554006 /011 2554373
ෆැක්ස්	:	011 2554173 /011 2556505
ඊ මේල්	:	Info@mepa.gov.lk
වෙබ් පිටුව	:	www.mepa.gov.lk

අධ්‍යක්ෂ මණ්ඩලය

- අසේල බී. රේකව මහතා
  සභාපති
  (2023.02.09 සිට)

- දර්ශනී ලහඳපුර මිය
  හිටපු සභාපති
  (2020.02.05 සිට 2023.02.05 දක්වා)

අධ්‍යක්ෂකවරු

- ඒ. ජේ. එම්. ගුණසේකර මයා
  සාමාන්‍යාධිකාරී (වැඩ බලන)

- එස්. එන්. බී. කේ. සුනිල් සේනාරත්න මයා
  අතිරේක ලේකම්
  (පාලන හා මානව සම්පත් අංශය)
  ධීවර අමාත්‍යාංශය
  (2020.02.03 දින සිට 2023.06.21දක්වා)

- ආර්. ඒ. ඩී. එස්. රණතුංග මයා
  අතිරේක ලේකම් (ධීවර සම්පත් කළමනාකරණය)
  ධීවර අමාත්‍යාංශය
  (2023.06.22 දින සිට)

- රියර් අද්මිරාල් ආර්. ඒ. පී. පී. රත්නායක මයා
  අධ්‍යක්ෂ ජනරාල්(මෙහෙයුම්)
  ශ්‍රී ලංකා නාවික හමුදාව

- ආර්. ඒ. ආර්. ආර්. රූපසිංහ මයා
  අතිරේක ලේකම් (පාලන)
  පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය
  (2020.02.03 දින සිට 2023.03.09)

- ආර්. ඩී. එස්. ජයතුංග මහතා
  අතිරේක ලේකම් (පරිසර සංවර්ධන)
  පරිසර අමාත්‍යාංශය
  (2023.03.10 දින සිට)

- ඒ. ඩබ්ලිව්. සෙනෙවිරත්න මයා
  වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්
  වරාය හා නාවික අමාත්‍යාංශය
  වෙළඳ නාවික ලේකම් කාර්යාලය
  (2020.02.03 දින සිට 2023.03.09 දක්වා)

- අජිත් විජේසිංහ මහතා
  අධ්‍යක්ෂ ජනරාල්
  වෙළඳ නාවික දෙපාර්තමේන්තුව
  (2023.03.10 දින සිට)

- පී. වයි. සුමනාවතී මිය
  අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන)
  ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
  මුදල් අමාත්‍යාංශය

- එම්. ආර්. හසන් මයා
  අධ්‍යක්ෂ ජනරාල්
  සාගර කටයුතු, පාරිසරික හා දේශගුණික විපර්යාස අංශය
  විදේශ කටයුතු අමාත්‍යාංශය

- සමන්ත ගුණසේකර මයා
  (ඇමතිතුමා විසින් පත් කළ සාමාජික)

- අයිවන් ද අල්මේදා මහතා
  (ඇමතිතුමා විසින් පත් කළ සාමාජික)

අධිකාරියේ සංවිධාන ව්‍යුහය

Approved Organization Stucture - MEPA



අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

- සභාපති
  අසේල බී. රැකව මහතා
  [Attorney at Law]

- සාමාන්‍යාධිකාරී (වැඩ බලන)
  ඒ. ජේ. එම්. ගුණසේකර මහතා (2021.09.10 සිට)
  [B.Sc, M.Sc (NRM), M.Sc (Maritime Affairs)]

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
  ඒ. ජේ. එම්. ගුණසේකර මහතා
  [B.Sc, M.Sc (NRM), M.Sc (Maritime Affairs)]

- ජ්‍යෙෂ්ඨ කළමනාකරු (නීති)
  ඒ. කාරියවසම් මෙනවිය
  [LLB, M.Sc (Maritime Affairs)]
  (2023.06.30 දින දක්වා)

- රාජකාරී කටයුතු ඉටු කරන කළමනාකරු (පාලන හා මූල්‍ය)
  ඩී. ආර්. සී. ජයවර්ධන මහතා
  [B.Com.sp, M Bus (Accounting)/ LICA]
  (2023.05.08 දින දක්වා)

- රාජකාරී කටයුතු ඉටු කරන කළමනාකරු (පළාත්)
  ආර්. පී. රණවීර මිය
  [B.Sc (Hons), M.Sc (NRM)]
  (2021.02.01 දින සිට)

- රාජකාරී කටයුතු ඉටු කරන කළමනාකරු (මෙහෙයුම්)
  එච්. ටී. එන්. අයි. පියදාස මහතා
  [B.Sc, M.Sc (NRM), M.Sc (Maritime Affairs)]
  (2023.06.01 දින සිට)

- මධ්‍ය කළමනාකරු(දකුණු පළාත)
  ආර්. පී. රණවීර මිය [B.Sc (Hons), M.Sc (NRM)]

- නියෝජ්‍ය කළමනාකරු(පළාත්)
  එච්. ටී. එන්. අයි. පියදාස මහතා
  [B.Sc, M.Sc (NRM), M.Sc (Maritime Affairs)]

- නියෝජ්‍ය කළමනාකරු (නෞකා සමීක්ෂක)
  ආර්. එන්. ප්‍රියදර්ශන මහතා [B.Sc, NDES]

- නියෝජ්‍ය කළමනාකරු (මානව සම්පත් සංවර්ධන)
  ඩබ්ලිව්. එච්. ඒ. එස්. කේ. හිටිබණ්ඩාර මිය
  [B.Sc (Business Administration)]

- සහකාර කළමනාකරු (මෙහෙයුම්)
  ටී. ජී. අයි. පී. අමරනායක මහතා
  [B.Sc.SPC (Hons), M.Sc (DAMm)]

- සහකාර කළමනාකරු (පාලන)
  එස්. එම්. සී. කුමාරගේ මහතා
  [B.B.M.G.T. Sp.)]

- අභ්‍යන්තර විගණක
  ඩබ්.ජේපී. උදාන මහතා.
  [EDBA(Col), Intermediate (CASL), AMA(CMASL)]

- වැඩ බලන සහකාර කළමනාකරු (උතුරු / නැගෙනහිර පළාත)
  ටී. ශ්‍රීපති මහතා .
  [B.Sc, M.Sc in (Environmental Science)]
  (2023.08.06 දින දක්වා)

- සහකාර කළමනාකරු (උතුරු / නැගෙනහිර පළාත)
  ටී. ශ්‍රීපති මහතා
  [B.Sc, M.Sc in (Environmental Science)]
  (2023.08.07 දින සිට)

- සහකාර කළමනාකරු (බස්නාහිර හා වයඹ පළාත)
  ඩබ්. අයි. එච්. කේ. විජේරත්න මහතා
  [B.Sc in Laboratory Science, B.Sc (Hons) in Agriculture, M.Sc (Microbiology)]

- ගණකාධිකාරී
  ඩී. ආර්. සී. ජයවර්ධන මහතා
  [B.Com. sp, MBus (Accounting)/ LICA]
  (2023.09.15 දක්වා)

- සහකාර කළමනාකරු (සැලසුම්)
  කේ. පී. කේ. අයි. යූ. ප්‍රනාන්දු මහතා
  [B.Sc (Hons), M.Sc in (Economics), PGD (Applied Statistics)]
  (2023.10.06 දක්වා)

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ පළාත් හා දිස්ත්‍රික් කාර්යාල

01. බස්නාහිර හා වයඹ පළාත් කාර්යාලය සහ
කොළඹ කාර්යාලය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
අංක 177, නාවල පාර, නාරහේන්පිට, කොළඹ 05.
ටෙලි: 011 2554078/ 071 3462298
ෆැක්ස්: 011 2556505/011 2554173

02. දිස්ත්‍රික් කාර්යාලය - කළුතර දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
නොඃ 28, ගඟබඩ පාර, කළුතර.
ටෙලි: 034 2221790/ 071 2666456
ෆැක්ස්: 034 2221790

03. දකුණු පළාත් කාර්යාලය සහ ගාල්ල
දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල විද්‍යාගාරය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
නොඃ 426/බී, කොළඹ පාර, දඩල්ල, ගාල්ල.
ටෙලි: 091 2233549/ 091 2233547/091 3130888
071 8214184 / 070 5109151
ෆැක්ස්: 091 2233549/ 091 2233547

04. දිස්ත්‍රික් කාර්යාලය - මාතර දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
18, විල්මට් බාලසූරිය මාවත, නුපේ,මාතර.
ටෙලි: 041-2234250/ 071 4926849
ෆැක්ස්: 041 2234250

05. දිස්ත්‍රික් කාර්යාලය - හම්බන්තොට දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
අංක 46, දෙවන මහල,
රුහුණු මාගම්පුර පරිපාලන සංකීර්ණය,
සිරිබෝපුර,හම්බන්තොට.
ටෙලි: 047 2256372/ 071 5293716
ෆැක්ස්: 047 2256372

06. දිස්ත්‍රික් කාර්යාලය - අම්පාර දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල, ගම්සභා මාවත,
තම්බිලුවිල්.
ටෙලි: 067 2265416 / 077 2282052
ෆැක්ස්: 067 2265416

07. නැගෙනහිර පළාත් කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාලය - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
4 කණුව, ත්‍රිකුණාමලය.
ටෙලි: 026 2050805/ 077 4138505
ෆැක්ස්: 026 2050805

08. දිස්ත්‍රික් කාර්යාලය - යාපනය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,යාපනය.
ටෙලි: 021 2212663 / 077 9919496
ෆැක්ස්: 021 2212663

09. දිස්ත්‍රික් කාර්යාලය - පුත්තලම දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
නුග සෙවන බී කොටස,
වයඹ පළාත් සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල, පම්බල,
කාක පල්ලිය.
ටෙලි: 032 2222865/ 071 1406600
ෆැක්ස්: 032 2222865

10. දිස්ත්‍රික් කාර්යාලය - ගම්පහ දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
72/3A, කොළඹ පාර, කුරන, කටුනායක.
ටෙලි: 031 2228606/ 071 8325678
ෆැක්ස්: 031 2228606

11. දිස්ත්‍රික් කාර්යාලය - මන්නාරම දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම.
ටෙලි: 023 2251758/ 077 6110128
ෆැක්ස්: 023 2251758

12. දිස්ත්‍රික් කාර්යාලය - මඩකලපුව දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
නොඃ 03, පිල්ලෙයාර් කෝවිල් පාර,
පළමු හරස් වීදිය, කල්ලඩි, මඩකලපුව.
ටෙලි : 065 2224979 / 071 9979422
ෆැක්ස්: 065 2224979

13. දිස්ත්‍රික් කාර්යාලය - කිලිනොච්චි දිස්ත්‍රික්කය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
නොඃ 05, දුම්රිය පොළ පාර, කිළිනොච්චි.
ටෙලි : 021 2282101 / 070 6768694
ෆැක්ස්: 021 2282101

සභාපතිතුමාගේ පණිවුඩය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් 2023 වසරට අදාළව සටහනක් තැබීමට අවස්ථාවක් ලැබීම ඉතා අගය කොට සලකමි.

ශ්‍රී ලංකා ජල තීරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම, පාලනය කිරීම හා අවම කිරීම වෙනුවෙන් 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම උදෙසා ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය නීරෝගිමත්සාගරයක් සමගින් සුපිරිසිදු වෙරළ තීරයක් නිර්මාණය කිරීම උදෙසා කාර්යන් රැසක් ඉටු කරනු ලබයි.

මේ වන විට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 2008 අංක 35 දරන සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනත මගින් බලාත්මක වන රෙගුලාසි සමුද්‍ර දූෂණ වළක්වා ගැනීමේදී ක්‍රියාත්මක වන නීති රීති වර්තමානයට මෙන්ම අනාගතයට ගැළපෙන අයුරින් රෙගුලාසි සංශෝදනය කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බැවින් ඒ සඳහා මේ වන විට කඩිනමින් කටයුතු සිදු කරමින් පවතී.

2023 වසරේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාවන් මගින් රුපියල් මිලියන 26.242 ක ආදායමක් උපයා ගැනීමට අධිකාරිය සමත් වී ඇත. එසේම නෞකා බංකර් බලපත්‍ර නිකුත් කිරීම මගින් රුපියල් මිලියන 2.2 ක්ද ආයතනික වශයෙන් බංකර් සේවා බලපත්‍ර නිකුත් කරමින් මිලියන 2.34 ක ආදායමක්ද අධිකාරිය මගින් උපයා ඇත. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වශයෙන් සමුද්‍රීය සහ වෙරළ පරිසරය ආරක්ෂා කර ගැනීම හා දූෂණය අවම කිරීම වෙනුවෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර එම වැඩසටහන් අධිකාරියට වැය බරක් නොමැතිව අනුග්‍රාහක දායකත්වය යටතේ ක්‍රියාත්මක කළ බවද සඳහන් කරමි. මේ අතර ප්‍රධාන තැනක් ගන්නා වැඩසටහනක් වශයෙන් (NOSCOP) හදිසි තෙල් විසිරුම් සැලැස්ම යාවත්කාලීන කිරීමේ වැඩසටහන හඳුන්වා දිය හැකිය. මෙහිදී සිදු විය හැකි සමුද්‍රීය ආපදාවකදී ඒ හා සම්බන්ධ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන එක්ව ක්ෂණිකව ක්‍රියාත්මක වීම තුළින් එම ආපදා තත්වය අවම කිරීම, පාලනය කිරීම හා වැළැක්වීමට ක්‍රියා කිරීම මෙමගින් අපේක්ෂා කෙරෙයි.

සමුද්‍රීය ආපදාවකදී අදාළ තොරතුරු කඩිනමින් ලබා ගනිමින් අදාළ පාර්ශවකාර ආයතන සමග ඒ වෙනුවෙන් ක්ෂණිකව මෙහෙයුම් දියත් කිරීම සඳහා මෙම වසරේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට මහත් අඩුපාඩුවක්ව තිබූ මෙහෙයුම් මැදිරිය ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර එය ලබන වසරේ මැද භාගයේදී විවෘත කිරීමට කටයුතු සැලසුම් කර ඇත. මෙයද අනුග්‍රාහක දායකත්වය යටතේ සිදු කරන ව්‍යාපෘතියකි.

සුහුරු තාක්ෂණය යොදා ගනිමින් ජංගම දුරකතන යෙදුමක් මගින් වෙරළ කසල කලමණාකරන කටයුතු විධිමත් ක්‍රමවේදයකට අනුව සිදු කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන්හි සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරයි. මේ තුලින් නිකසල සාගරයක් හා නිකසල වෙරළ තීරයක් අනාගත ශ්‍රී ලාංකික පරපුරට දායාද කිරීමට හැකිවනු ඇත.

එම්.වී එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර හේතුවෙන් අපවිත්‍ර වූ වෙරළ තීරයන් තවදුරටත් පිරිසිදු කරමින් පවතින අතර එහි නඩු කටයුතු සිදු කරගෙන යනු ලබන නීතිපති දෙපාර්තමේන්තුවට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වශයෙන් ලබා දිය යුතු උපරිම සහයෝගය නිරන්තරයෙන් ලබා දීම සිදු කරයි.

මේ සියලු කටයුතු සිදු කරගෙන යාම සඳහා ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ සහයෝගය, අග්‍රාමාත්‍ය තුමන්ගේ සහයෝගය, විෂය භාර අමාත්‍යතුමන්, රාජ්‍ය අමාත්‍යතුමන්,අමාත්‍යාංශ ලේකම් තුමන්, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය,සාමාන්‍යාධිකාරීතුමන් ඇතුළු සියලුම සාමාජික සාමාජිකාවන්ගෙන් ලැබුණු සහයෝගය ඉතා අගය කොට සලකමි.

අසේල බී. රැකව

සභාපති

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය

රාජ්‍ය ආයතන සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවම මට්ටමක වෙන් වී තිබූ අවධියක අධිකාරියේ වැදගත් කාර්යභාරයන් රැසක් සිදු කරගෙන යාමට අපට හැකි විය. අනුග්‍රාහක දයකත්වයෙන් ලබා ගනිමින් මනා මූල්‍ය කළමනාකරණයකින් හා අවම මානව සම්පත් සමගින් මෙම කාරණා සිදුකිරීමට හැකි වීම මහත් සතුටකි. නිරෝගීමත් සාගරයක් සමගින් සුපිරිසිදු වෙරළ තීරයක් යන දැක්ම අනුව යමින් දිවයිනේ වෙරළ තීරයන් අයත් වන දිස්ත්‍රික් දාහතරම නියෝජනය වන පරිදි හඳුනා ගත් වෙරළ තීරයන්හි පුද්ගලික අංශයේ හා රාජ්‍ය නොවන සංවිධානයන්හි දායකත්වය ඇතිව වෙරළ රැකබලා ගන්නන් පත් කරමින් නිරන්තරයෙන් වෙරළ පිරිසිදු කිරීම් පවත්වාගෙන යාම අප අධිකාරිය මගින් සිදු කරනු ලැබීය. මීට අමතරව වසර පුරා හඳුනාගත් ස්ථානයන්හි විශේෂ වෙරළ පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර සංවිධානයන්හි දායකත්වය නිරන්තරයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ලබා දෙන ලදී.

තව ද ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු වෙරළ තීරයන් ස්ථාපිත කිරීම 2022 වසරේ දී ආරම්භ කරන ලද ඒ අනුව නීලධජ වෙරළ තීරයන් 4ක් ලබන වසරේ මැද භාගයේ දී ස්ථාපිත කිරීමට කටයුතු සැලසුම් කරන ලද අතර මේ සඳහා ආරුගම්බේ, පාසිකුඩා, බෙන්තොට, සහ උණවටුන යන වෙරළ තීරයන් හඳුනාගත් අතර එම නීලධජ වෙරළ ස්ථාපිත කිරීමේ කටයුතු මේ වන විටත් කඩිනමින් ඉදිරියට සිදු කර ගෙන් යනු ලබනවා.

මේ වන විට අවම පහසුකම් මාධ්‍යයේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වරාය කාර්යාලයේ මෙහෙයුම් ක්‍රියාත්මක වන අතර එහි පහසුකම් වැඩි දියුණු කරමින් නව කාර්යාල පරිශ්‍රයක් ඉදි කිරීමේ කටයුතු මේ වසරේ ආරම්භ කරන ලදී. ඒ අනුව 2024 මැද භාගය වන විට එම කටයුතු අවසන් කරමින් පහසුකම් සහිත නවීන කාර්යාලයකින් සමන්විතව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වරාය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සැලසුම් කොට ඇත.

තව ද අනුග්‍රාහක දායකත්වය යටතේ හඳුනා ගත් සමුද්‍ර පරිසර පද්ධති තුල කඩොලාන පැළ රෝපණය කිරීමේ ව්‍යාපෘති ගණනාවක් මෙන්ම කොරල්පර රෝපණය කිරීමේ වැඩසටහන් කිහිපයක් 2023 වසරේ දී ක්‍රියාත්මක කරනු ලැබීය.

මෙසේ 2023 වසරේ සමුද්‍රීය පරිසර ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් එදිනෙදා සිදු කරනු කාර්යභාරයට අමතරව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මෙසේ 2023 වසරේ දී සමුද්‍රීය පරිසර හා වෙරළ පරිසරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් වූ කාර්යයන් රැසක් සිදු කළ අතර මේ තුලින් ශ්‍රී ලංකාවට නීල ආර්ථිකයක් කර රැගෙන් යාමට මහත් පිටුවහලක් වනු ඇත. එසේම සංචාරික කර්මාන්තයේ ප්‍රගමනයට ද මෙම කටයුතු සෘජු දායකත්වයක් ගෙන දෙනු ලබයි.

මෙම කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමන් අධිකාරියේ සභාපතිතුමන් ඇතුළු අධ්‍යකෂක මණ්ඩලයත් මාගේ කාර්යය මණ්ඩලයෙනුත් ලැබුණු සහයෝගයට මාගේ කෘතඥතාව පළ කර සිටිමි.

ඒ. ජේ. එම්. ගුණසේකර

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිළධාරී

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

දැක්ම

"අනාගත පරපුර සඳහා නිරෝගිමත්
වෙරළ සහ සාගර පරිසරයක්."

මෙහෙවර

"දැනුවත් කිරීම, පර්යේෂණ, මහජන සහභාගිත්වය,
ජාතික, කළාපීය හා අන්තර්ජාතික සහයෝගීතාව,
ක්ෂණික ක්‍රියාත්මක වීම හා බලාත්මක කිරීම තුළින්
වෙරළ සහ සාගර පරිසරයේ භාරකරු වීම."

පටුන

1. පසුබිම

1.1 හැඳින්වීම .... (2)

1.2 අධිකාරියේ වගකීම් සහ කාර්යභාරයන් .... (2-3)

2. නීල ආර්ථිකයක් උදෙසා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ දායකත්වය .... (4-6)

3. ආයතනයේ පාලන වාර්තාව

3.1 පාලන රාමුව .... (8)

3.2 අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය .... (8)

3.3 2022 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය .... (8-9)

3.4 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්කේ ස්වාධීනත්වය .... (9)

3.5 අනෙකුත් කමිටුන් .... (10)

3.6 විගණන හා කළමනාකරණ කමිටුව .... (10)

3.7 ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු .... (10)

3.8 කළමනාකරණ කමිටුව .... (10)

3.9 අභ්‍යන්තර පාලනයන් .... (10)

3.10 අභ්‍යන්තර විගණනය .... (11)

3.11 ආයතනික කළමනාකරණය .... (11)

3.12 අනුකූලතාවය සහ විනිවිදභාවය .... (11)

4. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

4.1 මූලික ක්‍රියාකාරකම් .... (14)

4.2 විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන .... (14)

4.3 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම .... (14)

4.4 වර්ෂය තුළ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම් .... (14)

4.5 ආදායම සහ අතිරික්තය / හිඟය .... (14)

4.6 දේපළ, පිරියත හා උපකරණ .... (14)

4.7 අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ගේ දීමනාව .... (15)

4.8 අධිකාරිය සමඟ අධ්‍යක්ෂවරුන්ගේ කොන්ත්‍රාත්තු .... (15)

4.9 අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය .... (15)

4.10 මානව සම්පත් .... (15)

4.11 පියවිය යුතු වගකීම් .... (15)

4.12 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල වීම .... (15)

4.13 ව්‍යවස්ථාපිත ගෙවීම් .... (15)

4.14 මූල්‍ය ප්රකාශන ප්රකාශයට පත්කිරීමෙන් පසු සිදුවීම් .... (15)

4.15 අඛණ්ඩ පැවැත්ම .... (15)

4.16 විගණකවරුන්ගේ වේතනය .... (16)

4.17 ආයතනික පාලන පිළිබඳ ව අධයක්ෂවරුන්ගේ ප්රකාශන .... (16)

4.18 වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම .... (16)

5. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම .... (17-18)

6. මානව ප්‍රාග්ධන වාර්තාව .... (19-21)

7. මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

7.1 නෞකා මඟින් සිදු වන සමුද්‍ර දූෂණය පිටු දැකීමේ ක්‍රම වේදයන් වැඩි දියුණු කිරීම. .... (24-28)

7.2 සාගර ඔත් ජීවීන් (Biofouling) කළමනාකරණය .... (28-30)

7.3 වඩා කාර්යක්ෂම හා ඵලදායී ජාතික තෙල් හා රසායන ද්‍රව්‍ය විසිරීම් වලට ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් ක්‍රියාවට නැංවීම. .... (30-40)

7.4 ගොඩබිම් පරිසරයේ ක්‍රියා නිසා සිදුවන සමුද්‍ර දූෂණය පාලනය සඳහා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම. .... (41-57)
7.5 වෙරළ සහ සමුද්‍ර පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කර සංරක්ෂණය කිරීම. .... (57-59)
7.6 සමුද්‍ර පරිසර දූෂණය හා බලපෑම් පිළිබඳ දැනුවත් කිරීම .... (59-61)

8. පරිපාලන, නීති, මානව සම්පත් සංවර්ධන, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය අංශ වල සේවය සහ වගකීම

8.1 පරිපාලන අංශය .... (64)
8.2 නීති අංශය .... (64-65)
8.3 අභ්‍යන්තර විගණන අංශය .... (65)
8.4 මානව සම්පත් සංවර්ධන අංශය .... (66)
8.5 සැලසුම් අංශය .... (66-67)
8.6 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගති වාර්තාව - පුනරාවර්තන වියදම් .... (67)

9. අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන

9.1 ගිණුම්කරන ප්‍රතිපත්ති .... (70-73)
9.1.1 ආයතනික තොරතුරු .... (70)
9.1.4. දේපළ, පිරියත සහ උපකරණ .... (71)
9.2 ආදායම .... (73)
9.3 සේවක ප්‍රතිලාභ .... (73)
9.4 සංසන්දනාත්මක තොරතුරු .... (74)
9.5 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සිදුවීම් .... (74)
9.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය .... (74)
9.7 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් .... (74)
9.8 අඛණ්ඩ පැවැත්ම .... (74)
9.9 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන් .... (74-75)
9.10 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය .... (75)
9.11 හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය .... (76)
9.12 මුදල් ප්‍රවාහ ප්‍රකාශය .... (77)
9.13 මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් .... (78-102)

10 විගණකාධිපති වාර්තාව .... (103-114)

1. පසුබිම



1.1 හැඳින්වීම

ලෝකයේ පවතින්නා වූ විශාලතම හා සුවිශේෂී ම පරිසර පද්ධතිය වශයෙන් සාගරය අර්ථකථනය කිරීම නිවැරදිය. ස්වභාවධර්මයේ අපූර්වතම නිර්මාණයක් වන "සාගරය" ලෝකයේ වැඩිම ජීවීන් ප්‍රමාණයකට ආහාර සපයනු ලබන හෙයින් "ලෝකයේ විශාලතම ආහාර නිෂ්පාදනාගාරය", 'සාගරය' බවට පත්ව ඇත.

දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව අසීමිත වූ සම්පත් සාගරයකින් වටවී ඇති රාජ්‍යයක් වශයෙන් හඳුන්වා දිය හැකි අතර ම, අප රට මෙන් අට ගුණයක විශාලත්වයකින් යුත් සාගර කලාපයකට හිමිකම් කීම මගින් පමණක් නොව විවිධත්වයකින් සමන්විත වූ මනරම් වෙරළ පරිසරයක් දායාද වී ඇති බැවින් මනා සංචාරක ආකර්ෂණයක් ද නතු කරගෙන ඇත.

මෙම සාගර කලාපයේ සම්පත් නෙළා ගැනීමේ පූර්ණ අයිතිය අප සතුව පවතී. එසේම අන්තර්ජාතික නාවික ගමන් මාර්ගයක පිහිටීම තුළින් සුවිශේෂී වූ ආර්ථික වටිනාකමක් ද එක්වී තිබීම තවත් විශේෂත්වයක් වන්නේය.

මෙවන් අගනාකම් රාශියකින් සමන්විත සමුද්‍රීය හා වෙරළ පරිසරය විවිධ මිනිස් ක්‍රියාකාරකම් හමුවේ දිනෙන් දින දූෂණයට ලක් වෙමින් පවතී. නාවික කටයුතු වලදී මෙන්ම ගොඩබිම තුළදී සිදු කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් තුළින් මේ තත්ත්වය උද්ගත වී ඇත.

මෙවන් පසුබිමක සාගර හා වෙරළ පරිසරය දූෂණයෙන් තොරව පවත්වාගෙන යාමේ අරමුණින් 1981 වසරේ අංක 59 දරණ සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනත අනුව සමුද්‍ර දූෂණය වැළැක්වීමේ අධිකාරිය ස්ථාපිත කරන ලදී. සමුද්‍ර දූෂණය අවම කිරීම පාලනය කිරීම වැළැක්වීම වෙනුවෙන් ක්‍රියාකිරීම හා ශ්‍රී ලංකා රජයට අදාළ වන සමුද්‍රීය දූෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගනිමින් අධිකාරිය තවදුරටත් ශක්තිමත් කරමින් වැඩි බලතල සහිතව එවකට පැවති පනත් අවලංගු කර 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ නව පනත පසුකාලීනව හඳුන්වාදීම සිදුවිය.ඉතා කාලෝචිත ක්‍රියාවක් වූ මෙය 2009 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වෙමින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වශයෙන් නව නෛතිකත් බලයක් සහිතව ස්ථාපිත විය.

ඉදිරියේ දී ඇතිවන සංකීර්ණ මානව අවශ්‍යතා හමුවේ වර්ධනය වන නාවික කටයුතු රට අභ්‍යන්තරයේ මෙන්ම වෙරළ ආශ්‍රිතව කර්මාන්ත ශාලා බිහි වීම ඇතුළුව මිනිස් ක්‍රියාකාරකම් වර්ධනය වීමේ දී මෙන්ම වැඩි වශයෙන් සාගර සම්පත් උකහා ගැනීම තුළදී සමුද්‍රීය හා වෙරළ පරිසරය සම්බන්දයෙන් ඇති වෙන දූෂණ තත්වයන් අවම කරමින්, පාලනය කරමින් හා වළක්වමින් නීල ආර්ථිකයක් කරා රට රැගෙන යාමටත් අධිකාරියේ පූර්ණ දායකත්වය ලබාදිය යුතු කාලය එළැඹී ඇත.

ඒ අනුව සමුද්‍රීය පරිසර අරක්ෂණ අධිකාරිය වශයෙන් මේ වන විට රට පත්වී තිබෙන සංකීර්ණ තත්වය හමුවේ වුවද සමුද්‍රීය පරිසරය දූෂණයෙන් තොරව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනය වශයෙන් අනෙකුත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව සමුද්‍ර පරිසර හිතකාමී විවිධ වැඩසටන් ගණනාවක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ක්‍රියාවට නංවා ඇති බව සඳහන් කරමු.

1.2 අධිකාරියේ වගකිම් සහ කාර්යභාරයන්

1.2.1 අධිකාරියේ කර්තව්‍ය

(අ) පනතේ විධි විධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග ඵලදායී ලෙසත් කාර්යක්ෂම ලෙසත් පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ආ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන්ගෙන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ කාර්යයන්ගෙන් දූෂණය විම වැළැක්වීම, අඩු කිරීම, පාලනය කිරීම සහ කළමනාකරණ කාර්යය සඳහා වූ යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ ක්‍රියාවේ යෙදවීම.

(ඇ) ශ්‍රී ලංකා වෙරළ තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කළාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන දූෂණය වීම වැළැක්වීමේ, අවම කිරීමේ, පාලනය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා වෙනත් දෙපාර්තුමේන්තු, නියෝජ්‍යායතන සහ රජයේ සහ පෞද්ගලික ආයතන සමග සහයෝගීතාවයෙන් පර්යේෂණ පැවැත්වීම.

(ඇ) ශ්‍රී ලංකා වෙරළ තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ යම් තෙල්, හානිකර ද්‍රව්‍ය කිසිවක් හෝ වෙනත් යම් දූෂකයකින් දූෂණය විම මග හරවා කළමනාකරණය කිරීමට, සුරක්ෂිත කිරීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

(ඉ) යම් තෙල් වර්ග, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යයක් සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම.

(ඊ) ශ්‍රී ලංකා රජය විසින් ස්ථිර කිරීම, පිළිගැනීම, එකඟ වීම හෝ අනුමත කිරීම සිදුකර ඇති හෝ සිදු කරනු ලැබිය හැකි සමුද්‍ර දූෂණය සම්බන්ධය සියලු ජාත්‍යන්තර සම්මුතීන් සහ අදාළ ප්‍රොටෝකෝල පිළිගැනිම හා නිර්දේශ කිරීම.

(උ) ජාතික තෙල් දූෂණ හදිසි සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කීරීම.

(ඌ) ඛණිජ තෙල් හෝ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමේ හෝ එහි යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්, සේවා උපකොන්ත්‍රාත්කරුවන් සහ වෙනත් තැනැත්තන්ගේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සහ පරික්ෂා කිරීම.

(එ) සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විවිධ ප්‍රජා කණ්ඩායම් අතර දැනුවත් බව ඇති කිරීම.

(ඒ) ඉහතින් වූ කාර්යයන් සියල්ල හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් යම් සියලු ක්‍රියා හා දේ සිදු කිරීම.

1.2.2 අධිකාරියේ බලතල

(අ) නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයකින් ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍ර කළාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කළාපය ඵලදායී ලෙස සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීම.

(ආ) යම් නැව් ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයක් සම්බන්ධයෙන් පරීක්ෂණ සහ විමසීම් පැවැත්වීම සහ නඩු පැවරීම.

(ඇ) දූෂණය වැළැක්වීමේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා ජල තීරය තුළ සහ වෙනත් යම් සමුද්‍ර කළාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කළාපය තුළ පවත්වා ගෙන යන මුහුදු තෙල් ප්‍රවාහන කටයුතු හා බංකරින් මෙහෙයුම් සියල්ල පාලනය කිරීම.

(ඈ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම.

(ඉ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීමේ දී අවශ්‍ය විය හැකි යම් නිළධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කර වීම.

(ඊ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු ම ගිවිසුම් වලට කෙළින් ම හෝ තත්කාර්යය සඳහා අධිකාරිය විසින් බලය පවරන ලද යම් නිළධරයකු හෝ නියෝජිතයෙකු මඟින් එළඹීම සහ ඉටු කිරීම.

(උ) පනත් යටතේ අධිකාරියට පවරන ලද බලතල සියල්ල හෝ ඉන් කිසිවක් පැවරීම සඳහා නාමයෙන් හෝ තනතුරින් යම් තැනැත්තෙකු පත් කිරීම.

(ඌ) මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් බැංකුවක හෝ මූල්‍යායතනයක ගිණුම් විවෘත කර ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාම.

(එ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණය ණයට ගැනීම.

(ඒ) චංචල හා නිශ්චල දේපළ යන දෙයාකාරයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන ප්‍රධාන, පරිත්‍යාග සහ රික්තවරණ පිළිගැනීම හා ලබාගැනීම සහ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා ඒවා යොදා ගැනීම.

(ඔ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම.

(ඕ) අධිකාරිය මඟින් සපයනු ලබන යම් සේවාවක් සඳහා යම් තැනැත්තෙකුගෙන් හෝ පුද්ගල මණ්ඩලයකින් ගාස්තු අය කිරීම.

(ක) ශ්‍රී ලංකාවේ වරායවලට පැමිණෙන සියලු නැව් වලින් අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු හෝ අය කිරීම් අය කර ගැනීම.

(ග) අධිකාරියේ කර්තව්‍යයන් නියමාකාරයෙන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ මේ පනතේ නිශ්චිත ලෙස සඳහන් බලතල කිසිවකට ආනුෂංගික වන්නා වූ හෝ අන්‍යාකාරයකින් අධිකාරිය මත පවරන ලද්දා වූ හෝ භාර කරන ලද්දා වූ වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

2. නීල ආර්ථිකයක් උදෙසා සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියේ දායකත්වය

පසු ගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාව සිය ආර්ථික සංවර්ධනයට ගොඩබිම කේන්ද්‍ර කොට ගත් සම්පත් දායක කර ගෙන ඇති බව පැහැදිලි වේ. කෙසේ නමුත් තව දුරටත් ගොඩබිම සම්පත් මත් පමණක් රඳා පවතිමින් ආර්ථික සංවර්ධනය ඇති කර ගත නොහැකි බව මැනවින් පැහැදිලිව ඇත. ඒ අනුව නීල ආර්ථික සංකල්ප හෙවත් සමුද්‍රීය සම්පත් භාවිත කොට ගනිමින් ආර්ථික සංවර්ධන ඇති කර ගැනීමේ සංකල්පය වත්මන් ලෝකයේ වැදගත් ආර්ථික සංවර්ධන ක්‍රමෝපායන් බවට පත් වී ඇත.

සාගරය ආශ්‍රිත සම්පත් තිරසාර ලෙස යොදා ගනිමින් ආර්ථික සංවර්ධන වන අතර ඒ හරහා ජනතාවගේ රැකියා අවස්ථා පුළුල් කිරීම හා ජීවන තත්වය ඉහළ නැංවීම අපේක්ෂා කරන අතර ම සාගරයේ මෙන්ම එයට සම්බන්ධ පරිසර පද්ධති අරක්ෂා කිරීම ද අත්‍යවශ්‍ය අංග ලෙස සලකනු ලැබේ.

ගොඩබිම මෙන් අට ගුණයක පමණ සාගර කළාපයක සම්පත් නෙළා ගැනීමේ අයිතිය සතු දූපත් රාජ්‍යයක් වුව ද ශ්‍රී ලංකාවේ සාගර සම්පත් නිස්සාරණය භාවිතය ඉතා අවම මට්ටමක පවති. සාගරය හා බැදුණු කර්මාන්ත ලෙස ධීවර කර්මාන්ත හා සංචාරක කර්මාන්ත පැවතිය ද ඒවා ද ප්‍රශස්ථ මට්ටමේ දියුණුවක් ලබා නොමැත. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ සාගර කළාපය යොදා ගත හැකි කර්මාන්ත අවස්ථා රාශියක් පවතී. ධීවර හා සංචාරක ක්ෂේත්‍රයන්ට අමතරව සාගර ජීව තාක්ෂණික අංශය (Marine biotechnology), සාගර ඛණිජ නිස්සාරණය, සාගර ආශ්‍රිත පුනරනනීයන් බලශක්තිය උත්පාදනය, නාවික ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත කර්මාන්ත, සාගරය හරහා තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රය හා සාගර ඉදි කිරීම් ආශ්‍රිත ඉනිනේරු ක්ෂේත්‍ර නීල ආර්ථිකයේ වැදගත් අංශයන් වේ.

ඉහත සදහන් අංශයන්හි සංවර්ධනයත් සමග සමුද්‍ර සම්පත් භාවිතය ඉහළ යන විට සාගර පරිසර පද්ධතියට සිදු වන බලපෑම් හා සමුද්‍ර දුෂණයට ඇති ඉඩකඩ කිසිසේත්ම අමතක කළ නොහැක. නීල ආර්ථික සංකල්පය තුළ සාගර පරිසරය ආරක්ෂා කිරීම ද ඇතුළත් ව ඇත්තේ එබැවින් වන අතර සමුද්‍ර දූෂණය හා වෙනත් හේතූන් නිසා පරිසර පද්ධති බිඳ වැටීම නීල ආර්ථිකයේ තිරසාර බව බිඳ වැටීමට ද හේතු වේ.

ශ්‍රී ලංකා ජල තීරයේ සමුද්‍ර දුෂණය පාලනය වැළැක්වීම හා කළමනාකරණය සඳහා වන 2008 අංක 35 දරණ සමුද්‍ර දුෂණය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම උදෙසා ස්ථාපිත සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරි නීල ආර්ථික සංවර්ධනයේ තිරසාර බව රැක ගැනීම සදහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. විශේෂයෙන් ම 2008 අංක 35 දරණ සමුද්‍ර දුෂණය වැළැක්වීමේ පනත හා ඒ මගින් බලාත්මක වන රෙගුලාසි මගින් සමුද්‍ර දුෂණයට එරෙහිව නීති මගින් කටයුතු කරනු ලැබේ. ඉදිරි සංවර්ධන කටයුතු වලට ගැළපෙන අයුරින් මෙම පනත රෙගුලාසි හා සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ද මතු ව ඇති බැවින් ඒ සදහා මේ වනවිට කටයුතු කරමින් පවතී. නීතිමය කටයුතු හරහා සමුද්‍ර දූෂණය පාලනයට අමතරව විවිධ ව්‍යාපෘති හරහා සමුද්‍ර දූෂණය පාලනයට මෙම අධිකාරිය කටයුතු කරනු ලබයි. ගොඩබිම හරහා සාගරයට හා වෙරළ කලාපයට එකතු වන දූෂක ද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීමට හා එකතු වන දූෂක ද්‍රව්‍ය එම පරිසරයෙන් ඉවත් කිරීම සදහා වෙරළ රැකබලා ගන්නන් පත් කිරීම, වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් සංවිධානය හා සම්බන්ධීකරණය ඇල මාර්ග ආශ්‍රිත අපද්‍රව්‍ය එකතු කිරීම සදහා අපද්‍රව්‍ය පෙරණ (Waste strainer) යෙදීම ආදී වැඩසටහන් පසුගිය වසර කිහිපය තුළ පුද්ගලික අංශයේ සහයෝගයෙන් ක්‍රියාත්මක විය. සමුද්‍රය ආශ්‍රිත නෞකා අනතුරු සම්පත් ගවේෂණය වැනි ක්‍රියාකාරකම් නිසා සිදු වන සමුද්‍ර දුෂණයේදී එම දූෂණ පාලනයට හා හානි වූ පරිසර පද්ධති ප්‍රතිස්තාපනයට ද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අනෙකුත් පාර්ශවකාර ආයතන සමග එක්ව කටයුතු කරනු ලබයි.

3. ආයතනයේ පාලන වාර්තාව

විධිමත් ආයතනික පාලනයක් මඟින් පාර්ශවකරුවන්ගේ අගය හා අධිකාරියේ සම්පත් ආරක්ෂා කිරීම සහ උපාය මාර්ගික වර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තිමත් පදනමක් සැපයේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සමාලෝචනයට සහ මහජනතාව විසින් අධිකාරියේ මෙහෙයුම් හා අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා දක්වනු ලබන කැමැත්ත විධිමත් ආයතනික පාලනයක් පවත්වා ගෙන යාම සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වේ. එසේ ම ඉහළ මට්ටමේ අනුගත වීම විධිමත් පාලනයක් පවත්වාගෙන යාම අවසාන වශයෙන් ආයතනික සහ පාලනය තහවුරු කරනු ලබයි. 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත අනුව අධිකාරියේ පාලන රාමුව සකස් කර ඇති අතර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිපත්තිමය සහයෝගය ලබා දේ.

3.1 පාලන රාමුව



3.2 අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

අධිකාරියේ සාර්ථකත්වය පිටු පස ඇති බලවේගය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වේ. ඉහළ සුදුසුකම්ලත් සහ පළපුරුද්දක් සහිත සාමාජිකයන් 10 දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ උපාය මාර්ග, මූල්‍ය හා කීර්ති නාමයට මෙන් ම අධිකාරියේ සියලු කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට අදාලව නිවැරදි තීරණ ගැනීමට නිරන්තරයෙන් කැප වේ. මෙහි දී, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමූහික හැකියාවන් උපයෝගි කරගනිමින්, 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතෙහි බලතල හා කාර්යයන් වලට අනුකූල ව ඉහළ ම මට්ටමේ ආයතනික පාලනයක් සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි.

අධ්‍යක්ෂවරුන්ගේ කාර්ය භාරයන් සහ වගකීම්, ඒවායේ නිශ්චිත සංයුතිය මෙන් ම ඔවුන්ගේ තනතුරු වල ධූර කාලය තීරණය කිරීම ද මෙහි දී වැදගත් වේ. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සභාපති ඇතුළුව සාමාජිකයින් තිදෙනෙක් පත් කරනු ලබනු අතර පරිසර, විදේශ කටයුතු, මුදල් හා ධීවර විෂයන්ට අදාල විෂය භාර අමාත්‍යවරයන්ගේ අමාත්‍යාංශයන්හි ලේකම්වරයන් වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්, වෙළඳ නැව් අධ්‍යක්ෂකවරයා ලෙස තත්කාලයෙහි ධූර දරන තැනැත්තා, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික හමුදාපති වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයෙක් හා අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් තත්කාලයෙහි ධූර දරන තැනැත්තා ද අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලබයි.

3.3 2022 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසික ව පවත්වනු ලබන අතර, විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවස්ථානුකූල ව පවත්වනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ මත අවශ්‍ය අවස්ථාවල දී කරුණු පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය අතිරේක තොරතුරු ලබා දීම සඳහා මාණ්ඩලික නිළධාරීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයක් මත පවත්වනු ලබන අතර රැස්වීම් වලට පෙර කළමනාකාරිත්වයන් විසින් අධ්‍යක්ෂවරුන්ට අදාළ සවිස්තරාත්මක පසුබිම් තොරතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සපයනු ලැබේ. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පහත වගුවේ දැක්වේ.

	නම	අධ්‍යක්ෂ මණ්ඩලයේ දරන තනතුර	සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන
01	දර්ශනී ලහඳපුර මිය	හිටපු සභාපති (ඇමතිතුමා විසින් පත්කළ සාමාජික)	01/12
02	අසේල බී. රැකව මයා	සභාපති (ඇමතිතුමා විසින් පත්කළ සාමාජික) - විධායක අධ්‍යක්ෂ	11/12
03	ඒ. ජේ. එම්. ගුණසේකර මයා	සාමාන්‍යාධිකාරී (වැඩ බලන)	12/12
04	එස්. එන්. බී. කේ. සුනිල් සේනාරත්න මයා	විධායක නොවන අධ්‍යක්ෂ	03/12
05	ආර්. ඒ. ඩී. එස්. රණතුංග මයා	විධායක නොවන අධ්‍යක්ෂ	06/12
06	රියර් අද්මිරාල් ආර්. ඒ. පී. පී. රත්නායක මයා	විධායක නොවන අධ්‍යක්ෂ	11/12
07	ආර්. ඒ. ආර්. ආර්. රූපසිංහ මයා	විධායක නොවන අධ්‍යක්ෂ	00/12
08	ආර්. ඩී. එස්. ජයතුංග මයා	විධායක නොවන අධ්‍යක්ෂ	06/12
09	ඒ. ඩබ්ලිව්. සෙනෙවිරත්න මයා	විධායක නොවන අධ්‍යක්ෂ	00/12
10	අජිත් විජේසිංහ මයා	විධායක නොවන අධ්‍යක්ෂ	06/12
11	වයි. පී. සුමනාවතී මිය	විධායක නොවන අධ්‍යක්ෂ	12/12
12	එම්. ආර්. හසන් මයා	විධායක නොවන අධ්‍යක්ෂ	07/12
13	සමන්ත ගුණසේකර මයා	විධායක නොවන අධ්‍යක්ෂ	12/12
14	අයිවන් ද අල්මේදා මයා	විධායක නොවන අධ්‍යක්ෂ	11/12

වගුව 1: අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ තොරතුරු

3.4 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්කේ ස්වාධීනත්වය

අධිකාරියේ සාර්ථකත්වය සහ තිරසාරභාවය සඳහා වන සමස්ත වගකීම සහ වගවීම මූලික වශයෙන් පැවරී ඇත්තේ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට වන අතර උපාය මාර්ගික උපදෙස් සහ සමස්ත කාර්යසාධනය කෙරෙහි හොඳ නායකත්වයක් ලබා දීම සහ පාර්ශවකරුවන්ගේ යහපත සුරැකීම සඳහා කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික කාර්යභාරය වේ.

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සේවා කාලය වසර තුනකට සීමා වේ. තීරණ ගැනීමට පෙර, අධ්‍යක්ෂ මණ්ඩලයට ආයතනික කළමනාකරණයෙන් සහ අවශ්‍ය නම් බාහිර වෘත්තිකයන්ගෙන් අදාළ උපදෙස් හා තොරතුරු ලබා ගත හැකි අතර ආයතනික කළමනාකරණය විසින් අවශ්‍ය තොරතුරු සැපයිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අවශ්‍ය අවස්ථාවල දී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සැපයීම අධිකාරියේ කළමනාකරණයේ වගකීම යි. අධ්‍යක්ෂ මණ්ඩලය අධිකාරියේ අරමුණු ළඟාකර ගැනීම සඳහා වගකිව යුතු වේ. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ ඒවා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මඟින් අධිකාරිය තුළ ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරයි. අභ්‍යන්තර විගණනය හා බාහිර විගණනය මගින් පෙන්වා දෙනු ලබන විගණන ගැටලු සහා අභ්‍යන්තර පාලන දුර්වලතා විගණන හා කලමනාකරණ කමිටුව මගින් අධිකාරියේ පාලන හා මෙහෙයුම් කටයුතු සමාලෝචනය කරනු ලබයි.විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ තීරන ගැනිම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

අධිකාරියේ දැක්ම සාක්ෂාත් කර ගැනීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය යුතුය. මෙම වගකීම ඉටු කිරීමේදී, අධිකාරියේ උපාය මාර්ග සාක්ෂාත් කර ගැනීමේ අවසාන වගවීමත්, එහි මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රතිඵල අධීක්ෂණය කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. තව ද, ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම ඔවුන්ගේ තවත් වගකීමක් වේ.

ඉහත සඳහන් කළ කරුණු වලට අමතරව, වාර්ෂික මූල්‍ය වාර්තා, වාර්ෂික අයවැය ලේඛනය, පාලන වාර්තාවන්, ක්‍රියාකාරකම් සැලසුම් සහ මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කිරීම යනාදියෙ හි අනුමැතිය සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

එමෙන්ම පත්වීම් බලධාරියා ලෙස පත්වීම් ප්‍රධානියා විසින්,කාර්යමණ්ඩල උසස්වීම් ප්‍රධාන ප්‍රාග්ධන වියදම් සහ ආයෝජන වලට අදාළ අනුමැතියන් ලබා දීම ද අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය යටතේ සිදු කරයි.

3.5 අනෙකුත් කමිටුන්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කටයුතු සඳහා අනු කමිටුවක් ලෙස විගණන හා කළමණාකරණ කමිටුව ප්‍රධාන කාර්යයක් ඉටු කරයි.

3.6 විගණන හා කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන හා කළමනාකරණ කමිටුව ස්වාධීන උප කමිටුවක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට වග කියනු ලැබේ. අභ්‍යන්තර පාලන පද්ධතිය අවදානම් කළමනාකරණය සමඟ මුල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනය ඇතුළු ව සියලු වර්ගවල පාලනයන් ආවරණය කරනු ලබයි. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය හා අවදානම් කළමනාකරණය ආයතනයට දරා ගත හැකි අවදානම් රාමුවක් තුළ කළමනාකරණය කර ගනු ලබයි. ඒ අනුව, ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා, විමර්ශන වාර්තා සමාලෝචනය කර කළමණාකාරීත්වයට මඟ පෙන්වීම විගණන කමිටුව මඟින් සිදු කරනු ලබයි.

සියලු ම අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි සහ ඒවායේ ප්‍රමාණවත් භාවයෙහි ඵලදායීතාවය සමාලෝචනය කිරීමට සහ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම අධිකාරියේ විගණන කමිටුවේ මූලික වගකීමක් වේ.

3.7 ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු

භාණ්ඩ,සේවා සහ වැඩ මිළ දී ගැනීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය මඟින් නිකුත් කර තිබේ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සඳහා වඩාත් මුල්‍යමය වශයෙන් වාසිදායක හා ගුණාත්මකව හොඳම සේවා සහ සැපයුම් ලබා ගැනීම සඳහාත් විනිවිදභාවය සහතික කිරීම, ප්‍රමාදයන් අවම කිරීම සඳහාත් ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය මඟින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්, ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු මඟින් ක්‍රියාත්මක කරයි. මිළ දී ගැනීම් වල තාක්ෂණික පිරිවිතරයන් කෙරෙහි තාක්ෂණික ඇගයීම් කමිටුව අවධානය යොමු කරන අතර ප්‍රසම්පාදන කමිටුව විසින් මිළ දී ගැනීම් වල අනෙකුත් අංශයන් ගැන සැළකිළිමත් වේ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිහේ ප්‍රසම්පාදන කමිටු වටිනාකම් අනුව පහත පරිදි වේ.

1. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (රු.500,000/=ට වැඩි වටිනාකමක් ඇති ප්‍රසම්පාදනයන් සඳහා)
2. සුළු ප්‍රසම්පාදන කමිටුව (රු.500,000/=ට අඩු වටිනාකමක් ඇති ප්‍රසම්පාදනයන් සඳහා)

3.8 කළමනාකරණ කමිටුව

අධිකාරියේ කළමනාකරණ කමිටුව සභාපති, ප්‍රධාන විධායක නිළධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හෝ අංශ ප්‍රධානීන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් එක් අයෙකු(අවස්ථානුකූලව) කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි. කමිටුවේ ප්‍රධානියා ද රැසේවීම්වලට සහභාගී වේ. එසේම අවස්ථානුකූල ව අවශ්‍ය අවස්ථා වලදී වර්ෂය තුළ කමිටුව රැස් වන අවස්ථා ගණන වෙනස් විය හැක.

පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණය

අධිකාරියේ මෙහෙයුම් අඛණ්ඩතාව රඳා පවතින්නේ එහි සියලු පාර්ශවකරුවන් සමඟ සුහද ව හා අර්ථවත් ලෙස කටයුතු කිරීම මත ය. අධිකාරිය සහ එහි පාර්ශවකරුවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගෙන ඇත. අධිකාරියේ මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා අධිකාරිය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සමඟ සමීපව සම්බන්දව කටයුතු කරයි.

අධිකාරියේ ප්‍රධාන ව්‍යාපෘති, වැඩසටහන් සඳහා භාණ්ඩාගාරය මඟින් අරමුදල් සැපයීම සිදු කරන අතර ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ද ලබා දේ. සන්නිවේදන කටයුතු වාචිකව හා ලිඛිතව සිදු කරන අතර සභාපති / සාමාන්‍යාධිකාරි ආයතන සමඟ සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රධාන සම්බන්ධීකරණ නිළධාරින් ලෙස කටයුතු කරයි. අධිකාරිය විසින් නිත්‍යානුකූලව අවශ්‍ය සහ අදාළ තොරතුරු හැකි උපරිම ආකාරයෙන් සැපයීම සිදු කරයි.

3.9 අභ්‍යන්තර පාලනයන්

අධිකාරිය කාර්යක්ෂම ව ක්‍රියාත්මක වීමට ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් අත්‍යවශ්‍ය වේ. අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීම, නිසි වාර්තා පවත්වා ගෙන යාම සහ විශ්වාසදායක තොරතුරු සැපයීම සහතික කිරීම මෙම අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමේ අරමුණ වේ. එබැවින් අධිකාරිය සීමිත සම්පත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ආයතනික අරමුණු කරා ලගා වීම සඳහා භාවිතා කිරීම අභ්‍යන්තර පාලනයේ ප්‍රධාන අංගය වේ.

3.10 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මෙහෙයවනු ලබන්නේ වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ගණකාධිකාරීවරයෙකු විසිනි. අභ්‍යන්තර පාලනයන් තක්සේරු කිරීම, අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීම සහ ගණුදෙණු වල සම්පූර්ණභාවය තහවුරු කිරීම සඳහා විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලසුම් පවතී. මීට අමතර ව, කළමනාකාරිත්වයට නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීමේ අරමුණ ඇති ව විශේෂ පරීක්ෂණ පැවැත්වීම සඳහා ඔවුන්ට පවරා ඇත.

අධිකාරියෙහි වියදම් හා ආදායම් වලට අදාළ අවදානම් ප්‍රදේශ හඳුනා ගැනීම, විගණන විමසුම් වලට පිළිතුරු යැවීමට පෙර සමාලෝචනය කිරීම විගණකාධිපතිවරයාගේ වාර්තාව සාකච්ඡා කිරීම සහ සිදු කරන ලද සත්‍ය කාර්යයන් සහ වාර්ෂික සැලසුම් වරින් වර සමාලෝචනය කිරීම අභ්‍යන්තර විගණනය විසින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන් වේ.

3.11 ආයතනික කළමනාකරණය

අවස්ථානුකූල ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික දිශානතිය, ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මත පදනම්ව අධිකාරියේ නිත්‍ය කටයුතු සභාපති හෝ සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබයි.

ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් සහ ප්‍රාදේශීය කාර්යාලවල මෙහෙයුම් ලෙස අධිකාරියේ මෙහෙයුම් කටයුතු කොටසේ දෙකකට බෙදේ. ප්‍රාදේශීය මෙහෙයුම් කටයුතු කළමණාකරු(පළාත්)ගේ සුපරීකශනය යටතේ පළාත්භාරව කටයුතු කරන සහකාර කළමනාකරුවන්ගේ අධීක්ෂණය යටතේ මෙහෙයවනු ලබන්නේ දිස්ත්‍රික් සමුද්‍රිය පරිසර නිළධාරින් මඟින් වන අතර, අනෙකුත් අංශවල නියෝජ්‍ය කළමනාකරුවන් හෝ සහකාර කළමණාකරුගේ සහය ලැබේ. වඩා හොඳ කළමනාකරණයක් සඳහා ප්‍රධාන කාර්යාලය දෙපාර්තුමේන්තු කිහිපයකට බෙදා ඇති අතර සෑම ඒකකයක් ම මෙහෙයවනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හෝ කළමනාකරුවෙකු විසන් වන අතර අධිකාරියේ එදිනෙදා ක්‍රියාකාරිත්වයට සභාපතිවරයාට සහ සාමාන්‍යාධිකාරීවරයාට සහාය වේ. ආයතනික කළමණාකරුවන් අදාළ ක්ෂේත්‍රවල අවශ්‍ය කුසලතා, පළපුරුද්ද සහ අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් ඇති වෘත්තිකයන් වේ.

3.12 අනුකූලතාවය සහ විනිවිදභාවය

අධිකාරියට අදාළ වන සියලුම නීති, රෙගුලාසි, ප්‍රමිති, සම්මත භාවිතයන්ට අනුකූල වීම අධිකාරියේ සාර්ථකත්වයට හා තිරසාරභාවයට අත්‍යවශ්‍ය වේ. අධිකාරියෙහි ආයතනික පාලනය ව්‍යුහගත වී ඇත්තේ 2003 දී ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ සම්මත පරිචය පිළිබඳ සංග්‍රහයේ ප්‍රකාශයට පත් කර ඇති මාර්ගෝපදේශයන්ට අනුව ය. ශක්තිමත් ආයතනික පාලන පිළිවෙත් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එම අවශ්‍යතාවයන්ට අනුකූල ව කටයුතු කිරීමට කැප වී සිටී.

සියලු ම කටයුතු වල විනිවිදභාවය පවත්වා ගැනීමට අධිකාරිය කැප වී සිටී. අධිකාරිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLPASS/ SLFRS/ LKAS) සහ වගවීම සහතික කිරීම සඳහා අදාළ රෙගුලාසි වලට අනුකූල ව කටයුතු කරයි. 1971 අංක 38 දරණ මුල්‍ය පනතට හා රජයේ මුදල් රෙගුලාස හා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අධිකාරියේ දෛනික මෙහෙයුම් කටයුතු වල දී යොදා ගැනේ. මූල්‍ය ප්‍රකාශන වාර්ෂික ව ප්‍රකාශයට පත් කර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන අතර විගණකාධිපතිවරයා බාහිර විගණන කටයුතු සිදු කරයි.

4. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යනු 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ සංස්ථාගත කරන ලද රාජ්‍ය නියාමන අධිකාරියකි. මෙම අධිකාරිය කළමනාකරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසිනි.

අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය අංක 177, නාවල පාර, නාරාහේන්පිට කොළඹ 05 යන ලිපිනයේ පිහිටා ඇත. මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSASs) සහ භාණ්ඩාගාර චක්‍රලේඛ වල විධිවිධාන වලට අනුකූල ව සකස් කොට ඉදිරිපත් කර ඇත.

4.1 මූලික ක්‍රියාකාරකම්

සාගර පරිසරය වර්තමාන පරපුරේ අවශ්‍යතා සඳහා මෙන්ම අනාගත පරපුරේ අවශ්‍යතා සඳහාද යොදාගත හැකි වීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සමුද්‍ර දූෂණය වැළැක්වීම, පාලනය හා කළමනාකරණය උදෙසා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ක්‍රියාත්මක වේ. එහි මූලික කාර්යභාරයක් වනුයේ 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත හා ඒ යටතේ සකස් කර ඇති රෙගුලාසි බලාත්මක කිරීම, අදාල ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සහ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය හා බලාත්මක කිරීමයි.

4.2 විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ගණකාධිකාරීවරයා විසින් නිසි පරිදි අත්සන් කර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසන් අනුමත කරන ලද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් විගණනය කර ඇත. විගණකාධිපති වාර්තාව 10 වන පරිච්ඡේදයේ දක්වා ඇත.

4.3 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර එය අධිකාරියේ වර්තමාන තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් නිරූපණය කරයි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 69 සිට 102 දක්වා පිටු වල දක්වා ඇති පරිදි සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

4.4 වර්ෂය තුළ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 01 මගින් නියම කර ඇති පරිදි, පෙර මූල්‍ය වර්ෂයේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් වසර තුළ දී සිදු වී නොමැත.

4.5 ආදායම සහ අතිරික්තය / හිඟය

සංසන්දනාත්මක සංඛ්‍යා සමඟ 2023 දෙසැම්බර් 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල වල සාරාංශය පහත දැක්වේ.

අයිතමය	2023	2022
මුළු ආදායම (රු.)	545,041,426.00	761,854,231.00
මුළු වියදම (රු.)	457,539,955.00	552,603,480.00
අතිරික්තය/ හිඟය (රු.)	7,501,471.00	209,250,751.00

4.6 දේපළ, පිරියත හා උපකරණ

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර 100 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 08 හි දක්වා ඇත.

4.7 අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ගේ දීමනාව

2022 සහ 2023 වර්ෂයන් තුළ ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ දීමනා පහත පරිදි වේ.

2023 (රු.)	2022 (රු.)
466,550.00	228,000.00

මෙම වැටුප් හා වේතන ගෙවීම 2015 අංක 01 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛණයේ ප්‍රතිපාදන අනුව සිදු කර ඇත.

4.8 අධිකාරිය සමඟ අධ්‍යක්ෂවරුන්ගේ කොන්ත්‍රාත්තු

අධිකාරිය සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ ඍජු හෝ වක්‍ර ක්‍රියාකාරකම් නොමැත.

4.9 අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ අභ්‍යන්තර පාලන ක්‍රමයක් පිළිබඳ සවිස්තරාත්මක හා පුළුල් පද්ධතියක් ස්ථාපිත කර ඇත.

4.10 මානව සම්පත්

අධිකාරියේ මෙහෙයුම් මෙහෙවර සහ දැක්ම යතාර්ථයක් බවට පත්කිරීමේ දී මානව සම්පත් වල වැදගත් කාර්යභාරය අධිකාරිය විසින් හඳුනා ගෙන තිබේ. ඒ අනුව, අධිකාරියේ මානව සම්පත් ප්‍රාග්ධනය ඉහළ නැංවීමට සහ ආයතනික අරමුණු හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ දායකත්වය ප්‍රශස්ත මට්ටමෙන් ලබා ගැනීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. අධිකාරියේ මානව සම්පත් ප්‍රතිපත්තිය මඟින් කරනුයේ සියලුම තනතුරු කාණ්ඩ වල නිළධාරින්ට දේශීය හා විදේශීය පුහුණුව තුළින් ඔවුන්ගේ දැනුම හා කුසලතා අඛණ්ඩව ඉහළ නැංවීම සඳහා ප්‍රමාණවත් අවස්ථාවන් ලබා දීමයි. මානව සම්පත් තුළ ඉහළ මට්ටමේ තාක්ෂණික හා කළමනාකරණ හැකියාවක් ඇති බව සහතික කිරීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම අධිකාරියේ ප්‍රමුඛ පරමාර්ථයක් වී තිබේ. මෙම වාර්තාවේ 19 සිට 21 දක්වා පිටු වල මානව ප්රාග්ධන වාර්තාව දක්වා ඇත.

4.11 පියවිය යුතු වගකීම්

මූල්‍ය ප්‍රකාශන දිනය වන විට අධිකාරියට එරෙහිව නඩු පවරා නොමැත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන අධිකාරියේ මූල්‍ය ස්ථායිතාවයට හෝ එහි අනාගත මෙහෙයුම් කෙරහි කිසිදු ද්‍රව්‍යමය බලපෑමක් ඇති නොකරනු ඇත.

4.12 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල වීම

අදාළ නීති රීති හා රෙගුලාසි උල්ලංඝනය වන ආකාරයේ කිසිදු කටයුත්තක අධිකාරිය නිරත වී නොමැත.

4.13 ව්‍යවස්ථාපිත ගෙවීම්

අදාළ නියාමන හා ව්‍යවස්ථාපිත බල අධිකාරින් විසින් ගෙවිය යුතු යැයි නියම කර ඇති සියලු ම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත මූල්‍ය සම්පත් භාවිතා කරමින් නියමිත වේලාවට සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමෙන් හා විශ්වාසයෙන් උපරිම ලෙස සෑහීමකට පත් වේ.

4.14 මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීමෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය වන ප්‍රමාණාත්මක වැදගත්කමක් ඇති කිසිදු සිදු වීමක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට පසුව සිදු වී නොමැත.

4.15 අඛණ්ඩ පැවැත්ම

අධිකාරියේ දැක්ම, අරමුණු ලඟා කර ගැනීම, මෙහෙයුම් වැඩි දියුණු කිරීම සහ අනාගතය සඳහා සමුද්‍රිය පරිසරය ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික සැලැස්ම / ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන, අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය මත පදනම්ව සකස් කර ඇත.

4.16 විගණකවරුන්ගේ වේතනය

අධිකාරිය විසින් විගණන ගාස්තු ලෙස 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපති වෙත විගණන ගාස්තු ලෙස රු:1,679,376.00 ක් ගෙවා ඇත. අධ්‍යක්ෂවරුන් නිරීක්ෂණය කළ පරිදි, විගණකාධිපති, අධිකාරිය සමඟ ගිවිසුම් පිළිබඳ වෙනත් කිසිදු සම්බන්ධතාවයක් හෝ බැඳීමක් නොමැත.

4.17 ආයතනික පාලන පිළිබඳ ව අධයක්ෂවරුන්ගේ ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සහතික කිරීම් සිදු කරයි;

1. අධිකාරිය සිය මෙහෙයුම් සිදු කිරීමේ දී අදාළ වන සියලු ම නීති හා රෙගුලාසි වලට අනුකූල වන අතර අදාළ නීති හා රෙගුලාසි වලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.
2. අධිකාරිය සම්බන්ධ ගිවිසුම් වල දී අධ්‍යක්ෂවරුන්ගේ සියලු ම ප්‍රමාණාත්මක සම්බන්ධතා ප්‍රකාශ කර ඇත.
3. අධිකාරියේ මෙහෙයුම් වැඩ අඛණ්ඩ ව ක්‍රියාත්මක වීමට සහය දැක්වීමේ උපකල්පනය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසන් අධිකාරියේ ආයතනික / ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කර ඇති අතර අනාගතයේ දී එහි මෙහෙයුම් දිගටම කරගෙන යාමට අධිකාරියට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමකට පත් වේ. ඒ අනුව, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය මත ය.
4. අධ්‍යක්ෂවරුන් මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනයන් සහ අවදානම් කළමනාකරණය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ සමාලෝචනයක් සිදු කර ඇති අතර, එහි කාර්යක්ෂමතාව සහ සාර්ථකව පිළිපැදීම පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගෙන ඇත.
5. ආයතනික පාලන නීති රීති වලට අනුකූල වන ක්‍රියා පටිපාටි සහ භාවිතයන් මෙම වාර්තාවේ 70 සිට 102 දක්වා පිටු වල ආයතනික පාලන වාර්තාවේ විස්තර කර ඇත.

4.18 වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය මෙයින් පිළිගනී. මෙම වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනු ලබන්නේ,

අසේල බී. රූකව මහතා

සභාපති

5. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තුන්දෙනෙකුගෙන් සමන්විත වේ. එහි සභාපතිත්වය භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන සුමනා යාපා මහත්මිය විසින් දරනු ලබන අතර, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සුනිල් සේනාරත්න මහතා (2023/03/31) සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂක සමන්ත ගුණසේකර මහතා සෙසු කමිටු සාමාජිකයන් විය. තවද ජාතික විගණන කාර්යාලයේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය භාර විගණන අධිකාරී සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී විය. අධිකාරියේ අභ්‍යන්තර විගණක ඩබ්ලිව්.ඒ.පී.උදාන මහතා 2023/10/26 වන දින දක්වා අධිකාරියේ අභ්‍යන්තර විගණක වශයෙන් කටයුතු කරන ලදී.ජාතික විගණන කාර්යාලයේ නියෝජ්‍ය විගණකාධිපති, කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගී වූ අතර ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ආර්. එම්. එම්. එස්. පෙරේරා මහත්මිය විශේෂ නිරීක්ෂකයෙකු වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට සහභාගී විය. සුනිල් සේනාරත්න මහතා 2023/06/21 දින කමිටු සාමාජිකත්වයෙන් ඉවත්වීම හේතුවෙන් ආර්. ඒ. ඩී. එස්. රණතුංග මහතා 2023/06/22 දින සිට කමිටු සාමාජිකයෙකු වශයෙන් පත්කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුවේ කැඳවුම්කරු වශයෙන් කටයුතු කරන ලද අභ්‍යන්තර විගණක ඩබ්ලිව්.ඒ.පී.උදාන මහතා 2023/10/26 දින සිට එම තනතුරෙන් තාවකාලිකව ඉවත් කර සහකාර කළමණාකරු(මූල්‍ය) වශයෙන් සේවා අවශ්‍යතාවය මත පත් කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුවේ කැඳවීම මත සභාපති, සාමාන්‍යාධිකාරී , ගණකාධිකාරී, සහ අනෙකුත් අදාළ අංශභාර නිලධාරීන් අවශ්‍ය අවස්ථාවලදී කමිටුව ඉදිරියේ පෙනී සිටිමින් අදාල කරුණු පැහැදිලි කිරීම් සිදුකරන ලදී.

ජාතික විගණන කාර්යාලය මඟින් ඉදිරිපත් කරන විගණන විමසුම් වල පවතින දුර්වලතා හා අභ්‍යන්තර පාලන ක්‍රමවල පවත්නා අඩුපාඩු ඇගයීමට ලක් කරන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධයෙන් කළමනාකරණය සමඟ සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා අනෙකුත් රෙගුලාසිවල දක්වා ඇති පරිදි අධිකාරියේ කටයුතු සිදු කරනු ලබන බවට තහවුරුවක් ලබාගැනීම සඳහා විගණනය සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලැබීය. මෙහිදී අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම්, අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීම හා නඩත්තුව, ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවය පවත්වාගෙන යාම ඇතුළු සියලුම මූල්‍ය, පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාකාරකම් විගණනයට භාජනය විය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් ගණකාධිකාරීවරයා විසින් සකස් කර ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රගති වාර්තා පරීක්ෂා කර බලා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සභාපතිතුමිය හා සාමාන්‍යාධිකාරීතුමා වෙත අවශ්‍ය කරන නිර්දේශ ලබාදෙන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා ඔවුන්ගේ නිරීක්ෂණ, නිගමන හා නිර්දේශ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලදී. ඊට අතිරේකව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා වලින් අනාවරණය කරගත් කරුණු හා විගණන ක්‍රමවේදවල ඵලදායීතාවය ඇගයීමට ලක්කල අතර එහිදී අඩුපාඩු අවම කරගැනීමට අවශ්‍ය කරන උපදෙස් හා මඟපෙන්වීම් අභ්‍යන්තර විගණන අංශයට ලබාදෙන ලදී. 2023 වර්ෂයට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලදී.

	නම	විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය	විගණන කමිටු රැස්වීම් ගණන/ සහභාගීත්වය
01	සුමනා යාපා මිය	සභාපති (අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය)	04/04
02	සමන්ත ගුණසේකර මහතා	අධ්‍යක්ෂක (සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය)	03/04
03	සුනිල් සේනාරත්න මහතා	සාමාජික (අතිරේක ලේකම් - පාලන,මා.ස.සං, මූල්‍ය) - ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය) (2020.02.06 - 2023.06.21)	01/04
04	ආර්. ඒ. ඩී. එස්. රණතුංග මහතා	අතිරේක ලේකම්(ධීවර සම්පත් කළමනාකරණ) ධීවර අමාත්‍යාංශය (2023.06.22 දින සිට)	03/04
05	ආර්. එම්. එම්. එස්. පෙරේරා මිය	නිරීක්ෂක (ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය) 2023.10.20 දින	01/04
06	විජිතා තයාලන් මිය	නිරීක්ෂක (විගණන අධිකාරී - විගණකාධිපති දෙපාර්තමේන්තුව)	03/04
07	එන්. ජෙයාගනේෂ් මහතා	නිරීක්ෂක (ප්‍රධාන අභ්‍යන්තර විගණක - වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)	04/04
08	ඩබ්ලිව්. ඒ. පි. උදාන මහතා	කැඳවුම්කරු (අභ්‍යන්තර විගණක - සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය) (2023.10.26 දක්වා)	03/04

වගුව 2:2023 වර්ෂය තුළ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ විගණන හා කළමනාකරණ රැස්වීමව පිළිබඳව වාර්තා

6. මානව ප්‍රාග්ධන වාර්තාව

"සේවක සබඳතා ගොඩනගා ගැනීම සහ සේවක සහභාගීත්වය වැඩි කිරීම"

සේවක සබඳතා ගොඩනැගීම සහ සේවක සහභාගීත්වය වැඩි කිරීම ධනාත්මක සහ ඵලදායී වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ තීරණාත්මක අංගයක් ලෙස සැලකිය හැකි වේ. මෙම සංකල්පය මගින් සේවක සබඳතා ගොඩනැගීම එනම් ආයතනයක් තුළ සේවා යෝජකයින් සහ සේවකයින් අන්තර් ක්‍රියා කරන ආකාරය සහ සන්නිවේදනය කරන ආකාරයත්, කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය අතර ධනාත්මක සහ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් සම්බන්ධතාවයක් වර්ධනය කිරීමද හැකි වනු ඇත. එසේම ඉහළ කළමනාකරණය සහ සේවකයින් අතර විවෘත හා විනිවිද පෙනෙන සන්නිවේදනය දිරිමත් කිරීම ද සාධාරණ හා අපක්ෂපාතී ආකාරයකින් ගැටුම් සහ ආරවුල් විසඳීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මෙන්ම පැහැදිලි දුක්ගැනවිලි පටිපාටියක් තිබීම හා විශ්වාසය සහ සාධාරණත්වය පවත්වා ගැනීමට මෙය මහත් සේ උපකාරී වේ. එසේම සේවකයින් ඔවුන්ගේ දායකත්වය සහ ජයග්‍රහණ සඳහා පිළිගැනීම සහ අගය කිරීම මෙන්ම ඔවුන්ගේ උත්සාහයන් හඳුනා ගැනීමෙන් චිත්ත ධෛර්යය සහ සබඳතා ශක්තිමත් කිරීමද සිදු කල හැකිය. සියලුම සේවකයින්ට සාධාරණව හා සමානව සලකන බවට සහතික වීම වෙනස්කම් කිරීම සහ පක්ෂග්‍රාහී වීම සේවක සබඳතාවලට හානි කළ හැකිය.

එසේම සේවක සහභාගීත්වය වැඩි කිරීම තුළින් සේවකයින්ගේ කැපවීම, කාර්ය සාධනය සමස්තයක් ලෙස සංවිධානයටම බලපානු ලබයි. සේවකයින් සංවිධානයේ මෙහෙවර, දැක්ම තේරුම් ගත යුතු අතර කාර්ය සාධනය පිළිබඳ නිතිපතා ප්‍රතිපෝෂණ ලබා දීම සහ සේවකයින් පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් පුහුණු වීම් ලබා දීම, සේවක අභිප්‍රේරණ උපාය මාර්ග, සේවක සුභ සාධනය ද ඉහළ නැංවීම සිදු කළ යුතු ය.

සාරාංශයක් ලෙස, සේවක සබඳතා ගොඩනගා ගැනීම සහ සේවක සහභාගිත්වය වැඩි කිරීම යනු සේවකයින්ට වටිනාකමක්, ඔවුන් කැමති සහ අභිප්‍රේරණයක් දැනෙන සේවා ස්ථානයක් නිර්මාණය කිරීමයි. එය සන්නිවේදනය, පිළිගැනීම, අවස්ථා සහ ධනාත්මක සේවා ස්ථාන සංස්කෘතියක් අවශ්‍ය වන අඛණ්ඩ උත්සාහයකි. ඵලදායි ලෙස සිදු කරන විට, එය ඉහළ රැකියා තෘප්තිය, වැඩිදියුණු කළ ඵලදායිතාව සහ අඩු පිරිවැටුම් අනුපාතවලට තුඩු දිය හැකි අතර අවසානයේ සේවකයින්ට සහ සංවිධානයට ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

සේවක සංඛයාව 2023 (GRI 405-1)

වයස් කාණ්ඩය	ජ්‍යෙෂ්ඨ කළමණාකරනය		මධ්‍යම කළමණාකරනය		කණිෂ්ඨ කළමණාකරනය		සහකාර සමුද්‍ර පරිසර නිළධාරී		කළමණාකරන සහකාර		වෙනත්	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
18-20	-	-	-	-	-	-	-	-	-	-	-	-
21-30	-	-	-	-	-	-	01	03	02	04	12	-
31-40	-	-	01	-	02	-	08	11	03	17	24	-
41-50	01	-	04	01	03	04	01	01	03	01	41	-
50 ට වැඩි	01	-	02	01	-	02	-	-	01	-	16	-
මුළු එකතුව	**02**	**-**	**07**	**02**	**05**	**06**	**10**	**15**	**09**	**22**	**93**	**-**
ප්‍රතිශතය (%)	**100%**	**00 %**	**77.78%**	**22.22%**	**45.45%**	**54.55%**	**40 %**	**60 %**	**29.03%**	**70.97%**	**100%**	**00 %**

රැකියාවේ ස්වභාවය (GRI 102-8)

රැකියාවේ ස්වභාවය	2023			2022		
	පුරුෂ	ස්ත්‍රී	මුළු එකතුව	පුරුෂ	ස්ත්‍රී	මුළු එකතුව
ස්ථාවර කොන්ත්‍රාත්	01	-	01	-	01	01
ස්ථිර	115	28	143	126	32	158
පරිවාස	10	17	27	08	20	28
පුහුණු	06	13	19	00	10	10
මුළු එකතුව	**132**	**58**	**190**	**134**	**63**	**197**

පළාත් මට්ටමින් සේවක විස්තර (GRI 102-8)

පළාත	ශාඛා ගණන	2023			2022		
		පුරුෂ	ස්ත්‍රී	මුළු එකතුව	පුරුෂ	ස්ත්‍රී	මුළු එකතුව
දකුණ	03	33	07	40	34	08	42
බස්නාහිර	03	53	32	85	57	39	96
වයඹ	01	04	03	-	04	03	07
උතුර	03	14	-	14	15	-	15
නැගෙනහිර	03	22	03	25	24	03	27
මුළු එකතුව	13	126	45	164	134	53	187

සේවක හැකියාවන්

අධිකාරිය ඉදිරියට ගෙන යාම සඳහා ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීමට සහ කඩිසර ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා අපි අපගේ සේවකයින් සඳහා අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු. ඒ අනුව මුදල් වර්ෂය තුළ පහත පුහුණුවීම් ලබාදෙන ලදී.

විදේශීය පුහුණු 2023

අනු අංකය	නම	තනතුර	කාලසීමාව	වැඩසටහන/වැඩමුළුව	රට
01	ඒ. ජේ. එම්. ගුණසේකර මහතා	වැඩබලන සාමාන්‍යාධිකාරි	2023 ජූලි 04 සහ 05	The Benchmarking Site Visit in line with Transfer of Environmentally Sound Technologies (Test Biofouling) for Lead Partnering Countries	මුරුසිය
02	නීතිඥ අසේල බී. රැකව මහතා	සභාපති	2023 ජූලි 18 සහ 20	The Negotiations/Discussions on the X-Press Pearl Incident	මැලේසියා
03	නීතිඥ අසේල බී. රැකව මහතා	සභාපති	2023 සැප්තැම්බර් 18 සහ 22	Spill Response Workshop	ඇමෙරිකාව
	ටී. ජී. එයි. පී. අමරනායක මහතා	සහකාර කළමනාකරු (මෙහෙයුම්)			
04	එම්. ටී. කේ. දෙල්පච්චිත්‍ර මහතා	සමුද්‍ර පරිසර නිළධාරි	2023 ඔක්තෝම්බර් 16 සහ 20	Workshop on Enhancing Maritime Emergency Response Capabilities in the Indo-Pacific	නිව් කැලිඩෝනියාව
05	නීතිඥ අසේල බී. රැකව මහතා	සභාපති	2023 නොවැම්බර් 06 සහ 10	First Progress Meeting and training programme on"Satellite based oil spill monitoring service for Sri Lanka"	ප්‍රංශය
	ඒ. ජේ. එම්. ගුණසේකර මහතා	වැඩබලන සාමාන්‍යාධිකාරි			
	ආර්. එන්. ප්‍රියදර්ශන මහතා	සහකාර කළමනාකරු (නෞකා සමීක්ෂක)			
	ඩබ්. අයි. එච්. කේ. විජේරත්න මහතා	සමුද්‍ර පරිසර නිළධාරි			
	ඩබ්. ටී. ඩී. කේ. එම්. ඒ. ගුණතිලක මහතා	සහකාර සමුද්‍ර පරිසර නිළධාරි			
06	ඒ. ජේ. එම්. ගුණසේකර මහතා	වැඩබලන සාමාන්‍යාධිකාරි	2023 නොවැම්බර් 13 සහ 19	Third session of the Intergovernmental Negotiating Committee to Develop an International legally binding instrument on plastic	කෙන්නියාව



7. මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

7.1 නෞකා මගින් සිදු වන සමුද්‍ර දූෂණය පිටු දැකීමේ ක්‍රම වේදයන් වැඩි දියුණු කිරීම.

7.1.1 අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව -2023

ශ්‍රී ලංකාව නැව් මගින් සිදු වන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා වන අන්තර් ජාතික සම්මුතියට (MARPOL 73/78) පාර්ශව කරුවෙක් වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ වාණිජ වරායන් වෙත පැමිණෙන නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයිය යුතු වේ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත හා 2016 සමුද්‍ර පරිසර ආරක්ෂණ (නෞකා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ) නියෝගය යටතේ ශ්‍රී ලංකාවේ වරායන් වෙත පමිණෙන නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සලසනු ලබයි. එලෙස පැමිණෙන නෞකා සඳහා ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම අධිකාරියේ ලියාපදිංචි වූ සේවා සපයන ආයතන මගින් සිදු කරනු ලබයි. රෙගුලාසිය ප්‍රකාරව නියමිත ප්‍රමිතීන් තහවුරු කිරීමෙන් පසුව සේවා සපයන ආයතන 31ක් 2023 වසරේදී නෞකා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවා සැපයීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් ලියාපදිංචි කර ගන්නා ලදී.

2023 වර්ෂය සඳහා ලියාපදිංචි වූ සේවා සපයන ආයතන පිළිබඳ තොරතුරු

සියළුම වරායන් සඳහා දැවිතෙල්, ඝණ අපද්‍රව්‍ය සහ මළ අපද්‍රව්‍ය කාණ්ඩයන් යටතේ ලියාපදිංචි වූ සේවාසපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	ගැලැක්සි මැරීන් සර්විසස් (පුද්) සමාගම	✓	✓	✓	✓
2	මැරීනෝ ලංකා හෝල්ඩිංග්ස් (පුද්) සමාගම	✓	✓	✓	✓
3	නිව් කළම්බො හාබර් සප්ලයර්ස් (පුද්) සමාගම	✓	✓	✓	✓
4	සිලෝන් ලොජිස්ටික්ස් ඇන්ඩ් සප්ලයි සර්විසස් (පුද්) සමාගම	✓	✓	✓	✓
5	එන්. ජී. එන්. රංජිත් මැරීන් (පුද්) සමාගම	✓	✓	✓	✓
6	එන් ඇන්ඩ් වයි මැරීන් සර්විස් (පුද්) සමාගම	✓	✓	✓	✓
7	සුදේශ් එන්ටප්රයිසස් ඇන්ඩ් එක්ස්පෝර්ට් (පුද්) සමාගම	✓	✓	✓	✓
8	විස්මිත මැරීන් එන්ටප්‍රයිසස් (පුද්) සමාගම	✓	✓	✓	✓
9	ප්‍රබල ට්‍රේඩර්ස් (පුද්) සමාගම	✓	✓	✓	✓

දැවිතෙල් සහ ඝණ අපද්‍රවය කාණ්ඩයන් යටතේ ලියාපදිංචි වූ සේවාසපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	ශානිකා මැරීන් කම්පණි (පුද්) සමාගම	✓	✓	✓	✓
2	වයිට් ක්‍රිස්ටල් (පුද්) සමාගම	✓	X	X	✓
3	එච්. ටී. සේතු කාර්ගො ඇන්ඩ් ෂිපිං සර්විස් (පුද්) සමාගම	✓	✓	✓	✓
4	එස්. එච් විල්සන් (පුද්) සමාගම	✓	X	X	X
5	ජී. එම්. ලයින් (පුද්) සමාගම	✓	✓	X	✓
6	ඩී. එස්. මැරීන් (පුද්) සමාගම	✓	X	X	X
7	කේ. එල්. එස්. මැරීන් සර්විස් (පුද්) සමාගම	✓	X	X	X
8	සන්මාර්ක් ලංකා සොලූෂන්ස් (පුද්) සමාගම	✓	X	X	✓
9	ජයා මැරීන් සර්විසස් (පුද්) සමාගම	✓	X	X	✓
10	ඉන්සි ඉකොසර්කල් ලංකා (පුද්) සමාගම	✓	X	X	X
11	රනාරා (පුද්) සමාගම	✓	X	X	X

දැවිතෙල් කාණ්ඩය යටතේ ලියාපදිංචි වූ සේවා සපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	සුප්‍රීම් පෙට්‍රො ලංකා (පුද්) සමාගම	✓	✓	✓	✓

කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමල වරායන් සඳහා දැවිතෙල්, ඝණ අපද්‍රව්‍ය සහ මළ අපද්‍රව්‍ය කාණ්ඩයන් යටතේ ලියාපදිංචි වූ සේවා සපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	මල්ෂා ග්ලෝබ් ෂිපිං සර්විස් (පුද්) සමාගම	✓	✓	✓	X

සණ සහ මළ අපද්‍රව්‍ය කාණ්ඩයන් අපද්‍රව්‍ය කාණ්ඩයන් යටතේ ලියාපදිංචි වූ සේවාසපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	ක්ලීන්ටෙක් (පුද්) සමාගම	✓	X	X	X

කොළඹ වරාය සඳහා සණ අපද්‍රව්‍ය කාණ්ඩය යටතේ ලියාපදිංචි වූ සේවාසපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	සිසිල් හනාරෝ එන්කෙයර් (පුද්) සමාගම	✓	X	X	X
2	සුධා ෂිපින් සර්විසස් (පුද්) සමාගම	✓	X	X	X
3	නිරෝෂ් මැරීන් සර්විස් (පුද්) සමාගම	✓	X	X	X
4	ෂා. ආර්. ආර්. මැරීන් සර්විස් (පුද්) සමාගම	✓	X	X	X

ගාල්ල සහ හම්බන්තොට වරායන් සඳහා සණ අපද්‍රව්‍ය කාණ්ඩය යටතේ ලියාපදිංචි වූ සේවාසපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	කේ. එල්. ගුණසිරි ඇන්ඩ් සන්ස් (පුද්) සමාගම	X	✓	X	X
2	ලහිරු ට්‍රේඩර්ස් මැරීන් සර්විස් (පුද්) සමාගම	X	✓	X	X

ත්‍රිකුණාමලය වරාය සඳහා සණ අපද්‍රව්‍ය කාණ්ඩය යටතේ ලියාපදිංචි වූ සේවා සපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	ආශා මැරීන් ට්‍රින්කො (පුද්) සමාගම	X	X	✓	X

හම්බන්තොට වරාය සඳහා සණ අපද්‍රව්‍ය කාණ්ඩය යටතේ ලියාපදිංචි වූ සේවාසපයන ආයතන

	ආයතනයේ නම	කොළඹ	ගාල්ල	ත්‍රිකුණාමලය	හම්බන්තොට
1	නිර්මාන් ලංකා (පුද්) සමාගම	X	X	X	✓

නෞකා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවා බලපත්‍ර නිකුත් කිරීම

2023 වර්ෂයේදී අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවා ඉල්ලුම් කළ නෞකා සඳහා බලපත්‍ර 1705 ක් නිකුත් කරන ලදී. බලපත්‍ර වැඩිම ප්‍රමාණය කොළඹ වරායට පැමිණි නෞකා සඳහා නිකුත් කර ඇත. එම ප්‍රමාණය 1234 වන අතර ගාල්ල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය වරායන්ට පැමිණි නෞකා සඳහා පිළිවලින් 138, 126 හා 102 ක් බැගින් බලපත්‍ර නිකුත් කර ඇත. එසේම මුළු බලපත්‍ර සංඛ්‍යාවෙන් බලපත්‍ර 105ක් අවලංගු කර ඇත.

2023 වර්ෂයේ දී නිකුත් කරන ලද නෞකා බලපත්‍ර පිළිබඳ විස්තර

වරාය	නෞකා බලපත්‍ර ගණන
කොළඹ	1234
ගාල්ල	138
හම්බන්තොට	126
ත්‍රිකුණාමලය	102
මුළු බලපත්‍ර ගණන	1705

2023 වර්ෂයේ එක් එක් මාසයේ දී නිකුත් කරන ලද අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවා බලපත්‍ර ප්‍රමාණ





වාර්ෂික ආදායම

2023 වර්ෂයේ දී අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව මගින් රුපියල් මිලියන 26.242 ක ආදායමක් උපයා ඇත. ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

- වාර්ෂික ලියාපදිංචි ගාස්තු - රු. 3,682,500.00
- නෞකා සඳහා බලපත්‍ර නිකුත් කිරීම - රු. 8,525,000.00
- තෙල් අපද්‍රව්‍ය සඳහා ගාස්තු අය කිරීම - රු. 14,034,699.50
- 2023 වර්ෂයේ දී මුළු ආදායම - රු. 26,242,199.50

අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාවේ වාර්ෂික ආදායම 2023



අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳ තොරතුරු

තෙල් අපද්‍රව්‍ය -

- 2023 වර්ෂයේ දී නෞකා වලින් ඉවත් කරන ලද මුළු තෙල් අපද්‍රව්‍ය ප්‍රමාණය 26,401.8 m^3 කි.



ඝන අපද්‍රව්‍ය -

- 2023 වර්ෂයේදී නෞකාවලින් ඉවත් කරන ලද මුළු ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය 8,061.3 m^3 කි. මීට අමතරව මළ අපද්‍රව්‍ය 381 m^3 ප්‍රමාණයක් ද ඉවත් කරන ඇත. මේ පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.



2023 වර්ෂයේ දී නෞකා වලින් ඉවත් කරන ලද මුළු ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයන්

අපද්‍රව්‍ය වර්ගය	ප්‍රමාණය(m^3)
A. ප්ලාස්ටික්	2640.75
B. ආහාර අපද්‍රව්‍ය	545.5
C. ගෘහස්ථිත අපද්‍රව්‍ය	3113.5
D. පිසින තෙල්	74.54
E. දාහක අලු	167.1
F. මෙහෙයුම් අපද්‍රව්‍ය	1441.7
G. සත්ව මළ සිරුරු	53.6
H. ධීවර ආම්පන්න	7.1
I. විද්‍යුත් අපද්‍රව්‍ය	77.26
J. නැව් භාණ්ඩ අවශේෂ (අන්තරාකාරී නොවන අපද්‍රව්‍ය)	7.93
K. නැව් භාණ්ඩ අවශේෂ (අන්තරාකාරී අපද්‍රව්‍ය)	0

නෞකා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවා බලපත්‍ර නිකුත් කිරීම 2016-2023



7.1.2 බංකරින් බලපත්‍ර - 2023

නෞකාවක දෛනික මෙහෙයුම් සිදුකිරීමේ දී එන්ජින් හා අනෙකුත් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ඉන්ධන සැපයීම බංකර් යනුවෙන් හඳුන්වනු අතර එම ක්‍රියාදාමයේ දී තෙල් විසිරීම, ගිනි ගැනීම් වැනි අනතුරු සිදුවීමේ අවදානමක් පවතින බැවින් බංකර් සැපයීමේ ක්‍රියාවලිය ඉතා සැලකිලිමත්ව හා ආරක්ෂාකාරීව සිදු කළ යුතු වේ. 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත සහ බංකරින් (සමුද්‍ර පරිසර ආරක්ෂණ) 2011 අංක 02 නියෝගයට අනුකූලව නියමිත ප්‍රමිතීන් තහවුරු කිරීමෙන් පසුව බංකර් යාත්‍රා සඳහා වාර්ෂික බංකර් සහතිකය නිකුත් කරනු ලබයි.

2023 වර්ෂයේදී නෞකා සඳහා බංකර් බලපත්‍ර 15ක් නිකුත් කර ඇත. එමගින් සමස්ත රු.මි. 2.2 ක ආදායමක් ලබා ඇත. ඊට අමතරව ත්‍රිකුණාමලය තෙල් ගබඩා සංකීර්ණට සහ බව්සර් රථ මගින් තෙල් සපයන ආයතන දෙකකට වාර්ෂික බලපත්‍ර ලබා දී ඇත. ඒ අනුව 2023 වර්ශයේදී බංකර් සේවාවට බලපත්‍ර ලබාදීම මගින් මිලියන 2.34 ආදායමක් උපයන ලදී. එම 2023 වසර සඳහා බංකර් බලපත්‍ර පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

අනු අංකය	ලියාපදිංචි අංකය	ආයතනයේ නම	නැවේ නම
A	නැව් සඳහා බංකරින් බලපත්‍ර නිකුත් කිරීම		
1	2023/BUN/01	ලංකා මැරීන් සර්විසස් (පුද්) සමාගම	Lanka Marine Mahawali
2	2023/BUN/02	ලංකා මැරිටයිම් සර්විසස් (පුද්) සමාගම	MT Laxapana
3	2023/BUN/03	ලංකා මැරිටයිම් සර්විසස් (පුද්) සමාගම	MT Kumana
4	2023/BUN/04	ලංකා මැරීන් සර්විසස් (පුද්) සමාගම	Lanka Marine Nilwala
5	2023/BUN/05	සිනොපෙක් ෆියුල් ඔයිල් (පුද්) සමාගම	He Ping Zhe Lu
6	2023/BUN/06	ස්පෙන්ස් සී හෝර්ස් මරයින් (පුද්) සමාගම	He Ping Zhe Lu
7	2023/BUN/09	ලංකා අයි. ඕ. සී. පි එල් සි	MT Kandy
8	2023/BUN/10	ශානිකා මැරීන් සර්විසස් (පුද්) සමාගම	MT Lanka Freedom
9	2023/BUN/11	ඉන්ටර්ඕෂන් එනර්ජි (පුද්) සමාගම	MT Ocean Lanka
10	2023/BUN/12	ඉන්ටර්ඕෂන් එනර්ජි (පුද්) සමාගම	MT Ocean Lanka
11	2023/BUN/13	ලංකා අයි. ඕ. සී. පි එල් සි	MT Yala
12	2023/BUN/15	ලංකා අයි. ඕ. සී. පි එල් සි	Ceylon Star
13	2023/BUN/17	ස්පෙන්ස් සී හෝර්ස් මරයින් (පුද්) සමාගම	MT Yala
14	2023/BUN/18	මොසිටි ඉන්ටනැෂනල් (පුද්) සමාගම	MT Global Dominance
15	2023/BUN/19	සර්ඩාකා ග්ලොබල් (පුද්) සමාගම	MT Kumana
B.	තෙල් ගබඩා සංකීර්ණ සඳහා බලපත්‍ර		
1	2023/BUN/TF-01	ලංකා අයි. ඕ. සී. පි එල් සි	ත්‍රිකුණාමලය
C.	බව්සර් රථ සඳහා බලපත්‍ර ලබාදීම		
1	2023/RT/01	ජයසුන්දර මෝටර්ස්	
2	2023/RT/04	ඒස් ඩිස්ට්‍රිපාර්ක් (පුද්) සමාගම	
3	2023/RT/05	ඒස් ඩිස්ට්‍රිපාර්ක් (පුද්) සමාගම	

7.2 සාගර ඔත් ජීවීන් (Biofouling) කළමනාකරණය

ශ්‍රී ලංකාව අන්තර් ආතික සමුද්‍රීය සංවිධානයේ GloFouling Partnership ව්‍යාපෘතියේ දකුණු ආසියානු කලාපය නියෝජනය කරන ප්‍රධාන පාර්ශවකාර රටකි (Lead Partner Country). ඒ අනුව සමුද්‍ර ඔත් ජීවීන් කළමනාකරණය වෙනුවෙන් පියවර කිහිපයක් 2023 වර්ෂයේද සනිටුහන් කරන ලදී.

<u>සාගර ඔත් ජීවීන් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව 2023.02.22 සහ 2023.02.23</u>

සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් සමුද්‍ර ඔත් ජීවීන් (Biofouling) හැඳින්වීම, එහි බලපෑම සහ අවදානම් කළමනාකරණය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් අදාළ පාර්ශවකරුවන්ගේ නියෝජිතායතන සඳහා සංවිධානය කරන ලදී. මේ සඳහා දායකත්වය ලබාදෙනු ලබන්නේ GEF-UNDP-IMO GloFouling හවුල්කාරීත්ව වැඩසටහන මගිනි.

දැනුවත් කිරීමේ වැඩසටහන මගින් දැවෙන පාරිසරික ගැටළු ආමන්ත්‍රණය කිරීම අරමුණු කරගත් තීරණාත්මක විෂයයන් ආවරණය කරන ලදී. ප්‍රථමයෙන්, සාගර ඔත් ජීවීන් හා ආක්‍රමණශීලී විශේෂවල ගෝලීය අභියෝගය, සාගර ඔත් ජීවීන් හඳුන්වාදීම, එය සිදුවීමට බලපාන විවිධ සාධක සහ එය අවම කිරීම හා සම්බන්ධ පාරිසරික සහ-ප්‍රතිලාභ වැනි මාතෘකා ආවරණය කරන ලදී. එසේම ගාර්ඩන් අයිලන්ඩ්ස් හි තක්සේරු නඩුවක් ගැටලුවේ බරපතලකම පිළිබඳ ප්‍රායෝගික අවබෝධයක් ලබා දුන්නේය.

දෙවනුව සාගර ඔත් ජීවීන් එරෙහිව සටන් කිරීමේ උපාය මාර්ග ගැඹුරින් ගවේෂණය කරන ලද අතර, හල් ආලේපන සහ නිතිපතා නඩත්තු කිරීම, පිරිසිදු කිරීම සහ අපිරිසිදු කිරීමේ ප්‍රතිකාර වැනි ප්‍රතික්‍රියාශීලී ක්‍රියාමාර්ග සහ ධාවීන්ගේ ප්‍රතිකර්ම වැනි ප්‍රතිකර්ම වැනි දේ පිළිබඳ

සාකච්ඡා කරන ලදී. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (International Maritime Organization) මාර්ගෝපදේශ පිළිපැදීමේ වැදගත්කම සහ ඔත් ජීවින් මගින් ඇතිවන අභියෝගයන්ට මුහුණ දීමේදී ජාතික නීති සහ අවශ්‍යතාවලට අනුකූල වීම පිළිබඳ වැදගත්කම පිළිබඳව ද මෙම වැඩසටහන මඟින් ආවරණය කරන ලදී.

CINEC Campus (Pvt) Ltd., Juliston Lanka International (Pvt) Ltd, UNK Global Maritime Institute" සහ අනෙකුත් අදාළ ආයතනවල ඉහල සහභාගීත්වයක් සිදුවූ අතර ඔවුන්ගේ මැදිහත්වීම මගින් ඔත් ජීවින් සහ ආක්‍රමණශීලී විශේෂවල අහිතකර බලපෑම් අවම කිරීමත්, පර්යේෂණ ආයතන, සමුද්‍රීය සේවා සපයන්නන් සහ රාජ්‍ය ආයතන අතර සහයෝගී දායකත්වයක් ලබාදීමටත් මෙහෙදී උත්සහ කරන ලදී.

සමුද්‍ර ඔත් ජීවීන් කළමනාකරණ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

ශ්‍රී ලංකාව GEF-UNDP-IMO GloFouling හවුල්කාරීත්ව වැඩසටහනේ ප්‍රධාන පාර්ශවකාර රටක් වශයෙන් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කරන ලදී. මෙම ජාතික මෙහෙයුම් කමිටුව නාවික ක්ෂේත්‍රය, ධීවර ක්ෂේත්‍රය, වෙරළාශ්‍රිත ජලජීවී වගා ක්ෂේත්‍රය හා සංචාරක බෝට්ටු ඇතුළුව සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත පාර්ශවකාර ආයතනයන්හි නියෝජිතයන්ගෙන් සැදුම් ලද්දකි. එමෙන්ම සමුද්‍ර ඔත් ජීවීන් පිළිබඳ ජාතික තත්ත්ව වාර්තාව (National Status Report) සකසන ලද අතර ඔත් ජීවීන් කළමනාකරය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම සෑදීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

7.3 වඩා කාර්යක්ෂම හා ඵලදායි ජාතික තෙල් හා රසායන ද්‍රව්‍ය විසිරීම් වලට ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් ක්‍රියාවට නැංවීම.

7.3.1. හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම යාවත්කාලීන කිරීමේ වැඩමුළු හා විද්වත් සාකච්ඡා

1. ජාතික තෙල් විසිර යාමේ හදිසි සැලැස්ම යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව.

2008 අංක 35 දරණ සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනත යටතේ ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් අතර සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැළැස්ම හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකා ජල තීරයේ සිදුවිය හැකි හදිසි තෙල් විසිරීම් හෝ එවැනි අවදානම් තත්වයක් ඇති වුවහොත් එම තත්වයන් වළක්වා ගැනීම හා අවම කිරීම වෙනුවෙන් පූර්ව සංවිධාන ව්‍යුහයකින් යුක්තව මෙම සැළැස්ම ක්‍රියාත්මක කරනු ලබයි. මේ සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත්ව පාර්ශ්වකාර ආයතන 17ක් එක්ව මෙම "හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැළැස්ම" ක්‍රියාත්මක කරනු ලබයි.

මේ අනුව පසුගිය කාලය තුළ හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැළැස්මේ හඳුනාගත් අඩුපාඩු සහ නෞකා අනතුරු හේතුවෙන් උගත් පාඩම් අනුව නැවත වතාවක් නව තත්වයන්ට අනුකූල වන ආකාරයට මෙම හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැළැස්ම සංශෝධනය කළ යුතුව ඇති හෙයින්, එය යාවත්කාලීන කිරීමේ වැඩමුළුවක් සහ විද්වත් සාකච්ඡාවක් 2023 අගෝස්තු මස 22 හා 23 දිනයන්හිදී ලෝක ආහාර සංවිධානයේ දායකත්වයෙන් කිංග්ස්බරි හෝටලයේදී පැවැත්වීය.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ඇතුළු පාර්ශ්වකාර ආයතන 17 සහ ඉදිරියේදී මෙම සැළැස්මට එක්වීමට නියමිත ආයතනද ඇතුළුව මේ දක්වා ලබා තිබෙන අත්දැකීම් හා අඩුපාඩු හඳුනාගනිමින් වර්තමානයේ මෙන්ම අනාගතයේදිද සිදුවිය හැකි හදිසි තත්වයන්ට ගැලපෙන ආකාරයට ක්ෂණිකව ක්‍රියාත්මක කිරීම සඳහා වූ වැඩපිළිවෙලක් සැකසීම මගින් තෙල් විසිරීමක් හෝ රසායනික ද්‍රව්‍යය විසිරීමක් වැනි අවස්ථාවකදී ඒ සඳහා සාර්ථකව මුහුණ දීමේ හැකියාව ඇති කිරීම මෙහි මූලික අරමුණ විය.

2. යුරෝපීය සංගමයේ සිවිල් ආරක්ෂණ යාන්ත්‍රණය මඟින් ශ්‍රී ලංකාවේ හදිසි සමුද්‍රීය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා වූ උපදේශන මෙහෙයුම

සමුද්‍රිය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීමේ අරමුණින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි ආරාධනයෙන් යුරෝපා සංගමයේ 9 දෙනෙකුගෙන් යුත් විශේෂඥ කණ්ඩායමක් 2023 සැප්තැම්බර් 04 සිට 15 දින දක්වා ශ්‍රී ලංකාවේ දින 11ක කාලයක් ගත කරමින් සමුද්‍රිය ආපදාවකදී ශ්‍රී ලංකාව මේ වන විට ප්‍රතිචාර දක්වන ක්‍රමවේදය පිළිබඳව අධ්‍යනයක් සිදුකරන ලදී.

ඒ අනුව එහි පළමු පියවර ලෙස සමුද්‍රීය ආපදාවකදී ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම කෙසේ විය යුතුද යන්න පිළිබඳව විශේෂඥ උපදෙස් ලබාදීම සිදුකළේය.

මෙහිදී සිද්ධි කළමණාකරණ කණ්ඩායමට (Incident Management Team (IMT)) අදාල පාර්ශ්වකාර ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම හා එම අධ්‍යයන කටයුතු සිදුකිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීය.

ඒ අනුව මෙම ක්‍රියාවලියට අදාල රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා පැවැත්වූ අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය, ගාල්ල වරාය පරිශ්‍රය, හම්බන්තොට වරාය ආදී ස්ථානයන් වෙත අධීක්ෂණ ක්ෂේත්‍ර චාරිකා සිදුකළ අතර එහිදී එහි කළමණාකාරීත්වය සමඟ සාකච්ඡා පැවැත්වීය.

එසේම මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය අංශයේ අදාල පාර්ශ්වකාර ආයතන සමඟ විශේෂ සාකච්ඡා කිහිපයක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි. මෙහිදී මෙම සාකච්ඡා මෙහෙයුම්, පාරිසරික හානි තක්සේරුකරණය හා නීති යන ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් ඔස්සේ සාකච්ඡා මෙහෙයවන ලදී.

3. සමුද්‍රීය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා එක්සත් රාජධානියේ Ocean Country Partnershμp Program (OCPP) වැඩසටහන

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, එක්සත් රාජධානියේ Ocean Country Partnership Program (OCPP) වැඩසටහන හා එක්ව සමුද්‍රීය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි ආරාධනයෙන් සාගර විෂය ක්ෂේත්‍රයට අදාල විද්වතුන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්හි ආයතන ප්‍රධානීන් ඇතුළු අදාල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023 නොවැම්බර් 27, 28, 29 සහ 30 දිනයන්හිදී සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී මේ සම්බන්ධ වැඩමුළුවක් පැවැත්වීය.

4. හදිසි සමුද්‍රිය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි නිලධාරීන්ගේ ධාරිතාවය ගොඩනැංවීමේ වැඩමුළුව

හදිසි සමුද්‍රිය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය යාවත්කාලීන කිරීමේ පියවර යටතේ විශේෂ තෙදින වැඩමුළුවක් 2023 දෙසැම්බර් 07, 08 හා 09 යන තෙදිනයන්හිදී වැල්ලවත්ත මිරාජ් හෝටලයේදී සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලදී. ලෝක ආහාර වැඩසටහනේ අවදානම් කළමණාකරණ අංශය මගින් මේ සදහා මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරින්, ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් ඇතුළු හදිසි සමුද්‍රීය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියාත්මක වන සියළු අංශයන් (තාක්ෂණික, පරිපාලන, මුදල්) නියෝජනය කරමින් නිලධාරීන් මේ සඳහා සහභාගී වූ අතර, එහිදී හදිසි සමුද්‍රිය ආපදාවකදී ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් පවතින ක්‍රමවේදයන්, සැළසුම් හා අදාල පහසුකම් පිළිබඳව සාකච්ඡාවට ලක්විය.

7.3.2. MT New Diamond නෞකා අනතුර

MT New Diamond නෞකාව 2020 සැප්තැම්බර් 3 වන දින, පෙ.ව. 9.30 ට පමණ, ශ්‍රී ලංකාවේ සංගමන් කන්ද ලක්ෂ්‍යයේ සිට නාවික සැතපුම් 38 ක් පමණ නැගෙනහිර දෙසින් තිබියදී, එහි එන්ජින් කාමරයේ ගින්නක් ඇති විය. ඒ වන විට නෞකාව කුවේට් සිට ඉන්දියාවේ පැරදීප් පිරිපහදුව දක්වා බොරතෙල් මෙට්‍රික් ටොන් 270,000ක් රැගෙන යමින් තිබුණි. නෞකාවේ බංකර් තෙල් මෙට්‍රික් ටොන් 1,700ක් ද තිබූ අතර එහි කාර්ය මණ්ඩලය 24 දෙනෙකුගෙන් සමන්විත විය.

නෞකාවෙන් සිදුවූ තෙල් කාන්දුව සහ ඉන් පසුව ඇති වූ ගින්න, ජෛව විද්‍යාත්මකව සංවේදී ජල ප්‍රදේශයක සිදු විය. දින තුනක තෙල් කාන්දුව සහ නෞකාවේ ගිනි ගැනීම හේතුවෙන් උග්‍ර වූ ගින්න මගින් කෙටි හා මධ්‍ය කාලීන මෙන්ම දීර්ඝ කාලීන වශයෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජ-ආර්ථික බලපෑම් ඇතිකර තිබුණි.

මෙම නෞකා අනතුරට අදාල පාරිසරික හානි තක්සේරු වාර්තාවේ යාවත්කාලීන කරන ලද වාර්තාව විශේෂඥ විද්වත් කමිටුව මඟින් සකසා 2023 ජුලි 23 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාරදුන් අතර ඒ හා සබැඳි නෛතික කරීකාවත් මේ වන විට සිදුවෙමින් පවතී.

7.3.3 MV X-Press Pearl නෞකා අනතුර

MV X-Press Pearl නෞකාව කොළඹ ප්‍රදීපාගාරයේ සිට නාවික සැතපුම් 9ක් දුරින් නැංගුරම්ලා තිබියදී එහි සිදුවූ නයිට්‍රික් අම්ල කාන්දුවක් හේතුවෙන් ගිනිගැනීමට හා පිපිරීම් මාලාවකට ලක්ව මුහුදුබත් විය. ඒ සමගම නෞකාවේ වූ රසායනික ද්‍රව්‍යය, ඉන්ධන, ප්ලාස්ටික් පබළු සහ අනෙකුත් නෞකාවේ අපද්‍රව්‍යය සාගරයට එක්වී අනතුරුව ශ්‍රී ලංකාවේ මන්නාරම සිට හම්බන්තොට දක්වා වෙරළ තීරයන් දූෂණයට ලක්විය.

වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම්

නෞකා අනතුර හේතුවෙන් පාරිසරික හානියට පත් වෙරළ කලාපයන් පිරිසිදු කිරීමේ කටයුතු 2023 වර්ෂයේදීත් ක්‍රියාත්මක කළ අතර, එහිදී 2023 වර්ෂය සඳහා වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම් කටයුතු වලට අදාල සංක්ෂිප්ත වාර්තාව පහත පරිදි වේ.

<u>**2023.01.02 සිට 2023.12.30 දක්වා වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු වල සාරාංශය**</u>

පිරිසිදු කිරීම් කරනු ලැබූ මුළු වෙරළ කළාපයන් ගණන	- 2,256
මිනිස් බලය	- 44,343
එකතු කරන ලද මුළු මළු ප්‍රමාණය	- 5,488
එකතු කරන ලද මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය (ආසන්නව)	- 137Mt
පිරිසිදු කළ වෙරළ කළාපයන්හි දිග ප්‍රමාණය	- 89 Km

අපද්‍රව්‍ය කළමනාකරණය

නෞකා අනතුර හේතුවෙන් එකතු වූ අපද්‍රව්‍යය, පමුණුගම ප්‍රදේශයේ පිහිටි අපද්‍රව්‍යය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයේ ගබඩා කර ඇත. මෙම අපද්‍රව්‍යය ගබඩා සංකීර්ණය සඳහා පාරිසරික නීතියට අනුව 2023 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය සහ උපලේඛණගත අපද්‍රව්‍යය කළමණාකරණ බලපත්‍රය ලබාගෙන ඇති අතර එයට අදාල සම්මත ක්‍රමයන්ට අනුකූලව මෙම ගබඩා සංකීර්ණය පවත්වාගෙන යනු ලබයි.

MV X-PRESS PEARL නෞකාව කපා ඉවත් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම

MV X-PRESS PEARL නෞකාව කපා ඉවත් කිරීමේ කටයුතු චීනයේ Shanghai Salvage ආයතනය මගින් සිදු කරන ලද අතර 2023 වර්ෂයේ ජනවාරි මස අග වන විට සියලුම කොටස් කපා අවසන් කරන ලදී. සමුද්‍රීය පරිසරයට විය හැකි හානි අවම කර ගනිමින් මෙම කටයුතු සිදු කරන ලද අතර මෙම නෞකාව ඉවත් කිරීමේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය නිරන්තරයෙන් අධීක්ෂණය කරන ලදී. මේ සඳහා අධිකාරියේ සභාපතිනී දර්ශනී ලහඳපුර මහත්මිය, අධිකාරියේ නිලධාරීන් , නෞකාව කපා ඉවත් කිරීමේ මෙහෙයුම් සිදු කරන චීන ජාතික Shanghai Salvage ආයතනයේ මෙහෙයුම් භාර නිලධාරීන්ද, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර මහතා ඇතුළු අධිකාරියේ නිලධාරීන්, සහභාගී විය.

- 2023 ජනවාරි මස 30 වන දින වන විට MV X-PRESS PEARL නෞකාව කපා ඉවත් කරමින් එම කොටස් අදාළ සමාගම් විසින් රැගෙන යාමට සූදානම් කර තිබූ අතර සියලුම කටයුතු සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ උපදෙස් මත හා නියාමනය යටතේ සිදු කරන ලදී.
- මෙම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අධිකාරියේ සභාපතිනී දර්ශනී ලහඳපුර මහත්මිය ඇතුළු අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් එක් විය. තවද මේ අවස්ථාවට හාබර් මාස්ටර් නිර්මාල් ද සිල්වා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර යන මහත්වරුන් සහභාගී විය.
- 2023 වසර අවසන් වන විට නෞකාවේ පසු පස කොටස් 2 ක් කපා ඉවත් කර තිබුණි.

MV X-PRESS PEARL නෞකා අනතුරට අදාලව 2023 වසරේ දී සිදු කල විශේෂ කටයුතු පහත පරිදි දැක්විය හැක.

1. MV X-PRESS PEARL නෞකා අනතුරින් දැඩි ලෙස හානියට පත් වූ මීගමුව වෙරළ කළාපයේ සිදු කරනු ලබන වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු නිරීක්ෂණය

- MV X-PRESS PEARL නෞකා අනතුරින් දැඩි ලෙස හානියට පත් වූ මීගමුව වෙරළ කළාපයේ සිදු කරනු ලබන වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා ජනවාරි මස 31 වන දින සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිතුමිය, අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්, අධිකාරියේ සාමාන්‍යාධිකාරිතුමන් ඇතුළු නිළධාරීන් සහභාගී විය.

2. X-PRESS PEARL නෞකාව මඟින් සිදු වූ පාරිසරික හානියට අදාල වන්දි ලබා ගැනීමේදී සිදු වූවා යැයි කියන මූල්‍ය වංචාවක් සම්බන්ධ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිනිල්ලක් යොමු කිරීම.

- 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මුහුදු තීරය තුළදී මුහුදුබත් වූ X-PRESS PEARL නෞකාව මඟින් සිදු වූ පාරිසරික හානියට අදාල වන්දි ලබා ගැනීමේදී සිදු වූවා යැයි කියන මූල්‍ය වංචාවක් සම්බන්ධව විවිධ පාර්ශවයන් විසින් ජනමාධ්‍ය තුළ පළ කරන ලද තොරතුරු පිළිබඳව විමර්ෂණයක් සිදු කරන ලෙසට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිනිල්ලක් යොමු කරන ලදී. (2023.04.18)
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙනුවෙන් එහි සභාපති නීතිඥ අසේල බී රැකව මහතා සහ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර මහතා විසින් අදාල පැමිනිල්ල යොමු කරන ලදී.

3. MV X-Press Pearl නෞකා අනතුර හේතුවෙන් සිදු වූ පාරිසරික හානිය පිළිබඳව සහ වෙරළ පවිත්‍රතා කටයුතු වල වර්තමාන තත්වය පිළිබඳව රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් දැනුවත් කිරීම.

- MV X-Press Pearl නෞකා අනතුර හේතුවෙන් සිදු වූ පාරිසරික හානිය පිළිබඳව සහ මේ වන විට සිදු කරමින් පවතින වෙරළ පවිත්‍රතා කටයුතු වල වර්තමාන තත්වය පිළිබඳව රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් දැනුවත් කිරීම සඳහා අදාල විදේශීය නියෝජිතයන් සහ ආයතන දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ දී 2023.04.25 වන දින පවත්වන ලදී. මෙම වැඩසටහන විදේශ කටයුතු අමාත්‍යාංශය සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය එක්ව පවත්වන ලද අතර මේ සඳහා අදාල විදේශීය නියෝජිතයින් අතුළුව අධිකාරියේ සභාපති නීතීඥ අසේල බී. රැකව, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජෙනරාල් ආර්. හසන්, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී ජගත් ගුනසේකර, අධිකාරියේ හිටපු සාමාන්‍යාධිකාරී මහාචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර යන මහත්වරුන් සහභාගී විය.

4. MV X-Press Pearl නෞකා අනතුර සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම

- සාගරයම හැඬූ වූ MV X-Press Pearl යන මැයෙන් පෙබරවාරි මස 1 වනදා City News පුවත්පතෙහි, පුවත්පත් දැන්වීමක් පළ කොට ඇත.
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති නීතිඥ අසේල බී රැකව MV X-Press Pearl නෞකාවට අදාල නඩු කටයුතු පිළිබඳව 2023.04.27 වන දින "1 O 1 katha" යූ ටියුබ් නාලිකාව සමග සාකච්ඡාවක් පවත්වන ලදී.
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති , නීතිඥ අසේල බී රැකව මහතා 2023.05.22 දින සාභාගි වූ "සුභාරතී" සජීවී වැඩසටහනේදී එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සැඟවුනු කතාව නමින් ඉදිරිපත් කරන ලද සාකච්ඡාවේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය MV X-Press Pearl නෞකා අනතුර අවස්තාවේදී ක්‍රියා කළ ආකාරයත් සිදු වූ අනතුරෙහි විශාලත්වය අවම කර ගැනීමට නොහැකි වීමට හේතු සහ නැවත සිදු වියහැකි එවැනි නෞකා අනතුරකදී ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට ආයතනයක් වශයෙන් ශක්තිමත් කිරීමට මේ වන විට ගෙන යන වැඩපිළිවෙළ පිළිබඳවද දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.

5. MV X-Press Pearl නෞකාවෙන් අලුත් තෙල් විසිරීමක් හෝ රසායනික ද්‍රව්‍ය විසිරීමක් 29.05.2023 වන විට වාර්තා වී නොමැති බවට නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනය

- නෞකාවෙන් නැවතත් තෙල් කාන්දු වීමක් සිදුවන බවට ධීවර ජනතාව අප ආයතනයට කළ දැනුම් දීමකට අනුව, MV X-Press Pearl නෞකාව මුහුදුබත් වූ ස්ථානය සහ අවට ප්‍රදේශය නිරීක්ෂණය කිරීම හා පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය නියැදි ලබාගැනීම 2023.05.28, 2023.05.29 යන දින වලදී සිදු කරන ලද අතර, අවශ්‍යතාව මත නෞකාව මුහුදුබත් වූ ස්ථානය හා අවට ප්‍රදේශය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කිමිදුම් කණ්ඩායම් හා ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශේෂ කිමිදුම් කණ්ඩායම් යොදවමින් විශේෂ නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. අදාල නිරීක්ෂණ වලින් තහවුරු වී ඇත්තේ එවැනි තෙල් කාන්දු වීමක් MV X-Press Pearl නෞකාවෙන් සිදු වීනොමැති බවයි. ඒ අනුව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් MV X-Press Pearl නෞකාවෙන් අලුත් තෙල් විසිරීමක් හෝ රසායනික ද්‍රව්‍ය විසිරීමක් මේ වන විට වාර්තා වී නොමැති බවට නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයක් 29.05.2023 වන දින ඉදිරිපත් කොට ඇත.

6. 2023.06.28 වන දින මීගමුව වෙරළ කලාපයට ගසාගෙන ආ තෙල්, තාර වැනි ඝන ද්‍රව්‍ය ඉවත් කිරීම හා ඉදිරි කටයුතු සිදුකිරීම.

- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් මීගමුව වෙරළ කලාපය ආශ්‍රිත ප්‍රදේශයේ දිනපතා සිදු කරනු ලබන නිරීක්ෂණ කටයුතුවලදී 2023.06.28 දින උදෑසන කලු පැහැති තෙල්, තාර වැනි යම් ඝන ද්‍රව්‍යයක් MV X-Press Pearl නෞකාවෙන් ගිලිහු අපද්‍රව්‍ය පිරිසිදු කිරීම් කටයුතු සිදු කරන සරක්කුව වෙරළට ගසා ගෙන එන බව නිරීක්ෂණය විය. තවදුරටත් මෙම නිරීක්ෂණ කටයුතු සිදු කිරීමේදී මෙම තෙල් තාර වැනි ඝන ද්‍රව්‍ය සරක්කුව වෙරළ තීරයේ සිට මීගමුව වෙරළ තීරය දක්වා විහිදී ඇති බවත් සරක්කුව සිට දුන්ගල්පිටිය දක්වා වෙරළ තීරය අතර ප්‍රදේශයේ වැඩි වශයෙන් මෙම ද්‍රව්‍ය දක්නට ලැබෙන බවත් නිරීක්ෂණය විය.
- මෙහිදී ක්‍රියාත්මක වූ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මෙම ද්‍රව්‍ය වෙරළ තීරයෙන් ඉවත් කිරීමටත් එම තෙල්, තාර වැනි ඝන ද්‍රව්‍ය කුමක්ද යන්න හඳුනා ගැනීම සඳහා අදාල සාම්පල විද්‍යාගාර වෙත යොමු කිරීමටත් කටයුතු කළ අතර සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ උපදෙස් මත ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහාය ඇතිව අදාල සාගර කලාපය නිරීක්ෂණය කිරීමටත් පියවර ගන්නා ලදී.
- ඒ අනුව MV X-Press Pearl නෞකා අනතුර හේතුවෙන් වෙරළ පවිත්‍රතා කටයුතු සිදුකරනු ලබන ධීවර ප්‍රජාවගේ සහාය ඇතිව(170 ක් පමණ පිරිසකගේ) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියලු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම උපයෝගී කරගනිමින් මෙම වෙරළ පවිත්‍රතා කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.
- එසේම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග ත්‍රිවිධ හමුදාව ඇතුළු ආයතන 16 කින් සමන්විත හදිසි අවස්ථා කළමනාකරණ කමිටුව මෙම සිදුවීම සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කර ගනිමින්, හා අදාල කලාපයන් නිරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී.
- 2023.06.30 දින MV X-Press Pearl නෞකා සිද්ධියට අදාළ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පත්කරන ලද විශේෂඥ කමිටුවට අවශ්‍ය විශේෂ සාම්පල ලබාගැනීම MV X-Press Pearl නෞකාවෙන් ගසාගෙන ආ අපද්‍රව්‍ය වලින් වැඩියෙන්ම හානි වූ සරක්කුව වෙරළ ආශ්‍රිත ප්‍රදේශයේ දී සිදු කරන ලදී.
- මෙහිදී MV X-Press Pearl නෞකාවෙන් ගසාගෙන ආ ප්ලාස්ටික් පෙලට්ස් පිළිබඳ සහ 2023.06.28 දින මීගමුව වෙරළ කලාපය ට ගසාගන ආ තෙල් තාර වැනි ඝන ද්‍රව්‍ය පිලිබදව විශේෂ අවදානය යොමුකරමින් මෙම කටයුතු සිදු කල අතර මේවා පිලිබදව තවදුරටත් රසායනගාර වාර්තා ලබා ගැනීම සඳහා මෙම ද්‍රව්‍යයට අදාළ සාම්පල ප්‍රංශයේ විද්‍යාගාරයක් වෙතට ද යොමු කිරීමට සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය කටයුතු කර තිබේ

- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය නාරා ආයතනයේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහය ඇතිව මුහුදුබත් වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ආසන්නයේ මුහුදු ජලයේ තත්ත්වය පරීක්ෂා කිරීමේ අවස්ථාව-15.07.2023

- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් විසින් මීගමු වෙරළ කලාපයේ වෙරළ තීරයන් නිරීක්ෂණය කරමින්.-2023.07.20

- 2023/07/22 දින සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් මීගමු වෙරළ කලාපයේ වෙරළ තීරයන් නිරීක්ෂණය සිදු කරන ලදී.

7. ශ්‍රී ලංකා දූත පිරිස සහ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ හිමිකාර රක්ෂණකරුවන් අතර සිදු කළ සාකච්ඡාව

- නීතිපතිවරයා ප්‍රමුඛ නව දෙනෙකුගෙන් යුත් ශ්‍රී ලංකා දූත පිරිස සහ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ හිමිකරුගේ රක්ෂණකරුවන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන් අතර සාර්ථක සාකච්ඡා වටයක් පසුගිය ජූලි 18 සහ 19 යන දෙදින සිංගප්පූරුවේ දී පැවැත්විණි.
- කොළඹ වරාය ආසන්නයේ දී ගිනි ගෙන මුහුදු බත් වූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවෙන් සිදු වූ හානිය සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීමට පසුගිය අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා රජය සිංගප්පූරුවේ දී ගොනු කළ නඩුවෙන් අනතුරුව තම සේවාදායකයා වෙනුවෙන් නීතිඥවරුන් විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර ලෙස මෙම සාකච්ඡාව කැඳවා තිබිණි. අදාළ සිදුවීම හා එහි ප්‍රතිවිපාකවල තීරණාත්මක පැතිකඩ පිළිබඳව මෙහිදී දෙපාර්ශවයේම අවධානය යොමු විය.
- ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සහ ධීවර අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අන්තර්කාලීන හිමිකම් තක්සේරුව පිළිබඳව ද මෙහිදී විශේෂ අවධානයට ලක් වූ අතර මෙම හිමිකම් තක්සේරුව කඩිනමින් සිදු කරන බවට නෞකාවේ හිමිකරුගේ රක්ෂණකරුවන් ශ්‍රී ලංකා රජයට සහතික විය.
- ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ සිදු කෙරෙන සුන්බුන් ඉවත් කිරීමේ සහ සුන්බුන් ප්‍රතිසාධන කටයුතු අවසන් කිරීමේ කඩිනම් අවශ්‍යතාව ද නීතිපති සංජය රාජරත්නම් මහතා මෙහිදී අවධාරණය කළ අතර ඒ පිළිබඳව ද අනෙක් පාර්ශ්වය වෙතින් ධනාත්මක ප්‍රතිචාරයක් පළ කෙරිණි.
- එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර හේතුවෙන් ශ්‍රී ලංකා සාගර පරිසරයට සිදුවූ හානියට වන්දි ලබා ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා රජය කර ඇති ඉල්ලීමට නෞකාවේ හිමිකරු වෙනුවෙන් පෙනී සිටින පාර්ශ්වයන්ගේ යහපත් ප්‍රතිචාර හිමිවීම විශේෂත්වයක් වන අතර ශ්‍රී ලංකා රජය සමඟ මේ පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කිරීමට ද ඔවුන්ගේ එකඟතාව පළ විය.
- 20.07.2023 දින එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීමෙන් සිදුවූ හානිය සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් සිංගප්පූරුවේ ආරම්භ කල අතර නීතිමය ක්‍රියාමාර්ගවලට මෙම සාකච්ඡාවලින් කිසිදු බලපෑමක් එල්ල නොවන බවට ද ඔවුන් සහතික විය.

8. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහය ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති නිරන්තරයෙන් දූෂණයට ලක්වන සංවේදී වෙරළ තීරයන් පිරිසිදු කිරීමේ වැඩසටහන.

- MV X-PRESS PEARL නෞකා අනතුර හේතුවෙන් දූෂණයට ලක්වූ වෙරළ තීරය පිරිසිදු කිරීම සඳහා විදේශ ආධාර මත ලැබුණු නවීන වෙරළ පිරිසිදු කිරීමේ යන්ත්‍ර සූත්‍ර (Beach sweepy tech hydro machines) යොදා ගනිමින් සිදු කිරීමට අපේක්ෂිත මෙම වැඩසටහනේ පෙරහුරු වැඩසටහනක් 2023.03.12 වන දින මට්ටක්කුලිය කාක දූපත වෙරළ තීරයේදී සිදු කල අතර ඒ සඳහා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා, නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති නීතිඥ අසේල බී රැකව , එහි සාමාන්‍යාධිකාරී ජගත් ගුණසේකර ඇතුළු අදාල රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධානීන් සහභාගී විය.
- එහි එක් පියවරක් වශයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති නීතිඥ අසේල බී. රැකව මහතාගේ ප්‍රධානත්වයෙන් Alliance of End Plastic Waste ආයතනයේ නියෝජිතයින් සමග සාකච්ඡාවක් සහ Ananta Sustainables ආයතනය සමග සාකච්ඡාවක් සිංගප්පූරු තානාපති කාර්යාලයේ දී 2023.07.20 සහ 2023.07.25 වන දින පවත්වන ලදී.
- මෙම ආයතන දෙක අතර පැවැති මෙම පළමු වටයේ සාකච්ඡාවන් දෙකම සාර්ථකව අවසන් වූ අතර ශ්‍රී ලංකා වෙරළ හා සාගර පරිසරයට ප්ලාස්ටික් මගින් සිදුවන දූෂණයන් අවම කර ගැනීම සඳහා මෙය මනා පිටුවහලක් වනු ඇත.
- මේ අවස්ථාවට අධිකාරියේ සභාපති තුමන් සමග සිංගප්පූරුවේ ALLIANCE to End Plastic Waste ආයතනය නියෝජනය කරමින් Nicholas Kolesch (Vice President Project) , Kim Stengert (Outreach and Education) , Eileem Eal (Regional Project Director) Ananta Sustainable යන මහත්ම මහත්මීන් සහභාගී විය.
- සැප්තැම්බර් 25 වන දින පැවති සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් Beach Tech Sweepy Hydro යන්ත්‍ර 8 හි භාවිතය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන අතර, ඒ සඳහා වසරකට රුපියල් මිලියන 5.7 බැගින් වසර 5ක කාලයක් සඳහා ලබා දීමට The Alliance of End Plastic Waste ආයතනය එකඟ වී ඇත.

අතුරු හිමිකම් වාර්තා ඉදිරිපත් කිරීම

- 2023 වර්ෂයේ දී MV X-PRESS PEARL නෞකා අනතුරට අදාලව අතුරු හිමිකම් වාර්තා 6ක් (12-17 දක්වා) නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.

අනු අංකය	අතුරු හිමිකම් වාර්තා අංකය	අතුරු හිමිකම් වාර්තාව ඉදිරිපත් කළ දිනය	වටිනාකම (USD)
1	12	27.01.2023	260,063.40
2	13	27.03.2023	491,784.93
3	14	03.08.2023	676,239.85
4	15	31.08.2023	394,944.59
5	16	13.12.2023	488,195.12
6	17	04.03.2024	429,929.59

අතුරු හිමිකම් වාර්තා වලට අදාලව මුදල් ලැබීම්

- 2022 වර්ෂයේ මාර්තු මස සිට අගෝස්තු මස දක්වා වන කාලසීමාව සඳහා 5 වන, 6 වන, 7 වන සහ 8 වන අතුරු හිමිකම් වාර්තා ඉදිරිපත් කර තිබූ අතර රක්ෂණ ආයතනයෙන් එම සියලුම අතුරු හිමිකම් වාර්තා වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 878,650.53 ක් සහ ශ්‍රී ලංකා රුපියල් 22,468,113.48 ක මුදලක් ගෙවීමට එකඟ වී තිබුනි. නමුත් අංක අමප/22/2167/618/056 දරන 2023.01.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පත්‍රිකාවට අනුව සියලුම වන්දි මුදල් ඇමරිකානු ඩොලර් මුදල් ඒකකයෙන්ම ලබා ගැනීමට අවශ්‍ය බැවින් හා තව දුරටත් රක්ෂණ ආයතනය සමග මේ සම්බන්ධව සාකච්ඡා සිදුවන බැවින් 2023.09.15 වන දින ශ්‍රී ලංකා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත රක්ෂණ ආයතනය විසින් එකඟ වී ඇති ඇමරිකානු ඩොලර් මුදල් ප්‍රමාණය (ඇමරිකානු ඩොලර් 878,650.53) පමණක් ගෙවා ඇත.

පාරිසරික හානිය පිළිබඳ ව වූ වාර්තාව ඉදිරිපත් කිරීම.

- පාරිසරික හානිය තක්සේරු කිරීම සඳහා පත් කළ විද්වත් කමිටුව මඟින් සකස් කරන ලද නෞකා අනතුරෙන් සිදු වූ පාරිසරික හානිය පිළිබඳ වූ තක්සේරු වාර්තාවන්හි 1 වන වාර්තාව 2021.09.05 වන දින ඉදිරි නීතිමය කටයුතු සඳහා නීතිපතිතුමා වෙත භාර දෙන ලදී. එසේම තවදුරටත් සිදුකරගෙන යනු ලබන පර්යේෂණ සහ අනෙකුත් හානි තක්සේරු ගණනය කිරීම්ද ඇතුළත්ව නෞකා අනතුරෙන් සිදු වූ පාරිසරික හානිය පිළිබඳ වූ තක්සේරු වාර්තාවන්හි 2 වන වාර්තාව 2023.01.11 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග

- 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ අපරාධ වගකීම කොටසේ 26 වගන්තිය යටතේ නැව් සමාගමට එරෙහිව නඩු පැවරූ අතර එහි ඉදිරි නීතිමය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.
- එසේම X-press පර්ල් නෞකා අනතුර හේතුවෙන් ශ්‍රී ලංකාවේ සමුද්‍ර පරිසර පද්ධතියට සිදුවූ හානිය සහ නෞකාව ගිලීයාම හේතුවෙන් වූ වන්දි අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් නෞකා සමාගමට එරෙහිව සිංගප්පූරු අධිකරණයේ 2023 අප්‍රේල් 25 වන දින නඩු පැවරූ අතර ඒ සම්බන්ධ කටයුතු අඛණ්ඩව මේ වනවිට පවත්වා ගෙන යනු ලබයි.

2023 වසරේදී සිදු වූ නෞකා අනතුරු

දිනය (අ i)	නෞකා අනතුරේ නම (අ ii)	නෞකා වර්ගය තෙල්/ භාණ්ඩ/ රසායනික (අ iii)	අනතුර සිදුවූ ස්ථානය (අiv)	අනතුරට හේතුව (අv)	තෙල් හෝ රසායනික විසිරුමේ ප්‍රමාණය (අvi)	ගනු ලැබූ නීතිමය කටයුතු (අvii)	පනතේ ක්‍රියාත්මක වූ වගන්තිය (අviii)	ලද මුදල හා දිනය (x)
3/16/2023	එම්. ටී. යූවී (එඹ ශඹ VI)	තෙල්	හම්බන්තොට වරාය	බංකර් තෙල් කාන්දුව	සුලු තෙල් කාන්දුවක්	පනතේ 11 වන වගන්තිය යටතේ අය කර ගෙන ඇත.	26 වන වගන්තිය (අපරාධ වගකීම යටතේ)	රු. 15,000,000.00
7/7/2023	මාදුරු ඔය	තෙල්	කොළඹ වරාය	බංකර් තෙල් කාන්දුව	1MT කට අඩු තෙල් කාන්දුවීමක් සිදුවිය.	අපරාධ වගකීම යටතේ නඩුව මහාධිකරණයේ පැවරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, රු. 15,000,000.00ක බැඳුම්කර ගිවිසුමකට එළඹීමට නැව් හිමිකරුවන් එකඟ වූ අතර, එමගින් අවසාන අධිකරණ තීන්දුව තෙක් මෙහෙයුම් නැවත ආරම්භ කිරීමට හැකි වේ.	26 වන වගන්තිය (අපරාධ වගකීම යටතේ) නිතිමය කටයුතු සිදු වෙමින් පවති.	......
7/8/2023	තග් අවාද් බා(ර්)ජ් අතුල්‍යා (Thug Avadh Barge Athulya)	බා(ර්)ජ් යාත්‍රවක්	කන්කාඩු, මන්නාරම	පැවැති අහිතකර කාලගුණික තත්වය හේතුවෙන් නොගැඹුරු වෙරළ තීරයේ ඇණ හිටින ලදී.	සමුද්‍ර දූෂණයක් නොමැත	......	34 වන වගන්තිය (සිවිල් වගකීම යටතේ)	රු. 588,049.00 (සිදුවූ අනෙකුත් වියදම් සඳහා වැය වූ මුදල නැව් සමාගම විසින් ගෙවන ලදී)
9/2/2023	ඔලිම්පික් සෙම්බකන්ග් (Sembakung Barge)	වැලි	හම්බන්තොට වරාය	පැවැති අහිතකර කාලගුණික තත්වය හේතුවෙන් නොගැඹුරු වෙරළ තීරයේ ඇණ හිටින ලදී.	සමුද්‍ර දූෂණයක්	නොමැත වෙරළාසන්න සහ සමුද්‍ර පරිසරයට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීම සඳහා කඩිනමින් ඉවත් කරන ලෙස ඉල්ලා නැව් හිමිකරු වෙත ලිපියක් නිකුත් කර ඇත.	නැත	නැත
9/21/2023	එම්.ටී.ෆෙදර් (MT Feather)	තෙල්	කොළඹ වරාය	තෙල් හුවමාරු වේ දී සිදු වූ කාන්දුවක්	2 එඹක තෙල් කාන්දුවීමක් සිදුවිය.	පනතේ 26 වන වගන්තිය යටතේ අය කර ගෙන ඇත.	26 වන වගන්තිය (අපරාධ වගකීම යටතේ)	රු.15,197,916.71 (2022.07.12)
12/16/2023	එම්.වී.හර්මන් ස්කීපර්ස් MV Herman Schepers	තෙල්	කොළඹ වරාය	තෙල් හුවමාරු වේ දී සිදු වූ කාන්දුවක්	සුලු තෙල් කාන්දුවක්	පනතේ 26 වන වගන්තිය යටතේ අය කර ගෙන ඇත.	26 වන වගන්තිය (අපරාධ වගකීම යටතේ)	රු.15,000,000.00

තෙල් හැසිරවීමේ සමාගම් සඳහා වූ හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක සැළැස්ම සඳහා අනුමැතිය

තෙල් හැසිරවීමේ සමාගම් සඳහා වූ හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක සැලැස්ම සඳහා හදිසි තෙල් විසිරීම් නියාමනය යටතේ අනුමැතිය ලබාදෙයි. ඒ අනුව 2023 වර්ෂය සඳහා ආයතන 07 ක් වෙනුවෙන් මෙම සැලැස්ම සඳහා අනුමැතිය ලබා දුනි.

7.4 ගොඩබිම් පරිසරයේ ක්‍රියා නිසා සිදුවන සමුද්‍ර දූෂණය පාලනය සඳහා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම.

7.4.1 මුහුදු ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේ වැඩසටහන.

ලොව ප්‍රමුඛතම සංචාරක ගමනාන්ත අතුරින් ශ්‍රී ලංකාවේ වෙරළ කලාප, දෙස් විදෙස් සංචාරකයින් අතර ඉතා ප්‍රචලිත අතර මෙය ශ්‍රී ලංකාවේ ආර්ථිකය නගා සිටුවීම සඳහා ප්‍රභලව දායක වන සාධකයකි. සංචාරකයින් විවිධ අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකාවේ වෙරළ තීරයන් වෙත ආකර්ෂණය වේ. පිහිනීම ඇතුළු විනෝදාත්මක කටයුතු සඳහා භාවිතා කරන සාගර ජලය, වර්තමානයේ සමුද්‍ර අපද්‍රව්‍ය හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් වර්ග නිසා විශාල ලෙස දූෂණයට ලක්ව ඇත. තවද නාවික කටයුතු මගින් සිදුවන දූෂණයද, ජලයේ ගුණාත්මක භාවය අඩුකිරීමට හේතු වී ඇත.

දේශීය විදේශීය සංචාරකයන් සඳහා විශිෂ්ට සේවයක් සැපයීමේදී වෙරළබඩ ජලයේ ගුණාත්මක භාවය ඉතා වැදගත් වන අතර, සමුද්‍රය පරිසර ආරක්ෂණ අධිකාරිය එහි වැදගත්කම සැලකිල්ලට ගනිමින් ජලයේ ගුණාත්මක භාවය නිරන්තර පරික්ෂාවට ලක් කරමින් දියනෑම ඇතුළු විනෝදාත්මක කටයුතු සිදු කරන ස්ථානයන්හි ජලතත්ව පිරික්සීමේ වැඩසටහන අරඹමින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. මෙම වාර්තාව මගින් 2023 වසරේ ශ්‍රී ලංකාවේ වෙරළබඩ නාන තොටුපොළවල් හා විනෝදාත්මක කටයුතු සිදුකරන ස්ථානයන්හි ජලයේ ගුණාත්මක භාවය පිලිබඳ සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කෙරේ.

ජල තත්ව අධ්‍යයන කටයුතු වලදී ජලයේ උෂ්ණත්වය (Temperature), බොරතාවය හා අවලම්භිතතාවය(Turbidity), සහ සන්නායකතාවය (Conductivity) යන භෞතිය ගුණ මිනුම් ද ආම්ලික හා භාෂ්මිකතාව, නයිට්රේට් සහ පොස්පේට් සංයුතිය යන රසායනික මිනුම් සඳහා ද ජලයේ ද්‍රාව්‍ය ඔක්සිජන් ප්‍රමාණය (Dissolved Oxygen level) ජෛව ඔක්සිජන් ඉල්ලුම (Bµochemµcal Oxygen Demand) රසායනික ඔක්සිජන් ඉල්ලුම (Chemµcal O·ygen Demand) යන භෞතික රසායන මිනුම් සඳහා ද කෝලිෆෝම් බැක්ටීරියාව සහ මළ ද්‍රව්‍ය වල සිටින කෝලිෆෝම් බැක්ටීරියාවන් (Fecal Coliform) ප්‍රමාණය යන ක්ෂුද්‍ර ජීවින් සඳහා වන මිනුම් සඳහා ද මාසිකව ජල සාම්පල් පරීක්ෂා කරනු ලැබේ. 2023 වසර සඳහා MEPA ප්‍රාදේශීය කාර්යාල 12 මගින් ලංකා වෙරළ තීරය වටා විසිරී පවතින ප්‍රධාන වෙරළබඩ නාන ස්ථාන 35 ක ජල තත්ත්ව පරාමිතීන් 09 ක් පරීක්ෂා කරන ලද අතර එම දත්තයන්ගේ විශ්ලේෂණාත්මක සංක්ෂිප්තය පහත පරිදි වේ.








සම්පූර්ණ විසුරුවා හරින ලද ඝන ද්‍රව්‍යය (TDS)
සම්පූර් ණ විසුරුවා හරින ලද ඝන ද්‍රව්‍යය mg/L


ලවණතාව
ලවණතාව ppt


පොස්පේට්
පොස්පේට් mg/L as PO₄³⁻


බොරතාවය
කැළඹීම NTU


නයිට්රේට්
නයිට්රේට් mg/L as NO₃⁻-N

මීට අමතරව මළද්‍රව්‍ය මගින් ජලය දූෂණය වීම මනිනු ලබන ප්‍රධාන පරාමිතිය වන ජලයේ සිටින Fecal Coliform ප්‍රමාණය ගණනය කිරීම සිදු කරනු ලබන අතර එම ප්‍රමාණය මුහුදු ජලයේ රෝග කාරක බැක්ටීරියාවන් පැවතීමේ හැකියාව පෙන්වා දෙනු ලබන පැහැදිලි දර්ශකයක් වේ. නාන තොටුපලයන්හි ජලයේ ගුණාත්මය වැඩි දියුණු කර පවත්වාගෙන යාම සඳහා මෙන්ම විවිධ විනෝදාත්මක කටයුතුවල යෙදෙන මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ පියවර ගැනීම සඳහාද මෙම දත්ත ඉතා වැදගත් වෙයි. 2023 වසර සඳහා Fecal Coliform සාමාන්‍ය අගයන් පහත පරිදි වේ.



7.4.2 ක්ෂුද්‍ර ප්ලාස්ටික් විද්‍යාගාරය

අති නවීන තාක්ෂණයෙන් යුත් උපකරණ වලින් සමන්විත ක්ෂුද්‍ර ප්ලාස්ටික් විද්‍යාගාරය 2022/03/07 වන දින ආරම්භ කිරීමෙන් පසු 2023 වර්ෂයේදී පහත සාරාංශ කොට ඇති පරිදි සාගර විශ්ව විද්‍යාලය, රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය සහ කොළඹ විශ්ව විද්‍යාලය යන විශ්ව විද්‍යාල වල විද්‍යාර්ථයින් තම අවසන් වසර ව්‍යාපෘති වෙනුවෙන් අප ක්ෂුද්‍ර ප්ලාස්ටික් විද්‍යාගාරය යොදා ගෙන ඇත.

ප්‍රකාශනයේ නම	කතෘ	විශ්ව විද්‍යාලය
"Occurrence of Microplastics in the Pareiwella Beach, Sri Lanka" ISBN: 978-624-5553-37-2	එන්. එම්. ඩබ්. එස්. නවරත්න	ධීවර හා සාගර විද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර හා සාගර විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
"Microplastic contamination in Brown mussels (Perna perna) along the Southern coastal waters of Sri Lanka"	ඩී. එම්. ටී. එන්. දිසානායක	ධීවර හා සාගර විද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර හා සාගර විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
"Microplastics accumulated in the sediments of Rekawa lagoon, Sri Lanka" Paper ID: IRCUWU2023-173	ඒ. එම්. එස්. දිල්ශානි	ධීවර හා සාගර විද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර හා සාගර විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
"Microplastics abundance in coral reef based sediments at Pareiwella and Polhena, Southern Sri Lanka"	ආර්. අයි. බී. කේ. ඩී. රත්නමලල එස්. ආර්. කේ. කරුණාරත්න	ධීවර හා සාගර විද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර හා සාගර විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
"A Comparative study of Microplastic Abundance and Characteristics in Bivalves in Negombo Lagoon area in Sri Lanka"	ඒ. පී. ඒ. එන්. එරන්දතී	සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය
"Assessment of Microplastic Distribution in Coastal Areas of North-Western and Western Provinces, Galle and Matara Districts in Sri Lanka Highly Affected by MV X-Press Pearl Ship Wreck"	එල්. ඩී. කාවින්ද්‍යා	කොළඹ විශ්වවිද්‍යාලය

උක්ත විද්‍යාර්ථයින්ගේ වැඩි ඉල්ලුමක් පැවතියේ අවසාන හඳුනාගැනීමට වන අතර අප විද්‍යාගාරය ඒ සඳහා භාවිතා කරන Stereo Microscope සහ FTIR වැනි ඉතා දුර්ලභ නවීන තාක්ෂණයෙන් යුත් උපකරණ භාවිතයෙන් අවසාන හඳුනා ගැනීමේ කටයුතු සිදුකරන ලදී.

උපකරණ භාවිතය සිදුකරන අවස්ථා පහත පරිදි වේ.



Search Library 5/31/2024 3:29:03 PM

Polymer	PF
CAS Registry Number	9003-35-4
Substance	phenol formaldehyde resin
Trade Name	PF 31 9005 P1
Supplier	Momentive
Filler	unfilled
Filler Content	0-
Color	black
Processing Method	injection molding
Density	1,42

Color	Hit Quality	Compound name	CAS Number	Molecular formula	Molecular weight
	818	PF	9003-35-4		

Color	File	Path	Spectrum Type
	Sample description.104	C:\Users\DELL\Documents\Bruker\OPUS_8.7.10\DATA\MEAS	Query Spectrum

Page 1 of 1







7.4.3 ධීවර වරායන් අපද්‍රව්‍ය වලින් දූෂණය වීම වැළැක්වීම හා පිරිසිදු කිරීමේ වැඩසටහන් ප්‍රගතිය.



ශ්‍රී ලංකාවේ ධිවර වරායන් වල ව්‍යාප්තිය

වෙරළ හා සමුද්‍රීය පරිසරය දූෂණය වීම සෘජුවම හෝ වක්‍රාකාරව විවිධ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන්නකි. මෙලෙස එක් වන්නා වූ අහිතකර දූෂ්‍ය ද්‍රව්‍ය හේතුවෙන් ජීවී අජීවී පරිසර පද්ධතීන්ට අහිතකර බලපෑම් ඇති කරනු ලබයි. වෙරළ හා සාගර පරිසරය ආශ්‍රිතව සිදුවන්නාවූ ප්‍රධාන මිනිස් ක්‍රියාකාරකමක් වන ධිවර කර්මාන්තයේදී විවිධ ආකාරයෙන් දැල් කැබලි, සෘජුෆෝම් කැබලි, ප්ලාස්ටික් බෝතල් වැනි දූෂ්‍ය ද්‍රව්‍ය මෙලෙස වෙරළ හා සාගර පරිසරයට එකතු වේ. එබැවින් ධිවර වරායන් යනු සමුද්‍ර දූෂණයට සෘජුවම බලපාන මූලාශ්‍රයන් වන අතරම, සමුද්‍ර දූෂණය නිසා විශාල බලපෑමකට ලක්වන ස්ථානයක් ද වේ. එබැවින් මෙම ධීවර කර්මාන්තය තුලින් සමුද්‍ර දූෂණයේ බලපෑම අවම කිරීම සඳහා විවිධ වැඩසටහන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මඟින් සංවිධානය කරනු ලබයි.

2023 වර්ෂය තුළ ප්‍රාදේශීය කාර්යාල මඟින් ධිවර වරායන් අපද්‍රව්‍ය වලින් දූෂණය වීම වැළැක්වීම සඳහා කරනු ලැබූ වැඩසටහන් වල ප්‍රගතිය පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	රැස්වීම් හා ක්ෂේත්‍ර පරීක්ෂාවන්
යාපනය	මයිලිඩ් ධීවර වරාය අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිරීක්ෂණය හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
හම්බන්තොට	හම්බන්තොට, කුඩාවැල්ල, කිරින්ද, තංගල්ල, කලමැටිය ධීවර වරාය අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු පිහිටුවීම හා අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය නිරීක්ෂණය.
කළුතර	බේරුවල ධීවර වරාය තුල අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය අධීක්ෂණය
මාතර	නිල්වැල්ල, සුදුවැල්ල, පුරාණවැල්ල සහ මිරිස්ස ධීවර වරායන් තුල වරාය අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු පිහිටුවීම හා අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය නිරීක්ෂණය
පුත්තලම	හලාවත, නයිනමඩම සහ කල්පිටිය ධීවර වරායන් තුල වරාය අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු පිහිටුවීම හා අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම, හලාවත හා නයිනමඩම වරායන් වල පිරිසිදු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
ත්‍රිකුණාමලය	යෝඩ්බේ ධීවර වරාය තුල අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම
මඩකලපුව	වාලච්චේන ධීවර වරාය තුල අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම.
ගාල්ල	ගාල්ල ධීවර වරායේ කමිටු රැස්වීමක් පැවැත් වීම, ගාල්ල, දොඩන්දූව, හික්කඩුව සහ අම්බලන්ගොඩ වරායන් තුල අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය නිරීක්ෂණය
කොළඹ	පානදුර ධීවර වරාය අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිරීක්ෂණය හා පිරිසිදු කිරීමේ වැඩසටහනක් හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
ගම්පහ	මීගමුව වරාය අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය නිරීක්ෂණය

7.4.4 මුහුදට පිරිපහදු කල අපද්‍රව්‍යය බැහැරකිරීමේ බලපත්‍ර නිකුත් කිරීම.

පිරිපහදු නොකළ අපජලය මුහුදට හෝ වෙරළබඩ කලාපයට මුදා හැරීම පාලනය කිරීම සඳහා වෙරළබඩ කලාපයේ හෝටල් සහ කර්මාන්ත සඳහා පිරිපහදු කළ අපජලය මුහුදට බැහැර කිරීමේ බලපත්‍ර නිකුත් කෙරේ. ඒ අනුව වෙරළාසන්න ප්‍රදේශයේ හෝටල් සහ කර්මාන්ත හිමියන් මුහුදට අපද්‍රව්‍ය බැහැර කිරීමේදී පිරිපහදු කළ අපජලය පමණක් බැහැර කිරීමට යොමුවෙන නිසා වෙරළ හා සමුද්‍රය දූෂණය වීම පාලනය වේ.

මුහුදට පිරිපහදු කල අපද්‍රව්‍ය බැහැරකිරීමේ බලපත්‍ර නිකුත් කිරීම 2013 අංක 01 දරන සමුද්‍රීය පරිසර ආරක්ෂණ (මුහුදට ඉවත දැමීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ) නියෝගය යටතේ සිදු කරනු ලබයි. වාර්ෂික බලපත්‍රයක් වන මෙම බලපත්‍ර නිකුත් කිරීමේදී මුහුදට හෝ වෙරළ කලාපයට මුදාහරින වාර්ෂිකව නිකුත් කරන පිරිපහදු කරන ලද අපද්‍රව්‍ය ප්‍රමාණය මත ගාස්තු ප්‍රමාණය තීරණය වන අතර රෙගුලාසියේ සඳහන් ධාරණ සීමාවන් දක්වා අපජලය පිරිපහදු කිරීම අනිවාර්ය වේ.

සලකනු ලබන ප්‍රධාන පරාමිතීන්

අංකය	නිර්ණායකයන්	ඒකක හා සීමා	ධාරණ සීමා අගයන්
01	මුළු අවලම්බිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය	මිලිග්‍රෑම්/ලීටර් උපරිම	150
02	පරිසර උෂ්ණත්වයේදී ව්‍ය අගය	-	5.5-9.0
03	ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (සෙ. 20 දී දින 5ක් තුළ - BOD5 හෝ සෙ. 27 දින 3ක් තුළ BOD3)	මිලිග්‍රෑම් /ලීටර් උපරිම	100
04	මුදා හැරීමේදී උෂ්ණත්වය	සෙ.අංශක. උපරිම	මුදා හරින ස්ථානයේදී සෙ. 45
05	තෙල් වර්ග හා ග්‍රීස් වර්ග	මිලිග්‍රෑම් /ලීටර් උපරිම	20
06	රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD)	මිලිග්‍රෑම් /ලීටර් උපරිම	250
07	සම්පූර්ණ ශේෂ ක්ලෝරීන්	මිලිග්‍රෑම් /ලීටර් උපරිම	1.0
08	මළ අපද්‍රව්‍යය බැක්ටීරියා (Fecal coliform)	ඉතා ආසන්න සංඛ්‍යාව මිලිලීටර්/උපරිම	60

ඉහත පරාමිතීන්ට අමතරව අපජලය ජනනය වන මුලාශ්‍රය (කර්මාන්ත) අනුව රෙගුලාසියේ සඳහන් අනෙකුත් පරාමිතීන්ද සලකා බලනු ලබයි.

පිරිපහදු නොකළ අපජලය මුහුදට හෝ වෙරළබඩ කලාපයට මුදා හැරීම පාලනය කිරීම සඳහා වෙරළබඩ කලාපයේ හෝටල් සහ කර්මාන්ත සඳහා අපජලය මුහුදට බැහැර කිරීමේ බලපත්‍ර නිකුත් කෙරේ. එබැවින් වෙරළාසන්න ප්‍රදේශයේ දූෂණය අවම කිරීමට එය දායක වන අතර හෝටල් හිමියන් මුහුදට අපද්‍රව්‍ය බැහැර කිරීමේදී පසුගාමී වේ.

2023 දී ඩම්පින් බලපත්‍ර 260 ක් නිකුත් කර ඇත. 2022 සසඳන විට එය 18.46% ක අඩුවීමක් විය. 2023 දී කොන්දේසි සහිත බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන් බලපත්‍ර සංඛ්‍යාවේ අඩුවීමක් සිදු වී ඇත. රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් වසර අවසානයේ තාවකාලිකව වසා දමා ඇති හෝටල් සංඛ්‍යාව 74කි. නීතිවිරෝධී ආයුධ සහ පතොරම්, කැණීම් ද්‍රව්‍ය, යාත්‍රා සහ මිනිසා විසින් සාදන ලද කොන්ක්‍රීට් ව්‍යුහයන්,යාත්‍රා ආදිය බැහැර කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් එක් වරක් පමණක් නිකුත් කරන ඩම්පින් බලපත්‍ර 28 ක් නිකුත් කරන ලදී.

පසුගිය වසර පහ තුළ නිකුත් කළ බලපත්‍ර ගණන

වසර	බලපත්‍ර ගණන
2019	315
2020	252
2021	201
2022	308
2023	260



පසුගිය වසර 5 තුළ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව විචලනය

2023 වර්ෂය තුල දී ඩම්පින් බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබූ ආදායම රු. 4,805,975.00 වන අතර එය පෙර වසරට සාපේක්ෂව අඩුවීමකි. එසේ ආදායම අඩු වීමට බලපෑ ඇත්තේ මූලික වශයෙන් West International Terminal ව්‍යාපෘතිය සඳහා එක් වරක් බලපත්‍රයක් නිකුත් කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ රු. 67,830,902.00 ආදායමක් ලැබීම හා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සුළු වශයෙන් අඩුවීමයි.

පසුගිය වසර පහ තුළ පිරිපහදු කල අපද්‍රව්‍ය බැහැරකිරීමේ බලපත්‍ර නිකුත් කීරීම මගින් ලැබූ ආදායම

වසර	ආදායම (රුපියල්)
2019	6,357,660.74
2020	4,364,902.05
2021	3,418,226.18
2022	74,136,764.00
2023	4,805,975.00



7.4.5 පිවිතුරු සයුරක් පවත්වා ගැනීම සඳහා වෙරළ රැකබලාගන්නන් යෙදවීමේ වැඩසටහන

සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින්, ලංකාව වටා පිරිසිදු වෙරළක් සහතික කිරීම උදෙසා, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පිරිසිදු වෙරළ නගර වැඩසටහන රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය යටතේ ආරම්භ කර ඇත.

වෙරළ තීරයන්හි තිරසාර කළමනාකරණය සඳහා වෙරළ රැ කබලා ගන්නන් ක්‍රියාවේ යෙදවීම , සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ආයතනික සමාජ වගකීමක් ලෙස ක්‍රියාත්මක වේ. තවද මෙම වැඩසටහන අඛණ්ඩව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමග එක්ව දිවයිනේ සියලුම වෙරළබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.

2023 වසර තුළ වෙරළ රැකබලා ගන්නන් වැඩසටහන සඳහා අනුග්‍රහය දක්වන සමාගම්;

1. ඉන්දියන් ඔයිල් සමාගම වෙරළ රැකබලා ගන්නන් 17 දෙනෙක් සඳහා අනුග්‍රහය දැක්වීය.
2. හේමාස් හෝල්ඩිංස් වෙරළ රැකබලා ගන්නන් 4 දෙනෙක් සඳහා අනුග්‍රහය දැක්වීය.
3. වෙරළ රැකබලා ගන්නන් 3 දෙනෙක් සඳහා ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය අනුග්‍රහය දැක්වීය.
4. වෙරළ රැකබලා ගන්නන් 20 දෙනෙක් සඳහා කිලීන් ඕෂන් ෆෝස් අනුග්‍රහය දැක්වීය.

වැඩසටහන් ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිතව වෙරළ රැකබලාගන්නන් 44ක් පිහිටුවා ඇති අතර ඔවුන් කි.මී. 23ක් දිග වෙරළ තීරයක් දිනපතා පිරිසිදු කරනු ලබයි.

2023 දෙසැම්බර් 31 වන විට වැඩසටහනේ ප්‍රගතිය

අංක	දිස්ත්‍රික්කය	වෙරළ රැක බලා ගන්නන් සංඛ්‍යාව	පිරිසිදු කරන ලද වෙරළ තීරයේ දිග (කි.මී)
1	කොළඹ	14	6
2	ගම්පහ	5	5
3	කළුතර	7	6
4	ගාල්ල	4	3
5	යාපනය	14	3
	එකතුව	**44**	**23**

මෙම වැඩසටහනේදී දිරාපත් නොවන අපද්‍රව්‍ය එකතු කරනු ලබයි. PET බෝතල්, වෙනත් ප්ලාස්ටික්, වීදුරු, ලෝහ වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරන්නන් වෙත භාර දෙනු ලැබේ. ඉතිරි කොටස් බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත භාර දෙනු ලැබේ.

සෑම වෙරළ රැකබලාගන්නකු විසින්ම සෑම මසකම එක්රැස් කරන අපද්‍රව්‍ය ප්‍රමාණය සම්බන්ධයෙන් දත්ත ගොනුවක් පවත්වාගෙන යනු ලැබේ. 2023 වර්ෂය තුළ අපද්‍රව්‍ය එකතු කිරීමේ මුළු ප්‍රමාණය කිලෝග්‍රෑම් 107,528 කි. ඒවායින් බොහොමයක් ප්ලාස්ටික් සහ වීදුරු විය.

7.4.6 බලාත්මක කිරීමේ ඒකකය වැඩසටහන - Enforcement Unμts Program

ශ්‍රී ලංකාව තුළ සිදු වන ප්‍රධාන ආර්ථික ක්‍රියාවලියෙන් රැසක් සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබයි, මෙම කළාපය වෙරළ සහ සාගර සම්බන්ධ වන පාදක රේඛාවේ සිට මීටර් 300ක් රට අභ්‍යන්තරට සහ සමුද්‍රය දෙසට කිලෝමීටර් 360 ක් (නාවික සැතපුම් 200) දුරට විහිදී ඇති අතර මෙම කලාපය තුළ රටේ ජනගහනයෙන් 30%ක් පමණ වාසය කරයි. මෙම ප්‍රධාන ආර්ථික ක්‍රියාවලීන් ලෙස ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය , යාත්‍රා නිපදවීමේ හා අලුත්වැඩියා කිරීමේ කටයුතු සහ වෙළඳ නාවික කටයුතු හැඳින්විය හැක. මෙම කර්මාන්ත ඇතුලු අනෙකුත් වෙරල ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් විශාල වශයෙන් සාගර පරිසරයට අපද්‍රව්‍ය එකතු වේ. බලාත්මක කිරීමේ ඒකක පිහිටුවීම තුලින් මෙම කලාපයේ ජනනය වන අපද්‍රව්‍ය නිසි ලෙස කලමණාකරණයට බලගැන්වීම තුලින් සිදුවිය හැකි සමුද්‍ර දූෂණය අවම කිරීමට හැකියාව ලැබී ඇත.

මෙම කලාපය තුළ නිසි ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය නොවීම හේතුවෙන් ජාතික ව්‍යසනයක් බවට පත්ව ඇති අතර එය ඩෙංගු උවදුර ව්‍යාප්ත වීමට අනුබලයක් වී ඇත. වෙරළ තීරයේ ජලය එක්රැස් විය හැකි ස්ථාන වශයෙන් ධීවර ක්ෂේත්‍රයට සම්භන්ධ ධීවර වරාය, ධීවර නැංගුරම් පොළ, තොටුපල හා යාත්‍රා නිෂ්පාදන ආයතන හඳුනාගෙන ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණය දුර්වල මට්ටමක පවතින අතර, අදාළ පාර්ශ්ව අතර විධිමත් සම්බන්ධීකරණයක් නොමැති වීම මෙයට ප්‍රධාන හේතුව වී ඇත. මේ සඳහා පිලියමක් වශයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූලිකත්වයෙන් වෙරළබඩ දිස්ත්‍රික්ක 14 හිම පවතින වෙරළබඩ පළාත් පාලන ආයතන හා අනෙකුත් ඍජු හා වක්‍රව සම්බන්ධ ආයතන එකතුවෙන් බලාත්මක කිරීමේ ඒකක පිහිටුවීමට කටයුතු සිදු කල අතර මේ වන විට ලංකාව වටා බලාත්මක කිරීමේ ඒකක 84 ම පිහිටුවා එමගින් සමුද්‍ර දූෂණය වැලැක්වීමට කටයුතු සිදු කරමින් සිටී.

පිහිටුවන ලද බලාත්මක කිරීමේ ඒකක 84 පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	බලාත්මක කිරීමේ ඒකකයේ නම
හම්බන්තොට	i. තංගල්ල නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. තංගල්ල ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. අම්බලන්තොට ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. හම්බන්තොට මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. හම්බන්තොට ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
මාතර	i. දික්වැල්ල ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. දෙවුන්දර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. මාතර මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. වැලිගම ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. වැලිගම නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.

දිස්ත්‍රික්කය	බලාත්මක කිරීමේ ඒකකයේ නම
ගාල්ල	i. බෙන්තර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. බලපිටිය ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. අම්බලන්ගොඩ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. හික්කඩුව නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. රත්ගම ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. ගාල්ල මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vii. හබරාදුව ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
කළුතර	i. පානදුර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. කළුතර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. කළුතර නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. බේරුවල ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. බේරුවල නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. පානදුර නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
කොළඹ	i. දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. මොරටුව මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. කොළඹ මහ නගර සභාවේ බලාත්මක කිරීමේ ඒකකය
ගම්පහ	i. මීගමුව මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. වත්තල ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
පුත්තලම	i. වෙනප්පුව ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. හලාවත ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. හලාවත නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. පුත්තලම ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vii. පුත්තලම නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	viii. කල්පිටිය ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ix. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
මන්නාරම	i. මන්නාරම නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. නානාත්තන් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. මුසලි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. මාන්තෙයි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. මන්නාරම ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
කිලිනොච්චිය	i. පූනකරි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.

දිස්ත්‍රික්කය	බලාත්මක කිරීමේ ඒකකයේ නම
යාපනය	i. ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. වෙලනයි (දූපත දකුණ) ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. කයිට්ස් (දූපත උතුර) ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. කරෙයිනගර් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. යාපනය මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. නල්ලූර් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vii. වලිකාමම් නිරිතදිග ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	viii. වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ix. වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	x. වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	xi. තෙන්මාරච්චි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	xii. තෙන්මාරච්චි නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	xiii. වඩමාරච්චි නිරිතදිග ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	xiv. පේදුරුතුඩුව නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	xv. වැල්වැටිතුරේ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	xvi. වඩමාරච්චි නැගෙනහිර ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
මුලතිව්	i. මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
ත්‍රිකුණාමලය	i. ත්‍රිකුණාමලය නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. උප්පුවේලි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. කින්නියා නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. කින්නියා ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. මුතූර් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. කුච්චවේලි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vii. වෙරුගල් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
මඩකලපුව	i. කලුවංචිකුඩි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. ආරයම්පති ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. කාත්තන්කුඩි නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. මඩකලපුව මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. වෙන්කලඩි ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. වාලච්චේන ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vii. වාකරේ ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
අම්පාර	i. තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ii. පොතුවිල් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iii. ආලයඩිවෙඹු ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	iv. අඩ්ඩාලිචේන ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	v. නින්දවූර් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vi. කරෙයිතීව් ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	vii. අක්කරපත්තුව මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	viii. කල්මුණේ මහ නගර සභාව බලාත්මක කිරීමේ ඒකකය.
	ix. ලාහුගල ප්‍රාදේශීය සභාව බලාත්මක කිරීමේ ඒකකය.

ඉහත ඒකක මඟින් මෙතෙක් වෙරළබඩ ප්‍රදේශ වල පැවති කසල කළමනාකරණ ගැටලු විසඳීම සඳහා අදාල පාර්ශව ආයතන හා එක්ව සාකච්ඡා පවත්වමින් අධීක්ෂණ කටයුතු වල නිරත වෙමින් ක්‍රියාකාරීව කටයුතු කරනු ලැබේ. මෙම බලාත්මක කිරීමේ ඒකක තුල අදාල සියලු ආයතන සම්බන්ධ වී ඇති හෙයින් නීති, ප්‍රතිපාදන මඟින් ශක්තිමත් වන හෙයින් ගැටලු සඳහා කඩනම් විසඳුම් ලබා දීමට හැකි වී ඇත.

2023 වර්ෂය තුළ බලාත්මක කිරීමේ ඒකක මඟින් අදාලව දිස්ත්‍රික්කයන්හි සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- පැවැත්වූ මුලු කමිටු රැස්වීම් සංඛ්‍යාව 67
- පැවැත්වූ මුලු කෂේත්‍ර නිරීක්ෂණ සංඛ්‍යාව 64
- සිදුකරන ලද වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 24
- සිදුකරන ලද ඩෙංගු මැඩලීමේ වැඩසටහන් සංඛ්‍යාව 07
- සිදුකරන ලද කඩොලාන පැළ සිටුවීමේ වැඩසටහන් සංඛ්‍යාව 03
- වෙරළ රැකබලා ගැනීම සඳහා වෙරළ රැකබලාගන්නන් 04 ක් යෙදවීම.

බොහෝ දිස්ත්‍රික් කාර්යාල මඟින් පෞද්ගලික අංශයේ අනුග්‍රාහකත්වය ලබාගනිමින් බලාත්මකක කිරීමේ ඒකක හා ඒකාබද්ධව වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්, පැළ සිටුවීමේ වැඩසටහන් ඇතුළු වැඩසටහන් රාශියක් 2023 වර්ෂය තුළ සිදුකර ඇත.

මාතර දිස්ත්‍රික්කයේ මඩිහ සිට පොල්හේන දක්වා සිදුකල ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාව

මාතර දිස්ත්‍රික්කයේ පොල්හේන ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ සිදුකරන ලද ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාව

ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර ප්‍රාදේශීය සභා කමිටු රැස්වීම

යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභා කමිටු රැස්වීම

කළුතර දිස්ත්‍රික්කයේ කැලිඩෝ වෙරළ තීරයේ සිදුකල පැළ සිටුවීමේ වැඩසටහන

ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ වෙරළ තීරයේ සිදුකරන ලද වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන

යාපනය දිස්ත්‍රික්කයේ කයිට්ස් ප්‍රාදේශීය සභා කමිටු රැස්වීම

7.4.7 නීල ධජ වෙරළ ස්ථාපනය කිරීම

නිල්ධජ වෙරළක් යනු, පාරිසරික අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර සම්මේලනය - FEO මගින් මෙහෙයවනු ලබන නිල්ධජ වැඩසටහන යටතේ, පාරිසරික අධ්‍යාපනය සඳහා වන පදනම FEE මගින් පිරිනමනු ලබන, නිල්ධජ සම්මානය හිමි වෙරළ තීරයකි.

මෙම සහතිකය ලබා ගැනීම සඳහා ප්‍රධාන නිර්ණායක 33 ක් ඔස්සේ වෙරළ තීරයන්හි ගුණාත්මක තත්වය වැඩි දියුණු කල යුතු අතර ප්‍රධාන වශයෙන් සමුද්‍රීය නාන තොටුපළවල් තක්සේරුකරණය සඳහා මෙම සංකල්පය වැදගත් වනු ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රථම නිල ධජ වෙරල ස්ථාපනය සඳහා දකුණු පළාතේ ඉහල සංචාරක ආකර්ශනයක් සහිත උණවටුන වෙරල තීරය නම් කර ඇත. 2022 වර්ෂයේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූලිකත්වයෙන් උණවටුණ නිල්ධජ වෙරළ ස්ථාපන කටයුතු ආරම්භ කල අතර ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම උණවටුන ආශ්‍රිතව ප්‍රජාව දැඩි උනන්දුවකින් යුක්තව කටයුතු කරන ලදී. එසේම 2022 වර්ෂය තුළ, මීට අදාලව, වෙරළ කලාප කළමනාකරණ කමිටු පිහිටුවීම, කමිටු රැස්වීම් පැවැත්වීම, වෙරළ තීරය සහ දිය යට කලාපනය ආදී කටයුතු සිදු කරන ලදී.

මෙහිදී වෙරලේ ගුණාත්මක තත්වය වැඩි දියුණු කරනුයේ; ජලයේ තත්වය, තොරතුරු හා පාරිසරික අධ්‍යාපනය, පාරිසරික කළමනාකරණ හා ආරක්ෂාව සහ සේවා යන ප්‍රධාන අංශ 4 කට අදාල වන නිර්ණායක 33 කට අනුකූලවය.

2023 වර්ෂය තුළ, නිල්ධජ වෙරල වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත වූ අතර එහිදී උණවටුන වෙරළට අමතරව බෙන්තර, පාසිකුඩා හා අරුගම්බේ යන නාන තොටුපලවල් ද එම වැඩසටහන සඳහා අලුතින් යෝජනා විය. එසේම ශ්‍රී ලංකා සංචාරක අමාත්‍යාංශය, පාසිකුඩා හා අරුගම්බේ නාන තොටුපලවල් හි නිල්ධජ වෙරළ වැඩසටහන සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

උණවටුන නිල්ධජ වැඩසටහන

2023 වසරේදී උණවටුන වෙරල තීරය නිල්ධජ වෙරළ තීරයක් දක්වා සංවර්ධනය කිරීමේ සැලසුම් සකස්කිරීම සිදුකරන ලද අතර, ඒම සැලසුම් සකස් කිරීම සඳහා සියලුම අදාල රාජ්‍ය හා පුද්ගලික ආයතන වල දායකත්වය ලබා දෙන ලදී. එහිදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධානත්වයෙන්, කම්කරු හා රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමාගේ හා ගාල්ල දිස්ත්‍රික් ලේකම්තුමන් ගේ මග පෙන්වීම මත, මෙම වැඩ සටහන ඉතා සාර්ථකව සිදුකරන ලදී .

නිල්ධජ වෙරළ ස්ථාපනයේ මූලික අවශ්‍යතාවය, වන තොරතුරු මධ්‍යස්ථානය ඉදි කිරීම, සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරිම, රථ ගාල් ඉදිකිරිම, ආරක්ෂක කුටි ඉදිකිරිම, ඇතුළු අවශ්‍ය පහසුකම් ස්ථාපනය කිරිමට අදාල සියලු සැලසුම් හා ඇස්තමේන්තු සකස්කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන ලදී. ඒවාට අවශ්‍ය පොදු ඉඩම් සොයා දීම හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යලය හා හබරාදුව ප්‍රාදේශීය සභාව මගින් සිදු කරන ලදී.

තවද 2023 වර්ෂය තුළ පාරිසරික අධ්‍යපනය සඳහා වන පදනමේ නියෝජිතයන් උණවටුන වෙරල තීරය නිරික්ෂණය කර අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ගරු සභාපතිතුමා හා සාමාන්‍යාධිකාරීතුමන් ලා විසින් මෙම නියෝජිත පිරිස සමග උපදේශක පාරිසරික වෙනස් වීම් පිළිබඳ ගරු ජනාධිපති උපදේශක රුවන් විජයවර්ධන මැතිතුමා සමග සාකච්ඡාවක් සිදුකර එම සහයෝගයද ලබා ගන්නා ලදී.

නිල් ධජ වෙරල වැඩසටහනට සමගාමීව පවත්වන ලද සාකච්ඡා හා උණවටුන ක්ෂේත්‍ර නිරීක්ෂණය



උණවටුණ නාන තොටුපොළ දියයට කලාපනය

බෙන්තර නිල්ධජ වැඩසටහන

2023 වර්ෂය තුළ බෙන්තර නිල්ධජ වැඩසටහන යටතේ වෙරළ කළමනාකරණ කමිටුව පිහිට වු අතර නොවැම්බර් මස දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල අතර දැනට එම වෙරළේ කලාපනය හා වෙරළ කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත.

පාසිකුඩා හා අරුගම්බේ නිල්ධජ වෙරළ වැඩසටහන

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මුලිකත්වයෙන් සහ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මුල්‍ය අනුග්‍රහය යටතේ අදාල පාර්ශ්ව ආයතන හා එක්ව, 2023 වර්ෂය තුල, පාසිකුඩා හා අරුගම්බේ වෙරළ තිරයන් නිල්ධජ වෙරලක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ලද අතර ඊට අදාලව වෙරළ කළමනාකරණ කමිටු පිහිටුවීම, කමිටු රැස්වීම් පැවැත්වීම සහ වෙරළ හා සාගර කලාපනය සිදු කරන ලදී .

අරුගම්බේ වෙරළ කළමනාකරණ කමිටු රැස්වීම හා ක්ෂේත්‍ර පරීක්ෂාව



අරුගම්බේ වෙරල හා සාගර කලාපනය

පාසිකුඩා වෙරල හා සාගර කලාපනය

7.4.8 සයුර රකින රැල්ල වැඩසටහන

"සයුර රකින රැල්ල", සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන, ස්වේච්ඡා සංවිධාන සහභාගීත්වයෙන් සිදුකරනු ලබන වැඩසටහනක් වන අතර, මෙහිදී සමුද්‍රය සහ වෙරළබඩ පරිසරය පිළිබඳ තරුණ ප්‍රජාවගේ දැනුම හා ආකල්පය ඉහළ නැංවීම මෙන්ම සමුද්‍රීය පරිසරය ආරක්ෂාව සඳහා නිර්මාණශීලී තරුණ පරපුරක් බිහිකිරීම අරමුණු කරයි.

මෙහිදී අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මගින් ප්‍රදේශයේ තරුණ සංවිධාන හඳුනාගෙන, ඔවුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරමින්, සමුද්‍ර පරිසරය සහ වෙරළ ආරක්ෂණ වැඩසටහන් සඳහා එම සංවිධාන අඛණ්ඩව දායක කර ගැනීම සිදුකරනු ලබයි.

01. හම්බන්තොට දිස්ත්‍රික්කය

කොළඹ විශ්ව විද්‍යාලයේ ලියෝ සමාජයේ සහභාගීත්වයෙන්, මිදිඅත්ත වැල්ල වෙරළ තීරය පිරිසිදු කිරීම

02. මාතර දිස්ත්‍රික්කය

විවිධ රාජ්‍ය නොවන සංවිධානවල සහ ප්‍රජා සහභාගීත්වයෙන් මාතර දිස්ත්‍රික්කයේ පිරිසිදු කිරීමේ වැඩසටහන් 12 ක් පවත්වන ලදී.

03. ගම්පහ දිස්ත්‍රික්කය

විවිධ රාජ්‍ය නොවන සංවිධානවල සහ ප්‍රජා සහභාගීත්වයෙන් ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය විසින් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් 05 ක් පවත්වන ලදී .

04. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

රාජ්‍ය නිලධාරීන්, හමුදාව සහ ප්‍රජාවගේ සහභාගීත්වයෙන් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

05. යාපනය දිස්ත්‍රික්කය

යාපනය දිස්ත්‍රික්කය විසින් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීතාවයෙන් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් 03 ක් පවත්වන ලදී.

7.5. වෙරළ සහ සමුද්‍ර පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කර සංරක්ෂණය කිරීම.

7.5.1 ශ්‍රී ලංකාවේ වෙරළබඩ දිස්ත්‍රික්ක ආශ්‍රිතව කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීම.

කඩොලාන යනු නිශ්පාදිතාවයෙන් ඉහල ඵලදායී පරිසර පද්ධතියකි. ඒවා පඳුරු හෝ කුඩා ගස් විය හැකි අතර මූලික වශයෙන් නිවර්තන සහ උපනිවර්තන අක්ෂාංශ වල ආරක්ෂිත වෙරළබඩ, මෝය සහ ගංගා ආශ්‍රිත ප්‍රදේශ සමඟ අන්තර් උදම් කලාපයේ දක්නට ලැබේ. තවද මේවා වෙරළබඩ කලපු සහ අධි ලිටොරල් කලාපයේ ද දක්නට ලැබේ. කඩොලාන ශාක; ගොඩබිම හා මුහුද අතර අතුරු මුහුණත් දක්නට ලැබෙන අතර දැඩි වඩදිය බාදිය, අධික ලවණතාව, තද සුළං, මඩ සහිත, අධික උෂ්ණත්වය සහ නිර්වායු පස් වැනි කටුක තත්වයන්ට සාර්ථකව මුහුණ දීමට බෙහෙවින් අනුවර්තනය වී ඇත.

කඩොලාන වනාන්තර බොහෝ මත්ස්‍ය විශේෂ, පක්ෂීන්, ක්ෂීරපායින්, උරග ආත්‍රපෝඩාවන් සහ බෙල්ලන් සඳහා ආරක්ෂාව, අභිජනන භූමිය, පෝෂණය සහ ඇති දැඩි කිරීමේ වාසස්ථාන සපයන අතර, දේශීය හා වාණිජ ධීවර කර්මාන්තයට සහ පරිසර සංචාරක අංශයට ද සහාය වේ. අවට වෙරළ සහ කොරල්පර ආරක්ෂා කිරීම, පෝෂක සම්පත් සැපයීම, කාබන් වෙන් කිරීම සහ ගොඩබිම් ස්ථායීකරණය සඳහා කඩොලාන පරිසර පද්ධතිය වැදගත් කාර්යභාරයක් ඉටු කරවයි. කඩොලාන වෘක්ෂලතාදිය ආන්තික කාලගුණික තත්ත්වයන් තුළ අධි ශක්ති තරංග සහ කුණාටු වලට එරෙහිව ජෛව පලිහක් ලෙස ක්‍රියා කරන අතර, එබැවින් වෙරළ තීරයන් සහ ජනාවාස ආරක්ෂා කරයි. තව ද ප්‍රදේශවාසීන් විසින් ආහාර, දැව, ඉන්ධන සහ ඖෂධ සඳහා ද කඩොලාන, සාම්ප්‍රදායිකව භාවිතා කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ කඩොලාන ආසන්න වශයෙන් හෙක්ටයාර 12,000 ක භූමි ප්‍රමාණයක පැතිර පවතින අතර, මෝය සහ කලපු මායිම්වල ආස්තරණය කරයි.තවද හෙක්ටයාරයකට වඩා අඩු පැච් ලෙස හෙක්ටයාර කිහිපයක් දක්වා ද පැතිර පවතී.

පුත්තලම, යාපනය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවල කිවුල් සහිත ජල මූලාශ්‍ර ආශ්‍රිතව ඒවා විශාල වශයෙන් පැතිර පවතී. විවෘත වෙරළ තීරයේ කඩොලාන නොමැත. මක්නිසාද යත්, ගංගා මෝය ආශ්‍රිතව ඩෙල්ටා සෑදිය හැකි අධික අවසාදිත බර ඇති විශාල ගංගාවන් අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ නොමැති බැවිනි. කඩොලාන ඒවායේ කුඩා ප්‍රමාණය සැලකූ විට අධි තක්සේරුවක් සහිත ශාක ප්‍රජාවක් ලෙස දිස්වේ. කෙසේ වෙතත්, මාළු සහ ඉස්සන් සඳහා තවාන් වාසස්ථානයක් ලෙස ඔවුන්ගේ පාරිසරික ක්‍රියාකාරීත්වය ඔවුන්ගේ වැදගත්කම අවධාරණය කරයි. කඩොලාන අහිමි වීම නිසා කඩොලානවල ධීවර ඵලදායිතාව අඩු වේ. තවද, සාගර ඉස්සන් ඔවුන්ගේ ජීවන චක්‍රය සම්පූර්ණ කිරීමද කඩොලාන මෝය වාසස්ථාන මත රඳා පවතී. කඩොලාන ඔවුන්ගේ පාරිසරික කාර්යයට අමතරව, නිවාස ඉදිකිරීම, මත්ස්‍ය එකතු කිරීමේ උපකරණ, මසුන් ඇල්ලීම සඳහා පොලු සහ ආහාර පාන වැනි බොහෝ මිනිස් භාවිතයන් සඳහා ද උපකාරවේ. මුළු කඩොලාන විශේෂ සංඛ්‍යාව සැබෑ කඩොලාන විශේෂ 20-25 අතර වන අතර, එම ප්‍රමාණය හා සමාන ප්‍රමාණයක් කඩොලාන අශ්‍රිත විශේෂ වේ.

කඩොලාන පරිසර පද්ධතියේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් වෙරළබඩ පරිසර පද්ධතිය ස්ථායි කිරීම සඳහා සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් කලුතර, හලාවත, මන්නාරම, කිලිනොච්චිය හා යාපනය යන වෙරළබඩ දිස්ත්‍රික්කවල කඩොලාන ප්‍රතිස්ථාපන වැඩසටහන් සිදු කරන ලදී.

දිස්ත්‍රික්කය	ස්ථානය	පැළ සංඛ්‍යාව	භූමි ප්‍රමාණය (අක්කර)
කළුතර	නව කැලිඩෝ වෙරළ කළුතර දකුණ දුම්රියපල අසල, කළුතර පාලම අතර බිම් කොටස	525	2
හලාවත	හලාවත (අඹකඩවිල/මෙරාවල)	500	1
මන්නාරම	පාරපන්කන්ඩල් R.C.T.M.S	520	0.4
කිලිනොච්චිය	මන්ඩායිකල්ලාරු මෝය	650	1
යාපනය	අල්ලයිපිඩ්ඩි, මණ්ඩායිතිව්	1200	1.75

කළු ගං තොට, Clean Ocean Force, නාවික හමුදාව, පෙර පාසල් දරුවන්, පොලිස් පරිසර ඒකකය ප්‍රීමා අනුග්‍රහය ඇතිව එක්ව කළුතර පාලම අසල සිදුකල කඩොලාන රෝපණය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධීක්ෂණය හා Clean Ocean Force විසින් නඩත්තු කරමින් පවත්වාගෙන යනු ලබන පැල තවාන

හලාවත කඩොලාන ප්‍රතිස්ථාපන වැඩසටහන

මන්නාරම කඩොලාන ප්‍රතිස්ථාපන වැඩසටහන

7.6 සමුද්‍ර පරිසර දූෂණය හා බලපෑම් පිළිබඳ දැනුවත් කිරීම

7.6.1 ජගත් සාගර දිනය 2023

පෘථිවි පෘෂ්ඨයෙන් 71% ක වපසරියක විහි දී ඇති සාගර කළාපය මඟින් මිහිපිට සිටින සියලු ම ජීවීන් වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාව අතිමහත්ය. පෘථිවියේ පෙනහලු ලෙස මෙම සාගර වලට අනුවර්ත නාමයක් යෙදී ඇත්තේ ද එහි වටිනාකම මනාව පිළිඹිබු කරමිනි. මේ නිසාම ඒ වෙනුවෙන් ජගත් සාගර දිනය සැමරීම සෑම වසරක ම ජුනි මස 8 වන දිනට යෙදී ඇත. 2023 වසරේ දී මෙයට සමගාමීව ජගත් සාගර දිනයේ තේමාව වූ "ග්‍රහලෝක සාගරයː වඩදිය බාදිය වෙනස් වෙමින් පවතී" යන්න අරමුණු කර ගනිමින් මහජනතාව දැනුවත් කිරීමේ සහ වෙරළ පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව කළුතර කැලිඩෝ වෙරළ තීරය පවිත්‍රතා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළේය.

එසේම, හලාවත ආරච්චිකට්ටුව වෛරන්කට්ටුව ප්‍රදේශයේ කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩසටහනක් හයිඩ්‍රාමනි ආයතනය හා එක්ව සිදුකරන ලදී.

මේ සඳහා පෞද්ගලික ආයතන මඟින් අනුග්‍රාහක දායකත්වය සැපයූ අතර අප අධිකාරිය ප්‍රධාන සම්බන්ධීකාරක සහ මෙහෙයුම් ක්‍රියාත්මක ආයතනය ලෙස ක්‍රියාකළේය. මීට අමතරව දිස්ත්‍රික් කාර්යාල හා සම්බන්ධීකරණය මඟින් වෙරළ පවිත්‍රතා ඇතුළු වැඩසටහන් පැවැත්වීය.

7.6.2 ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දිනය සහ ජාතික සමුද්‍ර සම්පත් සංරක්ෂණ සතිය 2023

ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දිනය සහ ජාතික සමුද්‍ර සම්පත් සංරක්ෂණ සතිය 2023 සැප්තැම්බර් -17 සිට 24 දක්වා පැවැත්විණි. එය සංවිධානය කරන ලද්දේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) විසිනි. ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දිනය ජාතික වශයෙන් සැමරීම සඳහා වෙරළබඩ දිස්ත්‍රික්ක 14 ආවරණය වන පරිදි MEPA විසින් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. 6725 ක් පමණ සහභාගිත්වයෙන් වෙරළ තීරයේ කිලෝමීටර් 63 ක් පමණ දුරට වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

ප්‍රධාන උත්සවය කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ පෝට් සිටි වෙරළ තීරයේදී පැවැත්විණි. සමාරම්භක වැඩසටහන ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ජාතික ආරක්ෂාව පිළිබඳ සභාපති සාගල රත්නායක, නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. මෙම කණ්ඩායම පසුව වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම් සහ මුහුදු පත්ල පිරිසිදු කිරීම් යටතේ, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, රාජ්‍ය නොවන සංවිධාන සහ සාගර විශ්වවිද්‍යාල සිසුන් 350 ක පමණ සහායක පිරිසකගේ සහභාගීත්වයෙන් සහභාගී විය. මෙම වැඩසටහනේදී කිලෝග්‍රෑම් 437.5ක පමණ කසළ ප්‍රමාණයක් එකතු කරන ලදී.

ශ්‍රී ලංකාව වටා වෙරළ තීරයේ සමුද්‍ර සුන්බුන් සංයුතිය ප්‍රමාණ කිරීම, අපද්‍රව්‍ය රහිත සාගර පරිසරයේ වැදගත්කම පිළිබඳ ව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සහ සමුද්‍ර පරිසරය සංරක්ෂණය පිළිබඳ ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීම, සාගර පරිසරය සංරක්ෂණය සඳහා මහජන සහභාගීත්වය වැඩි දියුණු කිරීම වැඩසටහනේ අරමුණු විය.

මෙවර ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දිනය සහ ජාතික සමුද්‍ර සම්පත් සංරක්ෂණ සතියට අදාළ වැඩසටහන් සියල්ල පුද්ගලික මූලාශ්‍රවලින් අරමුදල් යොදා ගනිමින් සංවිධානය කරන ලදි .

2023 ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දින වැඩසටහනට අනුව ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් වල සාමාන්‍ය බර කිලෝ මීටරයකට කිලෝ ග්‍රෑම් 82.89 kg/km වේ. 2022 ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ දින වැඩසටහනට අනුව එකතු කරන ලද අපද්‍රව්‍ය මුළු ගණන 109257 වේ.

දිවයින පුරා පවත්වන ලද වැඩසටහන් 69 ක් සහ කිලෝමීටර් 63 ක දුරක් වූ වෙරළ තීරයන් පිරිසිදු කරන ලද අතර අපද්‍රව්‍යය වර්ග 46376 ක් එකතු කරන ලදී. එසේම එකතු කරන ලද අපද්‍රව්‍යන්හි බර කිලෝග්‍රෑම් 6725 කි. ශ්‍රී ලංකාවේ එකතු වන අපද්‍රව්‍ය ප්‍රධාන අයිතම 10 වගුවේ දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ බහුලව හමුවන අපද්‍රව්‍ය වර්ග 10

අපද්‍රව්‍ය වර්ගය	එකතුව
බීම බෝතල් (ප්ලාස්ටික්)	6059
ආහාර දවටන	4087
බෝතල් මූඩි (ප්ලාස්ටික්)	3141
බීම බෝතල් (වීදුරු)	2314
ප්ලාස්ටික්	2225
පොලිතීන් බෑග් (ප්ලාස්ටික්)	2207
බීම කෑන්	2009
වීදුරු කැලි	1924
බෝතල් මූඩි (ලෝහ)	1630
සිගරට් කොට	1552

ශ්‍රී ලංකාවේ බහුලව හමුවන අපද්‍රව්‍ය වර්ග 10 හි ප්‍රතිශතය



8. පරිපාලන, නීති, මානව සම්පත් සංවර්ධන, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය අංශ වල සේවය සහ වගකීම

8.1 පරිපාලන අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මෙහෙයුම් ක්‍රියාවලියට අවශ්‍ය අදාළ යටිතල පහසුකම් සම්පාදනය යටතේ ගැනෙන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කටයුතු, ප්‍රවාහන කටයුතු, ගබඩාකරණ කටයුතු, වත්කම් හා සේවා නඩත්තු කටයුතු සහ සෙසු සමාන්‍ය පරිපාලන කටයුතු පරිපාලන අංශය මඟින් සිදුකරන අතර, කළමණාකරු පාලන හා මූල්‍ය විසින් ලබා දෙන මඟ පෙන්වීම යටතේ මෙම අංශය සිය කටයුතු සිදු කරනු ලබයි.

2021 වසරේ දී සිදු වූ MV X-press Pearl නෞකා අනතුර හේතුවෙන් සිදු වූ සහ සිදු වීමට හැකියාව තිබූ පරිසර ව්‍යසනය පාලනය කිරීම හා වැළැක්වීමේ නිරත සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා සෙසු සංවිධානයන්හි නිලධාරීන්ට හා මෙහෙයුම් ක්‍රියාවලියට අදාළ යටිතල පහසුකම් සැපයීම 2021 වසරෙහි සිදු වූ විශේෂ කාර්යය කි.

ඒ අනුව ඒ සඳහා සිදු කරන ලද පහත ප්‍රසම්පාදන කටයුතු පරිපාලන අංශයෙන් සිදු කරන ලදි.

පුද්ගල ආරක්ෂක උපකරණ ,පිරිසිදු කරන උපකරණ හා ඒ ආශ්‍රිත මිළ දී ගැනීම්.

1. ප්‍රවාහන සේවාව (සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සංචිත වාහන හා කුලී පදනම මත ලබා ගත් වාහන මඟින්)
2. නවාතැන් සහ ආශ්‍රිත සේවාවන් ලබා දීම.
3. ගබඩාකරණය ආශ්‍රිත ප්‍රසම්පාදන.

8.2 නීති අංශය

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතට යෝජිත සංශෝධන අන්තර්ගත සංකල්ප පත්‍රිකාව රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අතර රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ උපදෙස් පරිදි, පරික්ෂා කොට සුදුසු උපදෙස් ලබා ගැනිම සඳහා සමුද්‍ර නීතිය පිළිබඳ විද්වත් ත්‍රිපුද්ගල කමිටුවක් වෙත ඉදිරිපත් කරන ලදුව සාකච්ඡාවාර කිහිපයක් පවත්වා සංකල්ප පත්‍රිකාව සකස් කරන ලදී. මේ වන විට යෝජිත සංශෝධන 65 ක් අන්තර්ගත උක්ත සංකල්ප පත්‍රිකාව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු පිණිස රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත යටතේ 2016 වසරේ ප්‍රකාශයට පත් කර ඇති 2016 (අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම්) නියෝග සංශෝධනය සඳහා යෝජිත සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලදි. උක්ත පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති අවශේෂ නියෝග 4 කම අය කිරිමේ ගාස්තු වැඩි කිරිමේ සංශෝධන සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත භාර දි ඇති අතර මේ වන විට වැඩිදුර සංශෝධන සඳහා සාකච්ඡා වෙමින් පවතී.

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 51(2) යටතේ "යම් නැවකින් කරන ලද දූෂක පිට කිරීමක් හේතු කොට ගෙන සිදු වූ යම් අනතුරක් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වමින් සම්පාදිත නව නියෝග නීති කෙටුම්පත් සම්පාදක විසින් භාෂා ත්‍රිත්වයෙන්ම අවසානාත්මක කරන ලදු ව රාජ්‍ය අමාත්‍යාංශය හරහා විෂය භාර කැබිනට් අමාත්‍යවරයා වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත.

2020 සැප්තැම්බර් මස 03 දින "New Diamond" තෙල් නෞකාවෙන් සිදු වූ සමුද්‍ර පරිසර දූෂණයට අදාළව උක්ත පනතේ 26 සහ 38 වගන්ති යටතේ මහාධිකරණයෙන් නැවෙහි නෞකාධිපති වෙත නියම කරන ලද රුපියල් මිලියන 12 ක දඩය රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද හෙයින් 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතෙහි 18 වන වගන්තියේ ප්‍රතිපාදනයන් අනුව මෙම අධිකාරිය වෙත ලබා ගැනිම සඳහා කටයුතු කරන ලදී.

MT New Diamond නෞකාවෙන් දිවයිනේ සමුද්‍ර පරිසරයට සිදු වූ පාරිසරික හානිය ගණනය කරමින් මෙම අධිකාරිය විසින් පත් කරන ලද විද්වත් කමිටුව විසින් සම්පාදනය කරන ලද හානි ඇස්තමේන්තු මත පදනම්ව වන්දි ඉල්ලා සිටීමේ ලේඛන සහිත මෙම අධිකාරියේ පැමිණිල්ල, ගරු නීතිපතිතුමා විසින් එම නෞකා සමාගම ඇතුළු විත්තිකරුවන් 5 දෙනෙකුට එරෙහි ව මෙම වසරේ සැප්තැම්බර් මස දී කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කරන ලදී.

2021 වසරේ මැයි මාසයේදී MV X-Press Pearl නෞකාවෙන් දිවයිනේ සමුද්‍ර කළාපයට සිදු වූ පාරිසරික හානියට අදාළ ව පනතේ 26 වගන්තිය (අපරාධ වගකීම) යටතේ නෞකාවේ නෞකාධිපති සහ දේශීය ඒජන්ත වන Sea Consortium Pvt. Limited ආයතනය සහ එම අධ්‍යක්ෂ මණ්ඩලය චූදිතයන් කරමින් ගරු නීතිපතිතුමා විසින් නොවැම්බර් මස දී කොළඹ මහාධිකරණයේ අධි චෝදනා පත්‍ර ගොනු කරන ලදී.

2022 මැයි මස සිදු වූ MV X-Press Pearl නෞකාවෙන් සිදු වූ සමුද්‍ර පරිසර හානියට අදාළ ව විවිධ පාර්ශවයන් විසින් මෙම අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් කඩවීමේ හා තහනම් නියෝග ඉල්ලුම් කර ඇති පෙත්සම් සම්බන්ධයෙන් මෙම අධිකාරියේ නිරීක්ෂණ නීතිපති වෙත භාර දීමට කටයුතු කරන ලද අතර නඩුව කැඳවන සෑම අවස්ථාවකදී ම නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටිමින් ලබා දෙනු ලබන නියෝගයන් අනුව කටයුතු කරනු ලැබේ.

තංගල්ල කහඳමෝදර හෝටලය රත්න 2012 හෝටලයෙන් සිදු වන සමුද්‍ර දූෂණය සම්බන්ධයෙන් අධිකාරිය විසින් නඩුකරය සුදුසු මහාධිකරණයක පවරා පවත්වා ගෙන යාමට අවශ්‍යය බව නීතිපතිතුමා වෙත දැනුම් දෙන ලද අතර ඒ අනුව තංගල්ල මහාධිකරණයේ අදාළ නඩුව පවරන ලදී. කෙසේ වුවද එකී නඩුවෙහි විත්තිකරුවන් විසින් කොළඹ අභියාචනාධිකරණයෙහි තහනම් ආඥාවක් සඳහා පෙත්සමක් ගොනු කරන ලද හෙයින් එම අභියාචනාධිකරණ නඩුව විභාග කොට අවසන් වන තුරු තංගල්ල මහාධිකරණයේ පවරන ලද නඩුව බහා තබා ඇත.(laid by)

මෙම අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද 2016 අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් නියෝග බණ්ඩනය හේතුවෙන් Sea Consortium Pvt. Ltd සමාගමට එරෙහිව පවරන ලද නඩුවෙහි නඩු විභාගය කොළඹ මහාධිකරණයෙහි පවත්වා ගෙන යනු ලැබේ.

මෙම අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද 2013 සමුද්‍රීය පාරිසරික ආරක්ෂණ(මුහුදට ඉවත දැමීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරිමේ)නියෝග වලට අදාළ ව වැලිගම "මැරියට් රිසෝට්" මඟින් සිදු වන සමුද්‍ර පරිසර දූෂණය සම්බන්ධයෙන් නීතිපති උපදෙස් පරිදි රජයේ රස පරීක්ෂක මඟින් විමර්ෂණය කොට වාර්තා ලබා ගෙන ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කරන ලදි. කොග්ගල ශ්‍රී ලංකා අපනයන මණ්ඩලය (BOI) හා Happy Cook PVT limited නමැති මසුන් ටින් කිරීමේ කර්මාන්ත ශාලාවකින් බැහැර වන අප ජලය නිසි පරිදි බැහැර කිරීමට අදාළ ව නීතිමය පියවර ගැනීම සම්බන්ධයෙන් නීතිපති සමග සාකච්ඡා පවත්වා ඒ සඳහා අවශ්‍ය තොරතුරු

සහ ලේඛන ලබා දීමට කටයුතු කරන ලදී.

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතෙහි 11 වන වගන්තිය එනම්, 'නැවක් රඳවා තැබීම' සම්බන්ධ බලතල මුල් වරට බලාත්මක කරමින් 2021 වසරේ දී "Vishva Ekta" නෞකාවෙන් හම්බන්තොට වරාය ආශ්‍රිත ව සිදු වූ සමුද්‍ර පරිසර දූෂණය සම්බන්ධයෙන් අදාළ නැව් සමාගමෙන් මිලියන 15ක දඩයක් ලබා ගැනීමට කටයුතු කරන ලදි.එසේ ම එම වගන්තිය යටතේ එම වසරේ දී ම "Vinalynnes Brave" නෞකාවෙන් කොළඹ වරාය තුළ සිදුවූ සමුද්‍ර පරිසර දූෂණය සම්බන්ධයෙන් ද මිලියන 15ක දඩයක් ලබා ගැනීමට කටයුතු කරන ලදි. උක්ත 11 වගන්තිය නැවත වරක් බලාත්මක කරමින් MV X-PRESS HOOGLY නෞකාවෙන් 2022 ජූලි මාසයේ දී සිදු වූ ඉන්ධන තෙල් විසිරීම සම්බන්ධයෙන් ද මෙම අධිකාරිය වෙත රු. මිලියන 15 ක දඩයක් ලබා ගැනීමට කටයුතු කරන ලදි.

ත්‍රිකුණාමලය මඩකොච් ජැටිය හිදී ELS කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් සහ GAC ෂිපිං ලිමිටඩ් යන ආයතන දෙක, පිළිවෙලින් මාර්පෝල් ඩී එල් 01 දරන බත්හලෙහි අයිතිකරු සහ ඒජන්ත වශයෙන් සිටිය දි හානිකර ද්‍රව්‍යයක් එනම්, කලුතෙල් නැමැති හානි කර ද්‍රව්‍ය ලංකාවට අයත් සමුද්‍රිය තලයට පිට කරනු ලැබීමෙන් 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 26 වන වගන්තිය යටතේ ත්‍රිකුණාමලය මහාධිකරණයේ පවරා ඇති නඩුව විභාග වෙමින් පවති.

මෙම අධිකාරියේ සේවා නියුක්තකයෙකු වූ එල්.පී.ටයිටස් මහතා අධිකාරිය විසින් 2019 වසරේ දී තම සේවය අවසන් කිරීම අසාධාරණ බව සඳහන් කරමින් තමාව සේවයේ නැවත පිහිටුවීම සහ වන්දි මුදල් ද ඉල්ලා සිටිමින් කොළඹ කම්කරු විනිශ්චයාධිකාරි විසින් නඩුවක් පවරන ලද අතර කම්කරු විනිශ්චයාධිකාර විසින් නඩු විභාගය අවසානයේ දී තීන්දුව දෙමින් ඔහුගේ ඉල්ලීම ඉවත දමන ලදි.අධිකාරියේ වාසියට මෙම තීන්දුව ලබා දෙන ලද්දේ 2021 ජූලි 01 දින ය.කෙසේ වෙතත් මෙම නිළධාරියා විසින් අධිකාරියට ගෙවිය යුතු මුදල් මේ වන විටත් ගෙවා නොමැති හෙයින් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනිම සඳහා අවශ්‍ය වන ලේඛන,අධිකාරියේ නීති අංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සකස් කරමින් පවති.

8.3 අභ්‍යන්තර විගණන අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අරමුණ හා කර්තව්‍යය ඉලක්ක කරගෙන ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාලයන්හි මූල්‍ය හා භෞතික කටයුතු සියල්ල පරිපාලනය ධනාත්මක සංවර්ධනය ඔස්සේ යහපාලනයෙන් හා විනිවිධභාවයෙන් යුතුව පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂණ, නිරීක්ෂණ, විමසීම් තුලින් එලඹෙන නිගමන මත අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම උදෙසා ඉහළ කළමනාකරණය වෙත වාර්තා කිරීම අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය වේ.

තාක්ෂණික, පාලන, මානව සම්පත් සංවර්ධන, සැලසුම්, නීති හා ගිණුම් යන අධිකාරියේ ප්‍රධාන අංශයන්ගේ රාජකාරී කටයුතු ක්‍රමයෙන් පුළුල් වෙත්ම අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයද ක්‍රමයෙන් පුළුල් වී ඇත. අධිකාරිය විසින් සමුද්‍ර දූෂණය වැලැක්වීම, පාලනය කිරීම සඳහා සිය පනතේ බලතල සැලසුම් සහගතව විවිධ ව්‍යාපෘති ඔස්සේ ක්‍රියාත්මක කර ඇති අතර, ඒ හරහා අධිකාරියේ ආදායම ඉහළ නැංවීමට ක්‍රියාකරමින් පවතී. අධිකාරියේ මූල්‍ය හා භෞතික ක්‍රියාකාරකම් ඉහළ යත්ම අභ්‍යන්තර විගණන අංශයට පැවරෙන්නේ ඉතා සුවිශේෂි කාර්යභාරයකි.

අධිකාරියේ සභාපතිගේ සෘජු අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇත. වාර්ෂිකව පිළියෙල කරන අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහනට අනුව විගණන රාජකාරි සිදුකරන අතර, අධිකාරියේ පවතින තාක්ෂණික, පාලන, මානව සම්පත් සංවර්ධන, සැලසුම්, නීති, ගිණුම් යන අංශයන් සහ සියළුම ප්‍රාදේශීය කාර්යාල විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව සිදු කරන රාජකාරීවල ඵලදායීතාවය සම්බන්ධයෙන් විගණන පරීක්ෂණ පවත්වනු ලැබේ. එම පරික්ෂණ මත පදනම්ව එළඹෙන නිරීක්ෂණ හා යෝජනා ඇතුලත්ව සකස් කරන අභ්‍යන්තර විගණන වාර්තා අධිකාරියේ සභාපතිගේ අවධානයට සහ නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

එහිදී පහත සඳහන් කරුණු පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු කරනු ලැබේ.

1. වැරදි හා වංචා වැළැක්වීම සඳහා ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් ද යන්න විමර්ශනය කිරීම.
2. අවදානම් කළමනාකරණ තත්වයක් පවතින කලාපයන් හඳුනාගැනීම සහ ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීම.
3. අධිකාරියේ මූල්‍ය කටයුතු රාජ්‍ය මුදල් රෙගුලාසි ප්‍රකාරව සත්‍ය හා සාධාරණව සිදුවන්නේද යන්න සොයා බැලීම හා ඒ සඳහා ස්ථාපිත කර ඇති අභ්‍යන්තර මූල්‍ය පාලන ක්‍රමය පිළිබඳව විමර්ශනය කිරීම.
4. අධිකාරියේ කාර්යමණ්ඩලය වෙත පවරා ඇති රාජකාරී හා අදාල වගකීම කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරන්නේද යන්න සුපරීක්ෂණය.
5. අධිකාරිය විසින් සැලසුම් කල පරිදි මෙහෙයුම් හා කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය කරන ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම හා ඵලදායීව එය භාවිතා කරන්නේද යන්න පරීක්ෂාව.
6. රාජ්‍ය ප්‍රතිපත්ති, නීතිරීති, මුදල් රෙගුලාසි හා අධිකාරිය විසින් වරින් වර පනවනු ලබන අභ්‍යන්තර චක්‍රලේඛ අණපනත් වලට අනුකූලව ක්‍රියා කරන්නේද යන්න පරීක්ෂාව.
7. අවශ්‍ය අවස්ථාවලදී හදිසි ස්ථානීය විමර්ශන පැවැත්වීම.
8. අධිකාරියේ අභ්‍යන්තර පාලන පද්ධතියේ හඳුනාගත් දුර්වලතාවයන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම.
9. අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් කළමනාකරණ විගණනයට අමතරව මූල්‍ය විගණනයද සිදු කිරීම.
10. 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත අනුව අධිකාරියට අයත් වෙරළ කලාපයන් තුළ පවතින සමුද්‍ර දූෂණ සිදුවීම් සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයක් සිදුකිරීම හා ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කිරීම.
11. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශනාත්මක කමිටුවක් වශයෙන් පිහිටුවා ඇති විගණන හා කළමනාකරණ කමිටුවේ කැඳවුම්කරු වශයෙන් අභ්‍යන්තර විගණක නිලබලයෙන් පත්වන අතර සියළුම විගණන විමසුම්, විගණන වාර්තා, විමර්ශන වාර්තා සහ අනෙකුත් අදාල වාර්තා මෙම කමිටුවට ඉදිරිපත් කිරීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශය විසින් අධිකාරියේ අභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රධාන කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා සැමවිටම තොරතුරු වාර්තාකරණයක් සිදු කරයි.

8.4 මානව සම්පත් සංවර්ධන අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජික මහත්ම මහත්මීන් පුහුණු කිරීම තුළින් ඔවුන්ගේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ වගකීම වන අතර අධිකාරියේ ප්‍රධාන විධායක නිළධාරී වන සාමාන්‍යාධිකාරවරයාගේ සියලු මගපෙන්වීම යටතේ මෙම අංශය කටයුතු කරනු ලබයි.

අංශයේ වගකීම්

1. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම සඳහා වන පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා සම්පත් දායකයින් හඳුනා ගැනිමින් දේශීය/ විදේශීය පුහුණු සැලසුම් සකස් කිරීම හා කාර්ය මණ්ඩල සාමාජිකයන් එකී පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.
2. පුහුණු වීම ලබන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නිසි පරිදි පුහුණුවීම් ලබා ගන්නේද එසේ නොමැති නම් එහි අඩුපාඩු තිබේද යන්න පසුවිපරම් කිරීම සහ අඩුපාඩු මග හරවා ගැනීමට අදාල ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
3. කාර්ය මණ්ඩලයේ වාර්ෂික ප්‍රගති වාර්තා ඇගයීම.
4. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම,සේවක ශ්‍රේණිගත කිරීම හා උසස් කිරීම හා සේවක ස්ථාන මාරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
5. සේවක මණ්ඩල හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය හා සෙසු බාහිර පාර්ශවයන් විසින් ඉල්ලා ඇති තොරතුරු සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතියට යටත්ව යොමු කිරීම.
6. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ නිවාඩු ලිපිගොනු නඩත්තු කිරීම.
7. සේවක සුබසාධන කටයුතු.

සේවක හැකියාවන්

අධිකාරියේ අරමුණු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කර ගැනීමේ අරමුණින් අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලයට 2023 වර්ෂයේදී පහත සඳහන් පුහුණුවීම් ලබා දෙන ලදී.



8.5 සැලසුම් අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සැලසුම් අංශය 2016 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදි. "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති අනුකූලව ආයතනික කාර්යයන් හා කරතව්‍යයන් පිළිබඳ ගැසට් අංක 2235/45 හි පවරා ඇති වගකීම් ඉටු කිරීමේ අරමුණ පෙරදැරිව හා තිරසාර සංවර්ධන ඉලක්ක 14 ළඟා කර ගැනිමසඳහා 2008 අංක 35 දරණ සමුද්‍රීය දූෂණය වැළැක්වීමේ පනත බලතල ප්‍රකාරව පහත සඳහන් ඉලක්ක නවය යටතේ 2022-2025 උපාය මාර්ගික සැලැස්ම සකස් කර ඊට සමගාමී ව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම කිරීම, ප්‍රගතිය පරික්ෂා කිරීම හා ප්‍රගතිය අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම සැලසුම් අංශය විසින් ඉටු කරන ප්‍රධාන කාර්ය භාරය වේ.

1 'නැව් මඟින් සිදුවන සාගර දූෂණය අවම කිරීම සඳහා යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම'

2. කාර්යක්ෂම හා සඵලදායිව ජාතික තෙල් හා රසායනික විසිරිමේ දී ක්‍රියාත්මක හදිසි සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

3. ගොඩ බිම ආශ්‍රිත කටයුතු මඟින් සිදු වන සාගර දූෂණය අවම කිරීම සඳහා යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම.

4. වෙරළ සහ සමුද්‍ර පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කර සංරක්ෂණය කිරීම.

5. නව අභියෝගයන්ට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර නීතිමය මෙවලම් පිළිපැදීම සඳහා නීති රාමුවක් ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම.

6. මහජනතාව දැනුවත් කිරීම තුළින් පරිසරය සංවේදී ප්‍රජාවක් ඇති කිරීම.

7. පුරවැසි කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා අධිකාරියේ ධාරිතාව වර්ධනය කිරීම.

8. නීල ආර්ථිකය සහ සමුද්‍ර සම්පත් කළමනාකරණයේ කේන්ද්‍රස්ථානය විම.

9. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ධාරිතාව වර්ධනය කිරීම.

පහත සඳහන් ඉදිරි ඉලක්ක ළඟා කර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු අධිකාරිය විසින් සිදු කිරීමට නියමිත ය.

- සමුද්‍ර සම්පත් කළමණාකරණය හා නීල ආර්ථිකය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ඇතුළත් කරමින් සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම.
- හඳුනාගත් අන්තර්ජාතික සම්මුතීන් හා ප්‍රඥප්තීන් 9 ක් සඳහා අනුගත විම හා දේශීය නීති පද්ධතියට ඇතුළත් කිරීම.
- නැව් මඟින් සිදු වන තෙල් දූෂණයක දී ක්‍රියා කිරීම සඳහා වූ ජාතික හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාවට නැගීම සඳහා නෞකා වලට පනවන බද්දක් මඟින් වූ අරමුදල් පිහිටු විම.
- සයුර රකින රැල්ල ස්වෙච්ඡා ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අරමුදල් පිහිටු විම.
- සමස්ත වෙරළ කළාපය ම අවරණය වන පරිදි පාරිසරික සංවේදීතා දර්ශකය සිතියම් සැකසීම.(ඊ.එස්.අයි)
- කොරල්පර හා කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීම.
- Glo-Litter, Green voyage, Glo-Fouling ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- තත්‍ය කාලීන සමුද්‍රිය දූෂණ සිද්ධි අධීක්ෂණය සඳහා මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් විමර්ශනයට -CLS (France) සහයෝගිතාව ලබා ගැනිම.

8.6 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගති වාර්තාව - පුනරාවර්තන වියදම්

වැය විෂය කේත අංකතය	වැය විෂය පිළිබඳ විස්තරය	2023වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුදල(රු.)	2023.12.31 දිනට තත්‍ය වියදම (රු.)	ශේෂය (රු.)
	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම			
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	500,000	-	500,000
2002	පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	1,000,000	67,092	932,908
2003	වාහන	3,000,000	3,540,085	(540,085)
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම			
2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	-	-	-
2103	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	2,500,000	267,900	2,232,100
2401	පුහුණුව සහ ධාරිතා වර්ධනය (HRD)	1,000,000	202,297	797,703
2502	**අනෙකුත් ප්‍රාග්ධන වියදම්**			
	1. යාත්‍රා පාදක සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා වැඩිදියුණු කළ පාලන යාන්ත්‍රණය	6,843,000	784,569	6,058,431
	2. කාර්යක්ෂම හා ඵලදායී ජාතික තෙල් හා රසායනික ද්‍රව්‍ය කාන්දුවීම් පිළිබඳ හදිසි සැලැස්ම ක්‍රියාත්මක කිරීම	1,819,389	379,050	1,440,339
	3. ගොඩබිම පාදක සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා වැඩිදියුණු කළ පාලන යාන්ත්‍රණය	3,705,601	6,699,717	(2,994,116)
	4. වෙරළබඩ සහ සමුද්‍ර පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය සහ සංරක්ෂණය	518,770	602,064	(83,294)
	5. නව අභියෝගවලට මුහුණ දීම සඳහා සහ ජාත්‍යන්තර නීති පද්ධති පිළිපැදීමට නීතිමය රාමුව ස්ථාපිත කර ශක්තිමත් කිරීම			
	6. මහජන දැනුවත් කිරීම මඟින් පරිසර සංවේදී ප්‍රජාවක් ස්ථාපිත කිරීම	953,701	1,509,434	(555,733)
	7. පුරවැසි කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍ය සේවාවන් සැපයීම සඳහා ස.ප.ආ. අධිකාරියෙහි සබ්‍යතාවය වැඩි කිරීම	100,000		100,000
	8. නීල ආර්ථික සහ සමුද්‍ර සම්පත් කළමනාකරණයේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම	2,906,731		2,906,731
	9. සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ ධාරිතාවය වැඩි දියුණු කිරීම	6,608,246		6,608,246
	10. රසායනාගාර පහසුකම් සහ වාණිජ සේවා වැඩිදියුණු කිරීම		873,228	(873,228)
	11. කෙරීගෙන යන වැඩ		1,762,799	(1,762,799)
	මුළු ප්‍රාග්ධන වියදම	**31,455,438**	**16,688,235**	**14,767,203**

9. අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන

9.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

9.1.1 ආයතනික තොරතුරු

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ස්ථාපිත කර ඇත. මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයේ ස්ථාපිත කර ඇත.

9.1.2 අධිකාරියෙ ප්‍රමුඛ කාර්යභාරය හා මෙහෙයුම්වල ස්වභාවය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූලික කාර්යභාරය වනුයේ නියෝගයන් ඵලදායීව බලාත්මක කරීම, අදාළ වන ජාත්‍යනතර සම්මුතිවල විධිවිධාන ක්‍රියාවට නැංවීම, පාර්ශවකරුවන් හා සම්පත් සම්බන්ධීකරණය හා ස්ථානගත කිරීම තුළින් වර්තමානය හා අනාගතය සඳහා සමුද්‍රීය පරිසරය තිරසර ලෙස කළමනාකරණය කිරීම පිණිස ශ්‍රී ලංකා සමුද්‍ර තීරයන්හි සමුද්‍ර දූෂණය වැලැක්වීම, පාලනය කිරීම හා කළමනාකරණය කිරීමයි.

9.1.3. මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ පදනම

9.1.3.1 අනුකූලතා ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරකෂණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කොට ඇත.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ට අනුව ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය අංශ ප්‍රමිත නිකුත්කොට කොට නොමැති අවස්ථාවලදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම භාවිතා කර ඇත.

9.1.3.2. මූල්‍ය ප්‍රකාශන

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකරියේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්ම සහ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙළ කර ඇත.

9.1.3.3. උද්ධමන සාධක

ගිණුම් කෙරෙහි බලපාන උද්ධමන සාධකය සඳහා ගැලපීම් සිදු කර නොමැත.

9.1.3.4. ආදායම්

ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

9.1.3.5. වියදම්

වියදම් හඳුනාගනු ලබන්නේ, දරන ලද වියදම සහ නිශ්චිත ආදායම් අයිතමවල ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවයක් මත ලාභ හෝ අලාභයේය. මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ආදායමට අය කරනු ලැබේ.

9.1.3.6 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

බොහෝ සේවාවන් මුදල් පදනම මත සපයනු ලබන අතර, ලැබිය යුතු දෑ මත පොලී අය නොකෙරේ. එක් එක් වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානයේ, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල ධාරණ අගය සමාලෝචනය කරනු ලබන අතර එසේ කරනුයේ එම මුදල් අයකර ගත නොහැකි බවට කිසියම් වාස්ථවික සාක්ෂියක් තිබේද යන්න තීරණය කිරීම සඳහාය. එවැන්නක් වේනම්, හානිකරණ අලාභය වහාම ලාභ හෝ අලාභයේ හඳුනාගනු ලැබේ.

9.1.3.7. වගකීම්

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් පවතින විට සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් පිටතට ගලායාමකට හේතු වනු ඇතැයි අපේක්ෂා කරන විට වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

9.1.3.8. ගෙවිය යුතු වෙළඳ භාණ්ඩ

ගෙවිය යුතු වෙළඳ භාණ්ඩ සාමාන්‍ය ණය කොන්දේසි මත පදනම් වූ බැඳීම් වන අතර ඒ සඳහා පොලී අය නොකෙරේ. ණයහිමියන්ගේ ඉල්ලීම මත හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ.

9.1.3.9. ජංගම නොවන වගකීම්

ණයහිමියන්ගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයෙන් වසරකට වැඩි කාලයක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දී ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

9.1.3.10. නැවත ගෙවීමේ වගකීම්

නැවත ගෙවීමේ වගකීම යනු පාරිභෝගිකයාගෙන් ලැබූ (හෝ ලැබිය යුතු) මුදලකින් කොටසක් හෝ සියල්ල ආපසු ගෙවීමට ඇති බැඳීමක් වන අතර සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය අවසානයේ පාරිභෝගිකයාට ආපසු ලබා දීමට අපේක්ෂා කරන මුදලින් එය මනිනු ලැබේ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයකම අවසානයේ ආපසු ගෙවීමේ වගකීම් (සහ ගනුදෙනු මිලෙහි අනුරූප වෙනස) පිළිබඳ එහි ඇස්තමේන්තු යාවත්කාලීන කරයි .

9.1.4. දේපළ, පිරියත සහ උපකරණ

9.1.4.1. දේපළ, පිරියත සහ උපකරණ

අධිකාරිය, සේවා සැපයීමේදී හෝ පරිපාලන කටයුතු සඳහා භාවිතා කිරීම සඳහා සහ වසරකට වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කරන එහි හිමිකාරීත්වයේ ඇති වත්කම් ගිණුම්කරණයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 " දේපල, පිරියත සහ උපකරණ" හි නියමයන් අදාළ කරයි.

9.1.4.2 හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරිය වෙත ගලා ඒමට බොහෝ දුරට ඉඩ ඇති අතරම වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් එවිට දේපල, පිරියත සහ උපකරණ හඳුනාගනු ලැබේ.

9.1.4.3 මිනුම් කිරීමේ පදනම

සිදුවෙමින් පවතින ඉදිකිරීම් ඇතුළුව දේපළ, පිරියත සහ උපකරණ අයිතම, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ තිබේ නම් ඒවා අඩුකරන ලද ශුද්ධ පිරිවැය අනුව මනිනු ලබන අතර ඉඩම් පිරිවැයට මනිනු ලැබේ.

9.1.4.4 පසුකාලීන වියදම්

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමට ඉඩ තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, අයිතමයේ ධාරණ අගයට හඳුනා ගැනේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ අගය පහත දක්වා ඇති හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව හඳුනා ගැනීමෙන් ඉවත් කෙරේ.

දේපල, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීමේ සහ නඩත්තු කිරීමේ පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැරූ පිරිවැයක් ලෙස හඳුනා ගනු ලැබේ.

9.1.4.5 හඳුනා ගැනීම ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැරකිරීමේදී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට එහි ධාරණ අගය හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. හඳුනා ගැනීම ඉවත් කිරීමෙන් ලැබෙන කිසියම් ලාභ සහ පාඩු (ශුද්ධ විකිණීමේ ආදායම සහ වත්කමේ ධාරණ අගයේ වෙනස ලෙස ගණනය කරන ලද) ලාභ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. ලාභ ආදායමක් ලෙස වර්ගීකරණය නොකෙරේ.

9.1.4.6 ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අනුව සරල මාර්ග පදනමක් මත පහත පරිදි ගණනය කරනු ලැබේ:

වත්කම්	ක්ෂය අනුපාතය
මෝටර් රථ	20%
පරිගණක සහ ඒ ආශ්‍රිත උපකරණ	15%
කාර්යාලීය උපකරණ	15%
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	10%
රසායනාගාර උපකරණ සහ අනෙකුත් තාක්ෂණික උපකරණ	10%
අස්පෘශ්‍ය වත්කම්	10%
ප්‍රදර්ශන අයිතම	20%
පොත්	10%
ගොඩනැගිලි	5%

වත්කමක් භාවිතයට ලබා ගත හැකි වූ අවස්ථාවේ එහි ක්ෂයවීම ආරම්භ වන අතර, වත්කම විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කරන හෝ හඳුනා ගැනීම ඉවත් කරන යන දිනයන්ගෙන් මුලින් යෙදෙන දිනයේදී ක්ෂයවීම් අවසන් වේ. වත්කමේ අවශේෂ අගයන් සහ ප්‍රයෝජනවත් ආයු කාලය සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කර, උචිත නම් ගැළපීම් සිදුකරනු ලැබේ.

9.1.5. අස්පෘශ්‍ය වත්කම්

9.1.5.1 හඳුනාගැනීමේ පදනම

මෙය භෞතික ද්‍රව්‍යයක් නොමැති හඳුනාගත හැකි මුදල්මය නොවන වත්කමකි. ආයතනය විසින් පාලනය කරනු ලබන වත්කමක් යනු අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කරන සම්පතකි. වත්කම් සමග සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒම සිදුවිය හැකි නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ.

9.1.5.2 මිනුම් කිරීමේ පදනම

වෙන වෙනම අත්පත් කරගත් අස්පෘෂ්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී පිරිවැය මත මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසු, අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කළ පිරිවැය මත ගෙන යනු ලැබේ. ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තරව උත්පාදනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය නොකරන අතර, අදාළ වියදම එම වියදම දැරූ වර්ෂයේ ලාභ අලාභ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

9.1.5.3 ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලය සහ ක්‍රමක්ෂය

අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සීමිත හෝ අසීමිත ලෙස තක්සේරු කරනු ලැබේ. සීමිත ජීවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර, අස්පෘෂ්‍ය වත්කම හානි විය හැකි බවට ඇඟවීමක් ඇති විටෙක හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ. අසීමිත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කමක ක්‍රමක්ෂය කරනු ලබන කාලය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමවේදය අවම වශයෙන් සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ අපේක්ෂිත පරිභෝජන රටාවෙහි වෙනස්වීම්, සුදුසු පරිදි, ක්‍රමක්ෂය කාලය හෝ ක්‍රමය වෙනස් කිරීම සඳහා සලකා බලනු ලබන අතර, එය ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස සලකනු ලැබේ. සීමිත ජීවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම, අස්පෘෂ්‍ය වත්කම්වල කාර්යයට අනුකූල වන වියදම් කාණ්ඩයේ ලාභ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

9.1.5.4 අස්පෘෂ්‍ය වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කිරීම

අස්පෘෂ්‍ය වත්කම් අපහරණයේදී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනාගැනීමෙන් ඉවත් කරනු ලැබේ. අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගැනීම ඉවත් කිරීමෙන් ඇතිවන ලාභ හෝ පාඩු, ශුද්ධ අපහරණ ආදායම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස මනිනු ලබන අතර, වත්කම හඳුනාගැනීම ඉවත් කරන විට ලාභ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

9.1.5.5 පර්යේෂණ සහ සංවර්ධන.

අධිකාරියට පහත කරුණු පෙන්නුම් කළ හැකි විට, තනි ව්‍යාපෘතියක් සඳහා දරන ලද සංවර්ධන වියදම් අස්පෘෂ්‍ය වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ:

1. භාවිතයට හෝ විකිණීම සඳහා ලබා ගත හැකි වන පරිදි අස්පෘෂ්‍ය වත්කම සම්පූර්ණ කිරීමේ තාක්ෂණික ශක්‍යතාව.
2. එය සම්පූර්ණ කිරීමට ඇති අභිප්‍රාය සහ වත්කම භාවිතා කිරීමට හෝ විකිණීමට ඇති එහි හැකියාව සහ අභිප්‍රාය.
3. වත්කම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන්නේ කෙසේද යන්න.
4. වත්කම සම්පූර්ණ කිරීමට අවශ්‍ය සම්පත් පවතින බව.
5. සංවර්ධන කාලය තුළ වියදම විශ්වාසනීයව මැනීමේ හැකියාව.

වත්කමක් ලෙස සංවර්ධන වියදම් මූලිකව හඳුනා ගැනීමෙන් පසු, වත්කම සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කළ පිරිවැය මත ගෙන යනු ලැබේ. සංවර්ධනය සම්පූර්ණවී වත්කම භාවිතය සඳහා ලබා ගත හැකි වූ විට වත්කමේ ක්‍රමක්ෂය ආරම්භ වේ. එය අපේක්ෂිත ප්‍රතිලාභ කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. සංවර්ධන කාලය තුළ හානි පිළිබඳ සලකුණු තිබේ නම්, වත්කම වාර්ෂිකව හානි සඳහා පරීක්ෂා කරනු ලැබේ.

9.1.5.6 පර්යේෂණ පිරිවැය

සියලු පර්යේෂණ වියදම් වියදම්වලට ගණනය කෙරේ

9.1.5.7 ක්‍රමක්ෂය

අස්පෘෂ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල මාර්ග පදනමක් මත ලාභ හෝ අලාභ තුළ ක්‍රමක්ෂය හඳුනාගනු ලැබේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත පරිදි වේ.

විස්තරය	කාලය
පරිගණක මෘදුකාංග	අවුරුදු 10 යි

9.1.6. ගබඩා භාණ්ඩ තක්සේරු කිරීම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යල් පැන ගිය ගබඩා භාණ්ඩ සම්බන්ධයෙන් හානිකරණය තීරණය කිරීමේදී විනිශ්චය අනුගමනය කර ඇත. එවැනි ගබඩා භාණ්ඩ සම්බන්ධයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි හානි තක්සේරුව, ගබඩා භාණ්ඩ අයිතමවල කාලය, කල් ඉකුත් වීමේ දිනයන් සහ ගබඩා භාණ්ඩ භාවිතා කරන ආකාරය සම්බන්ධ අපේක්ෂාවන් වැනි සාධක සැලකිල්ලට ගනී. ගබඩා භාණ්ඩ ශුද්ධ උපලබ්ධි අගය තීරණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් ද විනිශ්චය යොදා ඇත. ශුද්ධ උපලබ්ධි අගය තීරණය කිරීමේදී ඇස්තමේන්තු සහ විනිශ්චයන් යොදාගනී.

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට මාරු කරන වර්ෂය තුළ භාවිතා කරන ගබඩා භාණ්ඩ ඒවායේ පිරිවැය මත පදනම් වේ. වසර අවසානයේ ඉතිරි තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකින් අඩු අගයකට තක්සේරු කරනු ලැබේ.

9.1.7 පුස්තකාල පොත්.

පුස්තකාල පොත් ඒවායේ පිරිවැය මත වාර්තා කර ඇත. ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ඒවායේ පිරිවැය කපා හැරීම සඳහා සරල මාර්ග පදනමක් මත ක්ෂය කිරීම් සිදු කර ඇත.

9.1.8 රසායනික ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ තොග

රසායනික ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ සම්බන්ධයෙන්, අධිකාරිය විසින් අනුගමනය කරන ප්‍රතිපත්තිය වන්නේ ගනුදෙනුව සිදු වූ වර්ෂයේදී රසායනික ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩවල මුළු මිලදී ගැනීමේ පිරිවැය ලාභ සහ අලාභයට අය කිරීමයි.

වසර අවසානයේ රසායනික ද්‍රව්‍යවල නිශ්චිත ප්‍රමාණය ගණනය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා සහ කෙටි කාලයක් තුළ ඇතැම් වීදුරු භාණ්ඩ ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වීම හේතුවෙන් මෙම ක්‍රමය අනුගමනය කර ඇත. කෙසේ වෙතත්, වාර්තා කිරීමේ කාර්යය සඳහා රසායනික ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ යන අයිතම දෙක සඳහාම රසායනාගාරය තොග ලෙජර පවත්වාගෙන යයි.

9.2 ආදායම

අධිකාරියේ ප්‍රධාන ආදායම වනුයේ ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන ප්‍රදානයන්ය. ඊට අමතරව, බලපත්‍ර නිකුත් කිරීමෙන් අධිකාරිය විසින් උත්පාදනය කරන සුළු මෙහෙයුම් ආදායමක් ද ඇත.

1. ස්වභාවික සම්පත් ගවේෂණ ක්‍රියාකාරකම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
2. බන්කරින් මෙහෙයුම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
3. තෙල් කාන්දුවීම් හදිසි සැලැස්ම අනුමත කිරීම.
4. අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

9.2.1 අධිකාරිය විසින් උත්පාදනය කරන ලද ආදායම

අධිකාරිය විසින් උත්පාදනය කරන ලද ආදායම උපචිත පදනමක් මත හඳුනාගනු ලැබේ.

9.2.2 මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන්

අධිකාරිය ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන සහ පුනරාවර්තන ලෙස ප්‍රදාන වර්ග දෙකක් ලබයි. මෙම ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත පරිදි පදනම් වේ.

9.2.2.1 ප්‍රාග්ධන ප්‍රදානයන්

දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම සඳහා ලැබෙන රජයේ ප්‍රදානයන්, එවැනි දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. ශ්‍රී ලංකාවේ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා ලැබෙන ප්‍රතිපාදනයන් ස්වභාවිකවම අස්පෘෂ්‍ය වත්කම් උත්පාදනය කරයි. නමුත්, එය අස්පෘෂ්‍ය වත්කම් තුළ දක්වා ඇති හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නොමැති බැවින් සමුද්‍ර දූෂණය වැළැක්වීමේ ක්‍රියාකාරකම් සම්බන්ධ වියදම්, එවැනි ක්‍රියාකාරකම් සිදු කරන වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

9.2.2.2 පුනරාවර්තන ප්‍රදානයන්.

පුනරාවර්තන ප්‍රදානයන් ඒවා ලැබෙන වර්ෂයේදී ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

9.3 සේවක ප්‍රතිලාභ

9.3.1 නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්මකට ඇති බැඳීම් එම වියදම් දැරූ විට ආදායම් ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගනු ලැබේ. සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියේ සේවකයින්ගේ දළ වැටුපෙන් 15% ක් සේවක අර්ථසාධක අරමුදලට සහ 3% ක් සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් දායක වේ.

9.3.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

පාරිතෝෂික යනු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. ව්‍යවස්ථාව අනුව පාරිතෝෂික ගෙවීමට සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරිය බැඳී සිටී. මෙම බැඳීම සපුරාලීම සඳහා, සේවා පළමු සම්පූර්ණ කළ වර්ෂයේ සිට ආරම්භ වන, එක් එක් සම්පූර්ණ කළ සේවා වර්ෂය සඳහා මාස භාගයක වැටුප සහ ජීවන වියදම් දීමනාව එකතු කර ගණනය කරන ලද මුදලකට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරියට ගෙන යනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂික ගෙවිය යුතු සියලුම සේවකයින් සඳහා විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වගකීම් යටතේ වර්ග කර ඇත.

9.4 සංසන්දනාත්මක තොරතුරු

අවශ්‍ය අවස්ථාවලදී, ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සකස් කර ඇත.

9.5 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලද අතර උචිත අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සටහන් වලට අදාළව ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

9.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කර ඇත.

9.7 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියෙහි ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

9.8 අඛණ්ඩ පැවැත්ම

සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියෙහි කළමනාකාරීත්වය, අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම තවදුරටත් ඉදිරියට පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් සිදු කර ඇති අතර, සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියට අපේක්ෂිත අනාගතයක් සඳහා ක්‍රියාත්මක වීමට තරම් සම්පත් ඇති බවට තෘප්තිමත් වේ. තවද, අධිකාරියේ අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු මට්ටමේ සැකයක් ඇති කළ හැකි කිසිදු වැදගත් අවිනිශ්චිතතාවයක් කළමනාකාරීත්වය නොදකී. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ පදනම මත සකස් කිරීම තවදුරටත් සිදුකරනු ලැබේ.

9.9 තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර/ ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ලං.ගි.ප්‍ර වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීම සහ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම්වල වාර්තාගත ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කිරීමට කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ අදාළ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළුව අනෙකුත් සාධක මත පදනම් වේ. එබැවින් සැබෑ ඇත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2023 දෙසැම්බර් 31 දිනට

වත්කම්	**සටහන**	2023 රු.	2022 රු.
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	9	364,075,823	290,239,351
ලැබිය යුතු දෑ	10	2,686,932	6,804,663.00
තැන්පතු	11	9,351,521	8,784,361
පෙර ගෙවීම්	12	2,512,493	1,481,134
කෙටි කාලීන ආයෝජන	28	21,303,667	17,433,853
අයකර ගත යුතු කාර්ය මණ්ඩල ණය	13	14,855,206	14,279,582
ගබඩා භාණ්ඩ	27	19,730,508	18,477,019
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	8	165,495,208	191,679,206
අස්පෘශ්‍ය වත්කම්	8	2,862,776	1,859,318
මුළු වත්කම්		602,874,134	551,038,482

වත්කම්	සටහන	2023 රු.	2022 රු.
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	14	104,809,962	119,593,057.00
ආදායම් ලැබුම් ගිණුම්	23	2,622,167	2,354,364
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ප්‍රතිපාදන	16	37,115,913	37,624,361
මුළු වගකීම්		144,548,041	159,571,782
ශුද්ධ වත්කම්		458,326,092	391,466,700
හිමිකම්			
රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධන	17 &18	168,880,896	192,574,586
ප්‍රධාන- කෙරීගෙන යන වැඩ	19	13,834,234	8,259,144
කාර්ය මණ්ඩල ණය අරමුදල	15	15,999,140	15,999,140
භාවිතා කළ යුතු ප්‍රාග්ධන ප්‍රදානය	25	-	2,440,518
ඉන්වෙන්ටරිවලට අදාළ ප්‍රදානය	24	14,182,487	14,182,487
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල	21	119,486,831	19,486,831
සමුච්චිත අතිරික්තය/(හිඟය)	20	125,942,505	138,523,992
මුළු හිමිකම්		**458,326,092**	**391,466,700**

9.10 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ආදායම	සටහන	2023 රු.	2022 රු.
අනෙකුත් රජයේ ආයතනවලින් මාරු කිරීම්	1	184,843,485	172,766,216
ගාස්තු, දඩ මුදල් සහ බලපත්‍ර	2	81,144,751	572,741,516
Mv. එක්ස්-ප්‍රස් පර්ල් - වියදම් ප්‍රතිපූර්ණය	3	242,000,000	
වෙනත් ආදායම්		37,053,190	16,346,499
මුළු ආදායම		**545,041,426**	**761,854,231**
වියදම්			
වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ	4	129,157,185	138,641,268.00
භාවිතා කරන ලද සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	5	23,991,251	15,531,915.00
වෙනත් පුනරාවර්තන වියදම්	6	263,697,069	357,492,381.00
ප්‍රදාන සහ අනෙකුත් මාරු ගෙවීම්	29	14,990,084	16,133,452.00
මූල්‍ය පිරිවැය	7	229,875	173,785.00
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම	8	25,474,490	24,630,679.00
මුළු වියදම්		**457,539,955**	**552,603,480.00**
කාල සීමාව තුළ අතිරික්තය/ (හිඟය)		**87,501,471**	**209,250,751.00**

9.11 හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

හිමිකම්	විලම්බිත ප්‍රදාන රු.ශත.	ඉන්වෙන්ටරිවලට අදාළ ප්‍රදාන රු.ශත.	භාවිතා කළ යුතු ප්‍රාග්ධන ප්‍රදාන රු.ශත.	කෙරීගෙන යන වැඩ හා සම්බන්ධ ප්‍රාග්ධන ප්‍රදාන රු.ශත.	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල රු.ශත.	සමුච්චිත අතිරික්තයන්/(හිඟයන්) රු.ශත.	එකතුව රු.ශත.
2023/01/01 දිනට ශේෂය	192,574,585.59	14,182,486.83	2,440,517.81	8,259,143.72	19,486,831.20	138,523,992.72	375,467,557.87
පෙර වසර ගැලපීම්							
වියදම් ගාස්තුව ලාභ සහ අලාභයට ආපසු හැරවීම				75,168.00		(82,958.82)	(7,790.82)
නිවැරදි කිරීම				(225,000.00)			(225,000.00)
භාණ්ඩාගාරයට මුදල් මාරු කිරීම			(2,440,517.81)	(1,996,512.72)			(4,437,030.53)
2023/01/01 දිනට යළි ප්‍රකාශිත ශේෂය	**192,574,585.59**	**14,182,486.83**	**-**	**6,112,799.00**	**19,486,831.20**	**138,441,033.90**	**370,797,736.52**
ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	30,200,000.00						30,200,000.00
වත්කම්වලට අදාළ ප්‍රාග්ධනයට මාරු කිරීම්	2,362,799.00			(2,362,799.00)			-
රඳවා ගත් ඉපැයීම් වලින් අරමුදල් මාරු කිරීම්					100,000,000.00		100,000,000.00
ගබඩා භාණ්ඩවලට අදාළ ප්‍රාග්ධනයට මාරු කිරීම							-
ගොඩනැගිලි/ප්‍රධාන කෙරීගෙන යන වැඩවලට අදාළ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මාරු කිරීම්	(10,084,233.64)			10,084,233.64			-
අමාත්‍යාංශයෙන් ලැබුණු ගෘහ භාණ්ඩ	82,650.00						82,650.00
MEP අරමුදලට මාරු කිරීම්						(100,000,000.00)	(100,000,000.00)
නිල් ධජ වෙරළ සංවර්ධනය	588,580.00						588,580.00
ආදායමට මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	(46,843,485.19)						(46,843,485.19)
වසර තුළ අතිරික්තය/(හිඟය)						87,501,471.44	87,501,471.44
2023/12/31 දිනට ශේෂය	**168,880,898.34**	**14,182,486.83**	**-**	**13,834,233.64**	**119,486,831.20**	**125,942,505.34**	**442,326,955**

9.12 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 2023 වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023 Rs.	2022 Rs.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය		
වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය	87,501,471.44	209,250,750
ගැළපුම් කිරීම්		
ක්ෂයවීම්	25,474,489.83	24,630,679
පාරිතෝෂිත ප්‍රතිපාදන	4,096,917	4,056,094
පරිත්‍යාග තොග	82,650	14,536,851
වියදම් ගාස්තුව ලාභ සහ අලාභයට ආපසු හැරවීම	(7,791)	1,867,516
පාරිතෝෂිත ගෙවීම	(4,605,365)	(1,015,445)
පෙර වර්ෂවල ලැබුණු ප්‍රදාන වලින් හඳුනාගත් ආදායම	(46,843,485.19)	(38,366,216)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/හිඟය	**65,698,887**	**214,960,228**
මෙහෙයුම් ක්‍රියාකාරකම්		
තැන්පතු වැඩි වීම්/අඩු වීම්	567,159.94	1,189
පෙරගෙවීම් වැඩි වීම්/අඩු වීම්	(1,031,358.92)	1,053,283
ලැබිය යුතු දෑ වැඩි වීම්/අඩු වීම්	4,076,379.03	(3,056,173)
ඉන්වෙන්ටරි වැඩි වීම්/අඩු වීම්	(1,253,489.14)	(13,638,245)
ගෙවිය යුතු දෑ වැඩි වීම්/අඩු වීම්	(14,783,094.78)	(30,220,965)
පෙර ලැබුණු ආදායම වැඩි වීම්/අඩු වීම්	267,802.51	87,051
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	53,542,286	169,186,368
ආයෝජන ක්‍රියාකාරකම්		
භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය	(21,303,666.61)	(17,433,853)
භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම	17,433,853.00	15,407,297
දේපළ පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(1,698,150.00)	(6,585,393)
ඔභෘෂ ප්‍රදානය	-	3,364,900
භාණ්ඩාගාර බිල්පත් ලද පොළී		2,008,647
මණ්ඩල ණය පොළී	-	818,472
කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම් වැඩි වීම/අඩුවීම	(575,624.00)	(6,104,297)
භාවිතයට නොගත් ප්‍රදාන සඳහා මුදල් මාරු කිරීම	(3,762,225.88)	(968,945)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	(9,905,813)	(9,493,172)
මූල්‍ය ක්‍රියාකාරකම්		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය	30,200,000.00	15,000,000
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල්	**30,200,000**	**15,000,000**
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/අඩුවීම	**73,836,472**	**174,693,196**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	290,239,351	115,546,153
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	364,075,823	290,239,349

9.13 මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන්

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන්

සටහන 01	භාණ්ඩාගාර ප්‍රදාන (රු.)	
වෙනත් රජයේ ආයතන වෙත මාරු කිරීම්	**2023**	**2022**
භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන	138,000,000	134,400,000
වත්මන් වර්ෂයේ ආදායමට ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරීම	21,368,995	13,735,537
ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට මාරු කිරීම - වෙනත් ප්‍රදාන වලින්	25,474,490	24,630,679
	184,843,485	**172,766,216**

සටහන 02	ගාස්තු, දඩ සහ අවසර පත්‍ර ගාස්තු (රු.)	
ගාස්තු, දඩමුදල් සහ බලපත්‍ර	**2023**	**2022**
අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවාව - ලියාපදිංචි කිරීමේ ගාස්තු	4,079,200	4,102,200
අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවාව - අවසර පත්‍ර ගාස්තු	23,487,942	22,620,847
අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවාව - අයදුම්පත් ගාස්තු	60,000	58,500
බංකරිං අයදුම්පත් ගාස්තුව	24,000	15,000
බංකරිං ලියාපදිංචිය	2,460,000	1,680,000
රෝඩ් ටැන්කර් ලියාපදිංචිය -බංකරිං	63,000	99,000
පරීක්ෂණ ගාස්තු	924,429	-
නොස්කොප් අයදුම්පත් ගාස්තුව සහ අනුමත කිරීමේ ගාස්තු	282,781	331,288
ඩම්පින් නියාමන ආදායම	4,276,475	74,136,764
තෙල් කාන්දුවීමේ සිද්ධිය	45,486,925	469,697,917
	81,144,751	572,741,516
Mv. එක්ස්ප්‍රස් පර්ල් - වියදම් ප්‍රතිපූර්ණය	242,000,000	
එකතුව	**323,144,751**	**572,741,516**

සටහන 03	වෙනත් ආදායම් (රු.)	
	2023	**2022**
සැපයුම් ලියාපදිංචි ගාස්තු	-	269,000
විවිධ ආදායම්	871,354	1,539,269
රක්ෂණ හිමිකම්	110,065	43,100
පොළී ගිණුම (භාණ්ඩාගාර බිල්පත් සඳහා කෙටි කාලීන ආයෝජනය)	29,193,534	7,201,487
අනුග්‍රාහකත්ව	5,979,907	6,656,017
නිෂ්කාශන ආදායම		60,941
සංචාරක බංගලා ආදායම	88,950	39,200
රසායනාගාර ආදායම	809,380	537,485
	37,053,190	**16,346,499**

සටහන 04	වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ (රු.)	
	2023	**2022**
වැටුප් සහ වේතන	117,159,963	128,718,594
අතිකාල/නිවාඩු/උසස් ගෙවීම්	5,801,156	4,522,591
වෙනත් දීමනා	2,099,150	1,343,990
පාරිතෝෂිත ගෙවීම්	4,096,917	4,056,094
	129,157,185	**138,641,268**

සටහන 05	භාවිතා කළ සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය (රු.)	
5.1 සැපයුම්	**2023**	**2022**
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	2,507,787	2,116,563
ඉන්ධන සහ ලිහිසි තෙල්	9,214,954	5,697,074
නිල ඇඳුම්	76,000	80,000
	11,798,741	**7,893,637**
5.2 නඩත්තු වියදම්	**2023**	**2022**
වාහන	7,205,732	3,974,534
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	4,334,673	3,066,448
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	652,105	597,296
	12,192,510	**7,638,278**

සටහන 06	අනෙකුත් පුනරාවර්තන වියදම් (රු.)	
6.1 ගමන් වියදම්	**2023**	**2022**
දේශීය	3,312,657	2,723,299
විදේශීය	774,595	
	4,087,251	**2,723,299**
6.2 කොන්ත්‍රාත් සේවා	**2023**	**2022**
ප්‍රවාහන වියදම්	2,342,790	4,010,400
විදුලි සංදේශ/තැපැල් ගාස්තු	2,647,969	2,593,410
විදුලිය සහ ජලය	10,070,791	5,361,862
කාර්යාල කුලිය	32,342,143	30,036,469
වෙනත් කොන්ත්‍රාත් සේවා	12,194,612	8,120,870
EU වැඩසටහන	1,577,627	-
MV එක්ස්ප්‍රස් පර්ල් නැව් අනතුර	197,852,771	304,246,033
MT නිව් ඩයමන්ඩ් සිද්ධිය	581,114	400,037
	259,609,817	**354,769,082**

සටහන 07	මූල්‍ය පිරිවැය (රු.)	
	2023	**2022**
බැංකු ගාස්තු	229,875	173,785
	229,875	**173,785**

සටහන 8 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ ක්ෂය වීම

වත්කම් වර්ගය	2023 පිරිවැය			ක්ෂයවීම්-2023			ශුද්ධ වටිනාකම
	01.01.2023	**එකතු කිරීම්**	**31.12.2023**	**01.01.2023**	**එකතු කිරීම්**	**31.12.2023**	**31.12.2023**
මෝටර් රථ	84,211,433	-	84,211,433	77,865,610	1,559,600	79,425,210	4,786,223
ගෘහ භාණ්ඩ සහ උපකරණ	68,236,633	162,450	68,399,083	45,042,252	4,943,092	49,985,344	18,413,739
තාක්ෂණික සහ රසායනාගාර උපකරණ	170,384,127	267,900	170,652,027	66,671,836	15,108,205	81,780,041	88,871,986
පොත්	1,619,366	-	1,619,366	1,070,896	133,976	1,204,872	414,494
ගොඩනැගිලි	66,661,502	-	66,661,502	14,300,262	3,333,075	19,169,736	47,491,766
ඉඩම්	5,517,000	-	5,517,000	-	-		5,517,000
එකතුව	**396,630,061**	**430,350**	**397,060,411**	**204,950,856**	**25,077,948**	**231,565,203**	**165,495,208**
අස්පෘශ්‍ය වත්කම්	4,637,666	1,400,000	6,037,666	2,778,348	396,542	3,174,890	2,862,776
එකතුව	**4,637,666**	**1,400,000**	**6,037,666**	**2,778,348**	**396,542**	**3,174,890**	**2,862,776**
මුලු එකතුව	**401,267,727**	**1,830,350**	**403,098,077**	**207,729,204**	**25,474,490**	**234,740,093**	**168,357,984**

සටහන 9	මුදල් සහ මුදල් සමාන දෑ (රු.)	
මුදල් සහ මුදල් සමාන දෑ	**2023**	**2022**
ලංකා බැංකුව - බොරැල්ල - 194109	2,255,906	277,646,779
මහජන බැංකුව - දෙමටගොඩ - 071100180004783	1,616,804	1,719,558
සෘජධ ඉන්වෙස්ට්මන්	341,900,000	-
ලංකා බැංකුව - බොරැල්ල - 90812625	18,181,818	-
ලංකා බැංකුව - බොරැල්ල - 75553755	121,294	10,873,013
	364,075,823	**290,239,351**

සටහන 10	ලැබිය යුතු මුදල් (රු.)	
	2023	**2022**
ලැයිස්තුවට අනුව ගෙවිය යුතු උත්සව අත්තිකාරම්	7,500	17,500
කේ. පී. එස්. එස්. කුමාර	7,598	37,986
ආර්. ශ්‍රීක්‍රිෂ්ණන්	38,068	38,068
ලැයිස්තුවට අනුව වැටුප් අඩු කිරීමක් නොමැත	33,422	36,940
ප්‍රධාන අලෙවිකරු-භාණ්ඩාගාර බිල්පත්	220,058	452,970
එල්. එච්. ඒ. එච්. එස්. හෙට්ටිආරච්චි	34,630	34,630
ආර්. එන්. ප්‍රියදර්ශන-උපයනවිට ගෙවීමේ බද්ද	(1,427)	117,000
ටී. දයාරූබන්	61,180	(145)
එස්. එම්. සී. කුමාරගේ	107,494	57,380
ඩිල්මා සිලෝන් ටී පීඑල්සී	1,120,200	1,176,700
එම්. එම්. අර්ෂත්	340,320	340,320
පී. එස්. කුමාර	2,998	940
ඒ. ජී. එම්. කේ. ජයවර්ධන	32,822	
ඒ. ජේ. එම්. ගුණසේකර- උපයනවිට ගෙවීමේ බද්ද	74,096	
ආර්. පී. රණවීර- උපයනවිට ගෙවීමේ බද්ද	76,457	
ඒ. ආර්. එච්. මොහිදීන්	45,000	
කේ. සුදර්සන්	1,700	
අසේල බී. රකව- උපයනවිට ගෙවීමේ බද්ද	21,321	
කොලෙට්ස් ලංකා හෝල්ඩින් (පුද්) සමාගම	198,445	
දර්ශනී ලහඳපුර - උපයනවිට ගෙවීමේ බද්ද	4,063	
එච්. ඒ. අයි. සුරංග	3,853	
එච්. ටී. එන්. අයි. පියදාස- උපයනවිට ගෙවීමේ බද්ද	16,432	
ඉනෝකු ඇසුරුම් කිරීම	74,548	
කේ. එච්. කේ. ප්‍රභාසු	24,870	
එස්. ඩී. ජී. පී. සමරජීව	1,090	
ඊ. අයි .ප්‍රනාන්දු	19,798	
කේ. සිවකුමාර්	20,550	
එන්. මුසාතික්	29,148	
ආර්. ජී. රාජපුර	114	
ජේ. එම්. අමාලි ශානිකා	(212)	
ඒ. කාරියවසම්-ඊටීඑෆ්/ඊපීඑෆ්	26,573	
ආර්. එල්. කළුආරච්චි	44,225	
එල්. පී. ටයිටස්	-	178,901
ටී. එස්. රණසිංහ	-	-
විදේශ අමාත්‍යාංශය - ආර්. එම්. එම්. පී. රත්නායක	-	-
පී. ජී. ජී. විමලසේන	-	8,804
කේ. ජී. ඩී. පී. ධනපාල	-	0
එස්. ආර්. විජේරත්න	-	25,000
එස්. ඒ. ප්‍රියංකා උදයංගනී	-	65,975
කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල්	-	4,127,902
යූ. එල්. ජේ. ඒ. ප්‍රියන්වදා	-	37,210
ටී. ශ්‍රීපති		9,230
	2,686,932	**6,763,311**

සටහන 11	ආපසු ගෙවිය යුතු තැන්පතු (රු.)	
	2023	**2022**
ආහාර කොමසාරිස් - ට්‍රයිකෝ	11,250	11,250
අන්තර්ජාල ජංගම දුරකථනය -2015	11,000	11,000
අධිවේගී ජල පද්ධතිය - ජල බෙදාහරින්නා	41,000	41,000
ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය - පුත්තලම R/O කුලිය		50,000
වරුණ බෙවරේජ් ලංකා - ජලය	141,750	3,750
රංජිත් ටෙරාසෝ - ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි කුලිය	5,100,000	5,100,000
ගබඩාව පමුණුගම	3,463,550	3,413,550
ඔටෝ සුපර් සර්විස් සෙන්ටර් - නාවල - ඉන්ධන	375,000	
OOCL ලංකා පුද්ගලික සමාගම		5,000
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	207,971	148,811
	9,351,521	**8,784,361**

සටහන 12	පෙර ගෙවීම් (රු.)	
	2023	**2022**
කුලී වියදම්	1,449,422	992,319
වාහන නඩත්තු වියදම්	269,586	284,791
දේ.පි.උ. නඩත්තු වියදම්	755,052	181,721
වෙනත් වියදම්	38,433	22,303
	2,512,493	**1,481,134**

සටහන 13	ආපසු අයකර ගත යුතු සේවක ණය (රු.)	
	2023	**2022**
ආරම්භක ණය ශේෂය	14,279,582	8,175,285
එකතු කළා:		
ආරම්භක ශේෂය සඳහා ගැලපීම (ලියා හැරීම්)		
වසර තුළ ලබා දී ඇති ණය	9,250,000	10,750,000
මුළු අයකර ගත යුතු මුදල	23,529,582	18,925,285
අඩු කළා:		
වසර තුළ අයකර ගත් මුදල	8,674,376	4,645,703
2023.12.31 දිනට ශේෂය	14,855,206	14,279,582

සටහන 14	ජංගම වගකීම් (රු.)	
	2023	2022
ඒ. එම්. ඩී. ටී. සී. ගුණසේකර - ප්‍රවාහන	312,000	143,600
අල්කා ඩ්‍රින්කින් වොටර් පුද්ගලික සමාගම	8,880	26,880
ඇමරිකන් ප්‍රිමියම් වෝටර් සිස්ටම් පුද්ගලික සමාගම	381	4,188
අෂාන් ගෘහ භාණ්ඩ	40,300	40,300
ඔටෝ වායු සමීකරණ පද්ධති	22,000	22,000
භූමි-ටෙක් (පුද්) සමාගම	121,830	121,830
සී. ජේ හෝල්ඩින්ග්ස්	5,580	7,580
මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය	12,636,098	12,636,098
ප්‍රජා ගෙවීම් 2022.12.31	3,074,500	1,637,000
ඊපීඑෆ් සහ ඊටීඑෆ් ගෙවීම්	2,029,402	2,207,516
රජයේ මුද්‍රණාලය	1,288,575	1,288,575
කාර්මික තාක්ෂණ ආයතනය	462,510	462,510
කේ. ඒ. සුබසිංහ - ප්‍රවාහනය	409,770	588,000
මිලේනියම් ඔටෝ එක්ස්ප්‍රස් පුද්ගලික සමාගම	22,890	22,890
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය	205,355	205,355
MV එක්ස්ප්‍රස් පර්ල් ස.ප.ආ.අධි. කාර්ය මණ්ඩල ගෙවීම - ලැයිස්තුවට අනුව	44,205,553	62,196,986
එන් ඇන්ඩ් වයි මැරීන් සර්විසස් පුද්ගලික සමාගම	6,551,600	6,551,600
ජාතික විගණන කාර්යාලය	1,679,376	1,239,600
ලැයිස්තුවට අනුව අතිකාල/නිවාඩු වැටුප්/WRS	838,480	716,678
පී. බී. ටී. පී. කුමාර	54,103	54,103
පුත්තලම නගර සභාව	26,360	26,360
ආර් පී එන්ටර්ප්‍රයිසස් - ප්‍රවාහන	278,250	828,000
ආර්. ශ්‍රීක්‍රිෂ්ණන්	17,968	17,968
ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය	3,370	4,926
රයිට් ටෙක්නොලොජි	100,000	319,400
ලැයිස්තුවට අනුව වැටුප් සහ අනෙකුත් දීමනා	247,750	155,790
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (කුලිය, විදුලිය සහ ජලය)	172,485	595,467
ශ්‍රී ලංකා ටෙලිකොම්	102,689	77,102
ලැයිස්තුවට අනුව කාර්ය මණ්ඩල වැටුප්	165,792	54,018
ගෙවිය යුතු මුද්දර ගාස්තු	35,725	41,692
ලැයිස්තුවට අනුව යැපුම් සහ ගමන් වියදම්	650,776	534,383
ඇසෝසියේටඩ් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක් හවුස්)	161,727	132,250
හඳුනා නොගත් බැංකු තැන්පතු	-	29,100
රුහුණු විශ්ව විද්‍යාලය - පී.බී.ටී.පී.කුමාර	1,202,030	1,552,080
ඩබ්ලිව්. ඒ. නිලන්ත අතුකෝරල,SO	68,250	68,250
විජේරාම සේවා ස්ථානය	340,775	325,713
WRS ඩිපෝස්ට් - ලැයිස්තුවට අනුව	6,946,266	7,159,548
එක්ප්‍රස් පර්ල් ප්‍රවාහන ගාස්තු	69,190	69,190
ඒ. ඩී. පී. එස්. කුමාරි - ප්‍රවාහන	415,350	903,600

සටහන 14	ජංගම වගකීම් (රු.)	
	2023	**2022**
ඔටෝ සුපර් සෙන්ටර්	274,163	(0)
සමෘද්ධි බැංකුව-වෙරළ ආරක්ෂකයින්	520,000	905,266
ලංකා විදුලිබල මණ්ඩලය	631,892	368,049
අයිසැක් ජේ ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම - කුලිය	1,316,129	1,316,129
කේ පී එස් එස් කුමාර	8,421	8,421
ලක්විජය විදුලි බලාගාරය	238,475	238,475
ලංකා විදුලි සමාගම (පුද්ගලික) සමාගම	41,452	29,418
LOLC සාමාන්‍ය රක්ෂණ පීඑල්සී	9,009	7,591
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	8,742	12,295
පර්ල් මාර්කටින්	1,320	2,970
ගෙවිය යුතු වැටුප්	281,913	76,685
සයන්ටිෆික් ඉන්ස්ටුමන්ට් (පුද්ගලික) සමාගම	64,000	64,000
සියෝරැක් පුද්ගලික සමාගම	69,228	128,194
විනෝ ට්‍රෙඩින් (පුද්) සමාගම	311,660	96,250
ඇනලටිකල් ඉන්ට්‍රූමන්ට් (පුද්ගලික) සමාගම	288,729	-
මධ්‍යම පරිසර අධිකාරිය	12,794	-
සිලෝන් බිස්නස් අප්ලයන්ස් (පුද්ගලික) සමාගම	2,121	-
කොලට්ස් ලංකා හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම	123,500	-
ඩී. එම්. සී. කේ. දිසානායක - සිතිජය කැෆෙ	3,500	-
ඩී. එම්. යූ. එන්. බී. දිසානායක - සිතිජය කැෆෙ	201,500	-
ඩී. එම්. වනිගසේකර සහ පුත්‍රයෝ	99,250	-
ඩෙල්ව් ගාඩ් ආරක්ෂක සේවා (පුද්ගලික) සමාගම	268,307	-
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	66,820	-
අ. ජ. භාණ්ඩාගාර මෙහෙයුම්	4,662,031	-
ඩම්පින් ගෙවිය යුතු	514,167	-
එක්ස්ප්‍රස් වොටර් සිසටම් (පුද්ගලික) සමාගම	19,320	-
ගැමේජ් මෝටර් වර්ක්ස්	473,900	-
ගංගා වාකිස්ටාරච්චි	100,000	-
ගරු නීතිපති	47,500	-
ජයන්ත ට්‍රෙඩර්ස්	547,400	-
එල්. පී. ටයිටස්	65,889	-
එම්කේ සප්ලයර්ස් (පුද්ගලික) සමාගම	271,400	-
මොබිටෙල් (පුද්ගලික) සමාගම	8,030	-
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	759,000	-
ඔනේරා එන්ටර්ටේන්මන්ට්	237,500	-
ගෙවිය යුතු ගෙවීම්	356,179	-
ආර්ඩීඑස් මෝටර් ඉංජිනියර්ස්	825,000	-
සේනානායක ඔටෝ සර්විස්	34,560	-
සයින් ටෙක් ඇඩ්වර්ටයිසින් (පුද්) සමාගම	726,800	-
සුපර් ලයින් එන්ටර්ප්‍රයිසස්	160,250	-

සටහන 14	ජංගම වගකීම් (රු.)	
	2023	2022
ටොයෝටා ලංකා (පුද්) සමාගම	111,351	-
ගෙවිය යුතු රඳවාගැනීමේ බදු	450,000	-
කිලිනොච්චි දිසාපති	20,000	-
වරුණ බෙවරේජස් ලංකා (පුද්ගලික) සමාගම	97,405	-
ඩබ්ලිව්. පී. ගුණපාල	14,000	-
සංචාරක අමාත්‍යාංශය	4,491,420	
එස්. එම්. සී. කුමාරගේ	-	6,534
පී. ටී. වරුණ විරාජ්	-	325,000
එස්. ටෙක් එන්ටර්ප්‍රයිසස්	-	150,850
සනික්ටෝ පරිගණක (පුද්) සමාගම	-	15,000
ස්මාර්ට් ප්‍රින්ට් (පුද්) සමාගම	-	480
සදර්න් මාර්කටින්	-	35,000
මුද්දර බදු ගෙවීම්	-	42,150
ටී. ආර්. වී. පල්ලියගුරු	-	75,806
යූ. කේ. ඩී. ජනක පුෂ්පකුමාර	-	304,400
යුනිලංකා ආරක්ෂක සේවය	-	102,672
උපාලි පුවත්පත් (පුද්ගලික) සමාගම	-	54,020
වී. එන්. විදානගමගේ	-	50,000
වී. වයි. එස්. ඉන්ටර්නැෂනල්	-	33,000
සීමාසහිත විජය පුවත්පත් සමාගම	-	44,410
මැරීන් ඔවර්සීස් ඒජන්සි (පුද්) සමාගම	-	208,000
දුමින්ද මෝටර්ස්	-	83,058
ලිබර්ටි පබ්ලිෂර්ස් (පුද්) සමාගම	-	5,930
කේ. බී. වී. ඉන්ද්‍රසිරි	-	2,750
එල්. සී. ඒ. ආරච්චි	-	297,000
ක්වාලිට්‍රෝන් පුද්ගලික සමාගම	-	174,000
යූ. එන්. ඩී. ජී.	-	3,014,900
ඩබ්ලිව්. ඒ. ඩී. එම්. ප්‍රන්ට් රෝස්	-	1,818,700
ඇක්සෙල් ටෙක්නොලොජීස් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම	-	62,750
ඇලියන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම	-	2,527
බිනාටෝ ඉංජිනියර්න්	-	320,250
සී. ජේ. සපුමොහොට්ටි	-	121,332
කැමරා.එල්කේ (පුද්) සමාගම	-	360,600
එෆ්. එන්. හුසේන්	-	58,000
ගුණවර්ධන කුෂන් හවුස් (පුද්) සමාගම	-	190,500
එච්. ජී. සංජීව	-	507,500
එච්. එම්. ඊ. එම්. ඩී. හේරත්	-	50,000
හේමචන්ද්‍ර ජී. ගමගේ	-	160,000
හෙම්සන්ස් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම	-	137,885
මාතර මෝටර් සර්විස් සෙන්ටර්	-	49,580
එන්. එස්. වික්‍රමසිංහ	-	47,020

සටහන 14	ජංගම වගකීම් (රු.)	
	2023	**2022**
ඒ.එල්.එස්. ටෙස්ටින් සර්විස් ඉන්දියා පුද්ගලික සමාගම	-	3,332,910
චන්ද්‍රසිරි මෝටර් වර්ක්ස්	-	22,250
නාරාහේන්පිට කැබ් සර්විස්	-	211,830
එම්.එම්.ඒ.ආර්.පී. ගුණවර්ධන	-	307,920
දීප්ති පිරිසිදු කිරීමේ සේවාව	-	130,621
පී.ඒ.ඩී.පී.ආර්. කුමාර	-	195,000
දිස්ත්‍රික් ලේකම් - මන්නාරම	-	3,682
ගාල්ල මහ නගර සභාව	-	-
	104,809,962	**119,321,868**

සටහන 15	කාර්ය මණ්ඩල ණය අරමුදල (රු.)	
	2023	**2022**
ආරම්භක ණය ශේෂය 2023.01.01	15,999,140	15,180,667
එකතු කළා:		
අතිරේක අරමුදල		
වසර සඳහා පොලිය		818,472
අඩු කළා:		
වසර සඳහා බැංකු ගාස්තු/ලියා හැරීම		
2023.12.31 දිනට ණය අවසන් ශේෂය	**15,999,140**	**15,999,140**

සටහන 16	පාරිතෝෂික ප්‍රතිපාදන (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	37,624,361	34,583,712
වසර සඳහා ප්‍රතිපාදන	4,096,917	4,056,094
	41,721,278	38,639,806
අඩුකළා:		
වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම	4,605,365	1,015,445
අවසාන ශේෂය	37,115,913	37,624,361

සටහන 17	රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධන (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	192,574,586	185,070,463
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වෙත මාරු කිරීම්	1,762,799	5,285,843
අමාත්‍යාංශයෙන් ලැබුණු ගෘහ භාණ්ඩ	82,650	-
WFO	-	3,854,487
වසර තුළ ලැබුණු පරිත්‍යාග වත්කම්		25,549,409
නිල් ධජ වෙරළ සංවර්ධනය	588,580	
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වෙතින්	600,000	-
ඉන්වෙන්ටරිවලට අදාළ ප්‍රදාන වලින් මාරු කළ මුදල		-
වසර තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	30,200,000	30,200,000
ලං.වි.ම. ව්‍යාපෘතිය		
	225,808,615	234,760,202
අඩුකළා		
ආදායමක් ලෙස පිළිගත් ප්‍රදානය	46,843,485	38,366,216
භාවිතා කළ යුතු ප්‍රාග්ධන ප්‍රදානය		-
ප්‍රාග්ධන වත්කම් W/P	10,084,234	3,819,400
අස්පෘශ්‍ය වත්කම් W/P		-
2023.12.31 දිනට අවසාන ශේෂය	**168,880,896**	**192,574,586**

සටහන 18	ආදායම ලෙස හඳුනාගත් රජයේ විලම්බිත ප්‍රදාන (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	192,574,587	185,070,464
ආරම්භක ශේෂය සඳහා ගැලපීම		
වසර තුළ මිලදී ගත් වත්කම්	1,698,150	6,585,393
අමාත්‍යාංශයෙන් ලැබුණු ගෘහ භාණ්ඩ	82,650	
වසර තුළ ලැබුණු පරිත්‍යාග වත්කම්	-	25,549,409
ප්‍රාග්ධන වත්කම්වලට අදාළ ප්‍රදානය	-	
	194,355,387	217,205,266
අඩුකළා		
ආදායම ලෙස හඳුනාගත් විලම්බිත ප්‍රදාන	**25,474,490**	**24,630,679**
2022.12.31 දිනට අවසාන ශේෂය	168,880,897	192,574,587

සටහන 19	කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ සඳහා රජයේ ප්‍රදාන (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	8,259,144	10,469,532
වසර තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන	10,159,402	4,044,400
	18,418,545	14,513,932
අඩුකළා		
හඳුනාගත් වත්කම්	2,362,799	5,285,843
භාවිතා කළ යුතු ප්‍රදාන	2,221,513	968,945
අවසාන ශේෂය	13,834,234	8,259,144

සටහන 20	සමුච්චිත හිඟය (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	138,523,992	(72,594,274)
වියදම් ගාස්තු ආපසු හැරවීම	(82,959)	1,867,516
අධික ගාස්තු ක්ෂයවීම් ආපසු හැරවීම		-
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදලට මාරු කිරීම	(100,000,000)	-
වසර තුළ හිඟය/ අතිරික්තය	87,501,471	209,250,750
අවසන් ශේෂය	**125,942,505**	**138,523,992**

සටහන 21	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	19,486,831	17,136,064
එකතු කළා		
පොලී ආදායම-TB		2,350,767
ලැබුණු අරමුදල්	100,000,000	
අඩු කළා		
අරමුදල් මාරු කිරීම්		**-**
අවසන් ශේෂය	**119,486,831**	**19,486,831**

සටහන 22	අස්පෘශ්‍ය වත්කම් (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	1,859,318	2,082,227
වසර තුළ අත්පත් කරගත් වත්කම්	1,400,000	-
	3,259,318	2,082,227
අඩුකළා		
ක්‍රමක්ෂය කිරීම	396,542	222,910
අවසන් ශේෂය	**2,862,776**	**1,859,318**

සටහන 23	ලැබුණු ආදායම (රු.)	
කලින් ලැබුණු ආදායම	**2023**	**2022**
උසීී අයදුම්පත් සහ බලපත්‍ර ගාස්තු	165,500	267,000
බංකර් අයදුම්පත් සහ ලියාපදිංචිය	1,245,000	1,551,000
ඩම්පින් නියාමනය අයදුම්පත් සහ බලපත්‍ර ගාස්තු	70,000	80,000
ධෑක්ෂ නියාමනය	195,000	171,781
වෙනත් ලැබීම්	946,667	284,583
සැපයුම්කරු ලියාපදිංචිය		-
	2,622,167	**2,354,364**

සටහන 24	ඉන්වෙන්ටරි වලට අදාළ ප්‍රදාන (රු.)	
ප්‍රදාන ලැබීම	**2023**	**2022**
ලැබුණු ප්‍රදාන	14,182,487	2,469,124
පරිත්‍යාග		11,713,362
	14,182,487	14,182,487
එකතු කළා		
ලාභ අලාභයට මුදල් මාරු කිරීම		-
අවසන් ශේෂය	14,182,487	14,182,48

සටහන 25	භාවිතා කළ යුතු ප්‍රාග්ධන ප්‍රදාන (රු.)	
කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු ගිණුම	**2023**	**2022**
ආරම්භක ශේෂය	2,440,518	676,057
ගාස්තු ආපසු හැරවීම වියදම්		1,764,461
වසර තුළ මුදල් මාරු කිරීම්		
	2,440,518	2,440,518
අඩුකළා		
වර්ෂය තුළ දරන ලද වියදම		-
භාණ්ඩාගාරයට ආපසු යැවීම	2,440,518	
අවසාන ශේෂය	**-**	**2,440,518**

සටහන 26	ප්‍රාග්ධන අරමුදල් සැසඳුම (රු.)	
ප්‍රාග්ධන අරමුදල් සැසඳුම	**2023**	**2022**
වසර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	30,200,000	15,000,000
ඉන්වෙන්ටරි වලින් මුදල් මාරු කිරීම	-	-
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වෙතින් මාරු කිරීම	2,362,799	5,285,843
WFO වෙතින් මාරු කිරීම	-	3,854,487
නිල් ධජ වෙරළ සංවර්ධනය	588,580	-
මුළු ප්‍රාග්ධන ප්‍රදානය	33,151,379	24,140,331
අඩු කළා :		
භාණ්ඩාගාරයට මුදල් මාරු කිරීම්		**-**
අස්පෘශ්‍ය වත්කම් සංවර්ධනය		
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(1,698,150)	(6,585,393)
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	(10,084,234)	-
ලාභ අලාභ ගිණුමට මුදල් මාරු කිරීම	**21,368,995**	**17,554,937**

සටහන 27	තොග (රු.)	
	2023	**2022**
ආරම්භක ශේෂය	18,477,019	4,838,774
පරිත්‍යාග/වෙනත් කොටස් හුවමාරුව		14,536,851
ස්ථාවර තොග හුවමාරුව	2,786,356	361,704
	21,263,375	19,737,329
අඩුකළා		
ලාභ අලාභ ගිණුමට මාරු කිරීම්	1,532,867	1,260,310
අවසාන ශේෂය	**19,730,508**	**18,477,019**

සටහන 28	කෙටිකාලීන ආයෝජන (රු.)	
	2023	**2022**
ආරම්භක ණය ශේෂය	17,433,853	15,407,296
එකතු කළා:		
අතිරේක අරමුදල		-
වසර සඳහා පොලිය	3,869,814	2,026,557
අඩු කළා:		
අරමුදල් මාරු කිරීම		-
අවසන් ණය ශේෂය	**21,303,667**	**17,433,853**

සටහන 29 ප්‍රදාන සහ අනෙකුත් මාරුකිරීම් සඳහා ගෙවීම්		2023
වියදම්	**තත්ත්‍ය වියදම්**	**වත්කම්වලට මාරු කිරීම්**
පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම		
2001 ● ගොඩනැගිලි සහ ව්‍යුහයන්		
2002 ● පිරියත යන්ත්‍රෝපකරණ සහ උපකරණ	67,092	
2003 ● වාහන	3,540,085	
2102 ● ගෘහ භාණ්ඩ සහ උපකරණ		
2103 ● පිරියත යන්ත්‍රෝපකරණ සහ උපකරණ	267,900	267,900
2401 x මානව සම්පත් සංවර්ධනය	202,297	

2502 - අනෙකුත් ප්‍රාග්ධන වියදම්

ප්‍රදාන සහ අනෙකුත් මාරුකිරීම් සඳහා ගෙවීම්		2023	
වියදම්	තත්ත්‍ය වියදම්		වත්කම්වලට මාරු කිරීම්
නැව් මගින් සිදුවන දූෂණය අවම කිරීම	784,569		
අනතුරුවලින් සිදුවන තෙල් හා රසායනික ද්‍රව්‍ය පිටවීමෙන් වන බලපෑම් පාලනය කිරීම	379,050		
මුහුදු නාන ස්ථාන සහ වෙරළ තීරයන් වැඩිදියුණු කිරීම	6,699,717		
ධීවර අංශයෙන් සිදුවන දූෂණ වැළැක්වීම	602,064		
සමුද්‍ර සුන්බුන් කළමනාකරණය			
වෙරළබඩ හා සමුද්‍ර දූෂණ පාලනය	1,509,434		
සාගර පරිසර පද්ධති සහ සංරක්ෂණය පිළිබඳ අධ්‍යයනයන්			
රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර සංරක්ෂණය සහ පනත සංශෝධනය කිරීම			
සාගර පරිසරය පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීම			
ජාතික වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම			
මාර්ගගත බලපත්‍ර නිකුත් කිරීමේ තාක්ෂණික හැකියාවන් වැඩි දියුණු කිරීම			
රසායනාගාර පහසුකම් සහ වාණිජ සේවා වැඩිදියුණු කිරීම	873,228		
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	1,762,799		1,430,250
	16,688,234		**1,698,150**

30 භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය

2022 නොවැම්බර් මාසයේදී අධිකාරිය රු. 17,433,852.39 ක මුදලක් මාස 6 කදී කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරන ලදී. එය 2023 වර්ෂයේදී කල් පිරුණ අතර සම්පූර්ණ මුදල (පොලී සහ ආයෝජන මුදල) 2023 වර්ෂයේදී නැවත ආයෝජනය කරන ලදී. එම කාල සීමාව තුළ 3,636,903.12 ක මුදලක් පොලී ආදායමක් ලෙස උපයා ඇත. 2023 නොවැම්බර් මාසයේදී රු. 21,303,666.61 ක මුදලක් (පොලී සහ ආයෝජන වටිනාකම) නැවත ආයෝජනය කරන ලද අතර මෙම මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇත. පොලී ආදායම මෙම වර්ෂයේ මුළු ආදායමට ඇතුළත් කරන ලදී.

31 භාණ්ඩාගාර බිල්පත් නැවත මිලදී ගැනීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි ජංගම ගිණුමේ දිනපතා අතිරික්ත මුදල් ශේෂයන් ආයෝජනය කිරීමට අධිකාරිය කටයුතු ආරම්භ කළේය. මෙම ක්‍රියාවලිය වසර අවසන් වන තෙක් අඛණ්ඩව සිදුවූ අතර වූ අතර එමගින් රු. 25,083,760.13 ක පොලී ආදායමක් උපයා ගන්නා ලදී. මෙම පොලී ආදායම වර්ෂයේ මුළු ආදායමට ඇතුළත් කරන ලදී.

32 01 අධිකාරිය විසින් වර්ෂය තුළ සිය අරමුදල්වලින් රු. 1,698,150.00 ක් වටිනා ස්ථාවර වත්කම් අතපත් කර ගන්නා ලදී මෙම වත්කම්වලට කාර්යාල උපකරණ ඇතුළත් විය.

02 වර්ෂය තුළ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස අධිකාරියට රු. 82,650.00 ක් වටිනා කාර්යාල ගෘහ භාණ්ඩ ලැබුණි.

33 පාරිතෝෂික ප්‍රතිපාදන

1. පාරිතෝෂික ගණනය කිරීම සඳහා පදනම ලෙස මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව භාවිතා කෙරේ.
2. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයට අනුව රාජ්‍ය අංශයේ සේවකයින්ගේ විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කර ඇත. ඒ අනුව, අධිකාරිය විසින් සේවකයින් සේවයෙන් විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60ක් ලෙස සලකන ලදී.

34 තොගය

1. තෙල් විසිරුම් කාරක

තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් වඩා අඩු අගය මත ගණනය කර ඇත. තෙල් විසරණයට අදාළව තොගවල පිරිවැයට වඩා අඩු ශුද්ධ උපලබ්ධි අගයක් ඇති බවට කිසිදු ඇඟවීමක් නොතිබුණි. මෙම තොගය කල් ඉකුත්වන දිනයට පැමිණීමෙන් පසු තවත් වසර දෙක තුනක් භාවිතා කළ හැකි බව තාක්ෂණික අංශයේ අදහසයි. දැනට පවතින තොගවලට අදාළව කල් ඉකුත්වීම 2023 වර්ෂයේදී ළඟා වනු ඇත. එබැවින්, තෙල් විසුරුමේ තොග සඳහා වර්ෂය තුළ සිදු වූ හානිය සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

තෙල් විසුරුම් කාරක ඉතිරි තොග 2023.12.31 වන විට තොග ලෙස ඉන්වෙන්ටරිවලට ඇතුළත් කර ඇත.

02 ලිපි ද්‍රව්‍ය

ගබඩාවල සැලකිය යුතු ප්‍රමාණයක් ලිපි ද්‍රව්‍ය පවතින බව භෞතික සත්‍යාපනය මගින් අනාවරණය විය. එබැවින්, වැදගත් ලිපි ද්‍රව්‍ය අයිතම ඉන්වෙන්ටරි අයතමයක් ලෙස ගැනීමට තරණය කෙරේ (ඇමුණුම 02). පසුගිය වසරේ සිට ඉදිරියට ගෙන යන ලිපි ද්‍රව්‍ය තොග ශේෂය වසර තුළ අර්ධ වශයෙන් භාවිතා විය. ඒ අනුව, භාවිතා කළ බඩු තොගයේ වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට අය කෙරේ. ලිපි ද්‍රව්‍යවල අවසන් තොග 2023.12.31 දිනට තොග වශයෙන් ඉන්වෙන්ටරියට ඇතුළත් කර ඇත.

03 පුස්තකාල පොත්

පොත්වල වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ යටතේ පුස්තකාල පොත් ලෙස දක්වා ඇත. වසර තුළදී මිලදී ගනු ලැබූ පොත්වල පිරිවැය විලම්බිත ප්‍රධාන ගිණුමට මාරු කරන ලද අතර පොත්වල ප්‍රයෝජනවත් ජීව කාලය මත ක්‍රමක්ෂය කිරීම සිදුකරනු ලබයි.

පුස්තකාල පොත්වල ප්‍රයෝජනවත් ජීව කාලය වසර 10 ක් ලෙස සලකන ලදී.

35 රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණ තොගය

රසායන ද්‍රව්‍ය හා විදුරු උපකරණ සම්බන්ධයෙන් අධිකාරිය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය වනුයේ රසායන ද්‍රව්‍යවල හා විදුරු උපකරණවල මිලදී ගැනීමේ මුළු පිරිවැය මිලදීගත් වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට වියදමක් ලෙස ලියාහැරීමයි.

මෙම ක්‍රමය භාවිතා කිරීමට හේතුවනුයේ වර්ෂය අවසානයේ පවතින රසායන ද්‍රව්‍ය තොග නිවැරදි පරිදි ගණනය කරීමේ පවතන ප්‍රායෝගික දුෂකරතාවය සහ ඇතැම් විදුරු උපකරණ ඉතා කෙටිකාලයකදී ප්‍රතිස්ථාපනය කරීමට සිදුවීමයි. කෙසේ වුවද විද්‍යාගාරය විසින් රසායන ද්‍රව්‍ය හා විදුරු උපකරණ වාර්තා කිරීම අරමුණු කරගෙන වෙනම තොග ලෙජරයක් පවත්වාගෙන යනු ලබයි.

36 අස්පෘශ්‍ය වත්කම්

අධිකාරිය විසන් මිලදීගෙන ඇති පරිඝනක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස සලකනු ලබන අතර එම වත්කම්වල පිරිවැය සරල මාර්ග ක්‍රමය යටතේ වසර දහයක් තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. ඉදිරි වසර 10 තුළදී මෙම පරිඝනක මෘදුකාංග වලට වඩා වැඩිදියුණු කරනු ලැබූ මෘදුකාංග වෙළඳපොලේ පැවතිය හැකි බව උපකල්පනය කරන ලදී.

අදාළ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, වත්කම් හානි වීම සම්බන්ධයෙන් කිසියම් ඇඟවීමක් ඇත්නම්, අස්පෘශ්‍ය වත්කම් හානි වීම සඳහා පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. වේ කෙසේ වෙතත්, අස්පෘශ්‍ය වත්කම් හානි වීම පිළිබඳ කිසිදු ඇඟවීමක් නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව, වත්කම් මිලදීගත් පිරිවැයට ගණනය කර අදාළ ක්‍රමක්ෂය ප්‍රමාණයන් වර්ෂය තුළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ඇතුළත් කරන ලදී.

37 සේ.අ.අරමුදලට සහ සේ.භා.අරමුදලට ගෙවීම

අදාළ නීතිවලට අනුකූලව අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට (15%) සහ සේවක භාරකාර අරමුදලට (3%) වශයෙන් දායකත්ව මුදල් ගෙවන ලදී. සේවකයින්ගේ දායකත්වය ලෙස 10%ක් අඩුකරන ලදී. වර්ෂය තුළ අධිකාරිය නියමිත දිනවල නියමිත පරිදි අදාළ ගෙවීම් සිදු කර ඇත.

38 ඉඩම්

ගාල්ල කඩවත් සතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ලබාදුන් ඉඩම තුළ දකුණු පළාත් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකරන ලදී. මෙම ඉඩම මුලින්ම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට පවරා දුන් අතර පසුව එම අමාත්‍යාංශය විසන් අදාළ ඉඩම මෙම අධිකාරිය වෙත පවරන ලදී. කෙසේ වුවද, ඉඩමේ පූර්ණ අයිතිය කඩවත් සතර ප්‍රාදේශිය ලේකම් සතු වේ. මෙම ඉඩමේ වපසරිය පර්චස් 55.17 ක් වන අතර පිඹුරු අංකය DS/GAFG/L&L/02/4 වේ. මෙහි ලොට් අංකය A සහ B වේ. මෙම ඉඩම සඳහා නිකුත් කළ වරිපනම් අංකය 426 B වන අතර එහි ලිපිනය අංක 426 B, කොළඹ පාර, දඩල්ල, ගාල්ල වේ.

39 2023 වර්ෂයේ දී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග ආයතනික අංශයේ හවුල්කාරිත්වය

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය අරුගම්බේ සහ පාසිකුඩා හි නිල් ධජ ස්ථාපිත කිරීම නම් වූ තිරසාර පාරිසරික සංවර්ධන වැඩසටහන ප්‍රවර්ධනය කර ඊට සහාය ලබා දුන්නේය. සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් ඉහත ඒකාබද්ධ වැඩසටහන සඳහා රුපියල් මිලියන 5.08 ක් ලබා දෙන ලදී.

40 අධිකාරිය විසින් ආදායම් උත්පාදනය කිරීම

2022 වර්ෂයේදී අධිකාරිය විසින් උත්පාදනය කරන ලද මුළු ආදායම රු. 589,088,015 ක් විය. කෙසේ වෙතත්, පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ආදායම රු. 228,890,074 කින් අඩු වූ අතර වර්ෂය තුළ උත්පාධිත ආදායම රු. 360,197,941 ලෙස වාර්තා විය.

මෙයට ප්‍රධාන වශයෙන් හේතුව වූයේ MV X-press Pearl නෞකා අනතුර සම්බන්ධයෙන් ලැබුණු ආදායමයි. වර්ෂය තුළ මෙම සිදුවීමෙන් රුපියල් මිලියන 242 ක් ලැබී ඇත.

ඊට අමතරව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරි පනතේ විධිවිධාන අනුව වරායේදී MV YUYI, MV. Feather සහ MV.Hermann නෞකාවල තෙල් දූෂණය සිදුවීමට අදාළව තවත් රුපියල් මිලියන 45 ක් උපයා ඇත.

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ 26 වැනි වගන්තියට අනුව, නෞකාවලින් තෙල් පිටවීම යන කාරණය සම්බන්ධයෙන්, අධිකාරිය "මදුරුඔය" නැමැති නෞකාව රඳවා ගනු ලැබීය. පසුව, නෞකාවේ හිමිකරු වන SEN ෂිපිං ලංකා (පුද්.) සමාගම, නෞකාව නිදහස් කිරීම සඳහා මහජන බැංකුවේ කොටහේන ශාඛාවෙන් රුපියල් මිලියන 15 ක් වටිනා බැංකු ඇපකරයක් ඉදිරිපත් කළේය. මෙම බැංකු ඇපකරය 2025 පෙබරවාරි 09 වන දින කල් ඉකුත් විය.

බැංකු ඇපකරය ඉදිරිපත් කිරීමෙන් පසු, අධිකාරිය නෞකාව නිසි පරිදි නිදහස් කළ අතර එමඟින් එහි අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට ඉඩ ලබා දුන්නේය. කෙසේ වෙතත්, සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය SEN ෂිපිං **ලංකා (පුද්.) සමාග මට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති බව සටහන් කිරීම අත්‍යවශ්‍යය.**

2019 සිට 2023 දක්වා අධිකාරියේ ආදායම් සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

භාණ්ඩය	**2019**	**2020**	**2021**	**2022**	**2023**
ගාස්තු, දඩමුදල් සහ බලපත්‍ර	34,633,317.63	79,422,740.41	214,938,143.6	572,741,516	323,144,751
වෙනත් ආදායම්	12,449,777.08	8,643,448.33	15,371,808.27	16,346,499	37,053,190
එකතුව	**47,083,094.71**	**88,066,188.74**	**230,309,951.9**	**589,088,015**	**360,197,941**

41 එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ රක්ෂණ හිමිකම් සහ වියදම් ගිණුම්ගතකිරීම

1. MV එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර සම්බන්ධයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම් සහ හානි තක්සේරු වාර්තා සකස් කිරීම සිදු කරන ලදී.

2. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් නෞකා රක්ෂණ සමාගම විසින් අනුමත කරන ලද එකඟ වූ ගාස්තු පත්‍රිකාව මත පදනම්ව වියදම් දරා හිමිකම් සකස් කරන ලදී. නීතිපති දෙපාර්තමේන්තුව හරහා නෞකා හිමිකරුගේ නීතිඥවරයාට හිමිකම් ඉදිරිපත් කරන ලද අතර, නෞකා රක්ෂණ සමාගම විසින් හිමිකම් පිළිගත් පසු, රක්ෂණ සමාගම හිමිකම් මුදල සෘජුවම භාණ්ඩාගාරයට මාරු කරන ලදී.

3. භාණ්ඩාගාරය විසින් ලැබුණු හිමිකම් මුදල භාණ්ඩාගාරයේ පොත්වල ආදායමක් ලෙස වාර්තා කරයි. ඒ අනුව, ආදායම් හඳුනා ගැනීමේදී ද්විගණනය ඇතිවීම වීම වැළැක්වීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් එහි පොත්වල රක්ෂණ හිමිකම් ලැබිය යුතු මුදල් වාර්තා නොකරයි.

4. සාමාන්‍ය මුදල් නිකුත් කිරීමේ ක්‍රියාවලිය හරහා වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම් සහ හානි තක්සේරු වාර්තා සකස් කිරීම සිදු කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත අරමුදල් නිකුත් කරන ලදී. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් භාණ්ඩාගාරයෙන් අරමුදල් ඉල්ලුම් කරනු ලබන අතර භාණ්ඩාගාරය අතිරේක ප්‍රතිපාදන ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත අරමුදල් නිකුත් කරයි.

5. ඒ අනුව, ගිණුම වසා දැමූ දිනය දක්වා ඉදිරිපත් කළ හිමිකම්වල විස්තර පහත පරිදි වේ.

හිමිකම් අංකය	කාලපරිච්ඡේදය	පිරිවැය වර්ගය	හිමිකම් වටිනාකම (ඇ.ඩො.)	සටහන්
13	01.12.2022 31.01.2023	පිරිසිදු කිරීම, වියදම්, ප්‍රවාහනය, අපද්‍රව්‍ය ගබඩා කිරීමේ පිරිවැය	491,784.93	ගිණුම් අවසන් වන දිනය දක්වා කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි.
14	01.02.2022 30.04.2023		676,239.85	
15	01.05.2023 31.06.2023		394,944.59	
16	01.07.2023 30.09.2023		488,195.12	
එකතුව			2,051,164.49	

<u>එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සිදුවීම - හිමිකම් සාරාංශය (2021.05.20 සිට 2023.12.31 දක්වා)</u>

හිමිකම් වටිනාකම නිරීක්ෂණය කිරීම	ඇ.ඩො.	43,767.74
පිරිසිදු කිරීම් වියදම් හිමිකම් වටිනාකම.	ඇ.ඩො.	46,784,902.28
මුළු හිමිකම් වටිනාකම	ඇ.ඩො.	46,828,670.02
භාණ්ඩාගාරයට ලැබුණු අරමුදල්	ඇ.ඩො.	14,633,882.65
භාණ්ඩාගාරයට ලැබුණු අරමුදල්	රු.	931,844,147.13
භාණ්ඩාගාරයෙන් ස.ප.ආ. අධිකාරියට ලැබුණු මුදල්	රු.	834,500,000.00

42. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ අනතුරට අදාළව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් දරන ලද වියදම්

මෙම නෞකා අනතුර හේතුවෙන් සිදුවූ සමුද්‍ර දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් වරලත් ආයතනය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වේ. ඒ අනුව, මෙම නෞකා අනතුර හේතුවෙන් සිදුවූ සමුද්‍ර දූෂණය වැළැක්වීම, අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් විවිධ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. තිණුම් වසාදැමූ දිනට අනුව දරා ඇති වියදම්වල සාරාංශය පහත පරිදි වේ.

අනු/අ	විස්තරය	මුදල (රු.)
1	ප්‍රජාව සඳහා ගෙවීම්	110,884,750
2	පිරිසිදු කිරීමේ පරිභෝජන ද්‍රව්‍ය	2,372,727
3	වෛද්‍ය වියදම්	12,908
4	ලිපි ද්‍රව්‍ය වියදම්	1,393,227
5	වෙනත් වියදම්	177,168
6	වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම	3,000
7	ට්‍රැමල් මෙහෙයුම	2,700
8	උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව	52,800
9	පැවරුම් පාදක සේවකයින්	1,659,193
10	ස.ප.ආ.අධිකාරියේ කාර්ය මණ්ඩල ගෙවීම්	468,723
11	ගබඩා කිරීම සහ බැහැර කිරීම	30,448,120
12	පිරිසිදු කිරීමේ උපකරණ	25,980
13	ප්‍රවාහනය	25,353,047
14	ආහාර පාන	3,685,003
15	නවාතැන්	8,702,000
16	පර්යේෂණ වියදම් සහ සාම්පල ලබා ගැනීම	3,112,372
17	නීතිමය ක්‍රියාමාර්ග සඳහා විදේශ ගමන් වියදම්	9,573,757
18	ස.ප.ආ.අධිකාරියේ කාර්ය මණ්ඩල ප්‍රවාහනය	5,090
	මුළු වියදම්	**197,932,570**

43. 2000 වර්ෂයේදී ජපානයේ නිපදවන ලද, මීටර් 330ක් දිග, මෙට්‍රික් ටොන් 300,000කට ආසන්න භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවක් සහිත, MT New Diamond නමැති තෙල් ප්‍රවාහන නෞකාව, 2020 සැප්තැම්බර් 23 වන දින කුවේටයේ සිට ඉන්දියාවේ පැරදීප් වරාය වෙත බොරතෙල් පටවාගෙන යාත්‍රා කරමින් පැවති අතර එහි කුවේටයේ සිට බොරතෙල් ටොන් 277,144.92ක් රැගෙන එමින් තිබුණි. 2020 සැප්තැම්බර් 03 වන දින, නෞකාවේ ඉන්ධන බොයිලේරු කාමරයක සිදු වූ පිපිරීමක් හේතුවෙන් මෙම නෞකාව ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළට ඔබ්බෙන් වූ ස්ථානයකදී අනතුරට ලක් විය. 2020 සැප්තැම්බර් 6 වන දින, අනතුරට පත් නෞකාවේ ටැංකියෙන් තෙල් මුහුදට කාන්දු වන බවට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට තොරතුරු ලැබුණි. ඒ අනුව, 2020 සැප්තැම්බර් 8 වන දින විද්‍යාඥයින් කණ්ඩායමක් නෞකාව පිහිටි ප්‍රදේශයට ගිය අතර එහි වූ ඉන්ධන ස්ථරය නිරීක්ෂණය විය.

අනතුර සිදු වූ අවස්ථාවේ, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ජාතික තෙල් කාන්දු හදිසි සැලැස්ම සක්‍රීය කර අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ ආයතනවල සහාය ඇතිව එය ක්‍රියාත්මක කළ අතර, ඒ අනුව දූෂණය සහ අනෙකුත් අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීමට සහ තෙල් කාන්දුව සාර්ථකව කළමනාකරණය කර පාලනය කිරීමට අධිකාරිය සමත් විය.

දූෂණය වැළැක්වීමේ සහ කළමනාකරණ පියවර වශයෙන් තෙල් විසුරුවා හැරීම සහ හරවා යැවීම, වරායන් හෝ ගොඩබෑමේ ස්ථාන කරා තෙල් ගලායාම වැළැක්වීම, පාවෙන තෙල් සහ සුන්බුන් ඉවත් කිරීම සහ පිරිසිදු කිරීම සිදු කරන ලදී.

නෞකාවේ කපිතාන්වරයාට එරෙහිව කොළඹ මහාධිකරණයේ අපරාධ නඩු පැවරීමක් ආරම්භ කරන ලද අතර, සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ සඳහන් අපරාධ වගකීම යටතේ නෞකාව සඳහා රුපියල් මිලියන 12 ක දඩයක් නියම කිරීමට සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියට හැකි විය. එම මුදල වර්ෂය තුළ අධිකාරියට ලැබෙනු ඇත.

එම්ටී නිව් ඩයමන්ඩ් නම් නෞකාවෙන් තෙල් කාන්දු වීම නිසා ඇති වූ පරිසර දූෂණයේ බලපෑම පිළිබඳව සවිස්තර වාර්තාවක් පිළියෙළ කිරීම සඳහා අදාළ ආයතන සහ විශ්වවිද්‍යාල ගණනාවක් නියෝජනය කරන විශේෂඥයින් 15 දෙනෙකුගෙන් යුත් විද්වත් මණ්ඩලයක් පත් කර ඇති අතර, අදාළ නෞකාවෙන් අපගේ සමුද්‍ර පරිසරයට සිදු වූ හානිය යථා තත්ත්වයට පත් කිරීමේ කාර්යය ඔවුන් වෙත පවරා තිබුණි. ඔවුන් අධිකරණයේ සිවිල් නඩු ගොනුවක් මත පදනම්ව වාර්තාවක් සකස් කර නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. එම නඩු අංකය කෘක13/2022කෘඑ වේ.

වර්ෂය තුළ එම්ටී නිව් ඩයමන්ඩ් සිද්ධියට අදාළ නඩු කටයුතු සහ වාර්තා සකස් කිරීමේ කටයුතු සඳහා අධිකාරිය විසින් රු. 581,113.87 ක මුදලක් වියදම් කරන ලදී.

අන්තර්-හිමිකම් පිළිබඳ විස්තර

1. පළමු අන්තර් හිමිකම් පෑම

1.1 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද 2021.05.20 සිට 2021.06.02 දක්වා කාලය සඳහා වන පළමු අන්තර් හිමිකම්පෑමට අදාළ විස්තර පහත පරිදි වේ.

ආයතනය	**ඉල්ලුම් කරන ලද මුදල**	**පිළිගත් මුදල**	**පැහැදිලි කිරීමෙන් පසු පිළිගත් මුදල**
⋆ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය	26,496,830.57	1,923,187.73	104,904.00
වෙනත් ආයතන			
01. වෙරළ පිරිසිදු කිරීම සහ මෙහෙයුම් සඳහා නාවික හමුදාව විසින් දරන ලද වියදම්	227,081.41	එකම හිමිකම් පෑම දෙවරක් යොමු කිරීම හෙත්වෙන් රක්ෂණ සමාගම හිමිකම ප්‍රතික්ෂේප කර ඇත. නාවික හමුදාව මෙම හිමිකම් පෑම රක්ෂණ සමාගමට වෙන වෙනම යවා ඇත	
02. වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වෙරළ පිරිසිදු කිරීම සහ මෙහෙයුම් සඳහා දරන ලද වියදම්	32,972.91		
03. CBRN ඒකකය සඳහා වියදම්	20,107.54	17,699.40	
04. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ වියදම්	949,858.91	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම හිමිකම ප්‍රතික්ෂේප කර ඇත.	
05. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙරළ පිරිසිදු කිරීම සහ මෙහෙයුම් සඳහා දරන ලද වියදම	25,890.00	-	14,569.23
06. 2021.06.01 දක්වා ඖෂධ රසායනාගාර සහ සාම්පල එකතු කිරීමේ වියදම්	9,014.47	-	9,014.47
07. 2021.05.31 දක්වා නාරා රසායනාගාර සහ සාම්පල එකතු කිරීමේ වියදම්	554,045.81	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම හිමිකම ප්‍රතික්ෂේප කර ඇත.	
08. 2021.05.31 දක්වා ධීවර දෙපාර්තමේන්තුවේ වියදම්	9,690,651.98	1,000,000.00	
09. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	438,749.22	ලංකා ඛනිජ තෙල් සමාගමට ගෙවීමට ඇති හිඟ මුදල් හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත.	
එකතුව	**37,495,343.91**	**2,940,887.13**	**128,487.70**

පළමු හිමිකම් පෑම් සම්බන්ධයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ හිමිකම් පෑම්

පිරිවැය	**ඉල්ලුම් කරන ලද මුදල**	**ඇස්තමේන්තුගත වියදම්**	**පැහැදිලි කිරීම**
කටයුතු සූදානම් කිරීම සඳහා වන වියදම්	359,518.75	359,518.75	ඩොලර් 250,000ක් පමණ පිළිගෙන ඇත.
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	14,005,368.81	12,620,999.59	මෙම ඉල්ලීමේ කොටසක් පිළිගෙන ඇති අතර, කොටසක් ප්‍රතික්ෂේප කර ඇත. තවත් කොටසක් සඳහා ගෙවීම් කිරීමට අමතර විස්තර ඉල්ලා ඇත.
උපකරණ යෙදවීම සහ කුලියට ගැනීම සඳහා වන පිරිවැය	2,540,016.00	2,540,016.00	
පරිපාලන පිරිවැය	1,917,748.16	1,917,748.16	
පරීක්ෂණ සහ සාම්පල එකතු කිරීමේ පිරිවැය	175,110.06	25,698.00	
එකතුව	**18,997,761.79**	**17,463,980.50**	
පරිපාලන පිරිවැය 25%	7,499,068.78	4,365,995.13	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් ගෙවීම සඳහා අමතර තොරතුරු සපයා ඇත.
ස.ප.ආ.අ. එකතුව	26,496,830.57	21,829,975.63	

1.1 ඒ අනුව, රක්ෂණ සමාගමෙන් භාණ්ඩාගාරයට සෘජුවම ඇමරිකානු ඩොලර් 2,940,887.13 ක් ලැබී ඇත. හිමිකම් පෑමේ මුදල ආසන්න වශයෙන් රු. 587,883,337.29 (2,940,887.13x 199.9) කි.

1.2 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් රක්ෂණ සමාගම විසින් ඉල්ලා සිටි අතිරේක තොරතුරු 2021.05.20 සිට 2021.06.03 දක්වා කාලය සම්බන්ධයෙන් ලබා දුන් අතර එය පිළිගැනීමෙන් පසු, නෞකාවේ රක්ෂණ සමාගම තවත් ඇමරිකානු ඩොලර් 119,473.23 ක මුදලක් අනුමත කරන ලද අතර එය 2021.11.30 දින භාණ්ඩාගාරයට ගෙවා ඇත.

2. දෙවන අන්තර් හිමිකම් පෑම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් 2021.06.02 සිට 2021.08.31 දක්වා කාලය සඳහා දෙවන අන්තර් හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑම සඳහා රක්ෂණ සමාගම ඇමරිකානු ඩොලර් 2,173,182.55 ක මුදලක් ගෙවීමට එකඟ වී ඇති අතර එම මුදල රක්ෂණ සමාග මෙන් 2022.03.04 දින සෘජුවම භාණ්ඩාගාරයට ලැබී ඇත. හිමිකම් පෑමේ මුදල ආසන්න වශයෙන් රු. 438,179,884.1 (2,173,182.55 x 201.6305) කි.

පිරිවැය	**ඉල්ලුම් කරන ලද මුදල**	**පිළිගත් මුදල**	**පැහැදිලි කිරීමෙන් පසු පිළිගත් මුදල**	**පැහැදිලි කිරීම**
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	2,433,314.75	2,018,131.56	56,028.25	තවදුරටත් ගෙවීම් කිරීම් සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත.
උපකරණ ස්ථාපනය සහ කුලියට ගැනීම සඳහා වන පිරිවැය	788,673.00	155,051.00		
පරීක්ෂණ සහ සාම්පල එකතු කිරීමේ පිරිවැය	470,614.17			
එකතුව	**3,692,601.92**	**2,173,182.56**	**56,028.25**	
පරිපාලන පිරිවැය 25%	923,150.48			ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් ගෙවීම සඳහා අමතර තොරතුරු සපයා ඇත.
ස.ප.ආ.අ. එකතුව	4,615,752.40	2,173,182.56	56,028.25	

3 තුන්වන අන්තර් හිමිකම් පෑම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් 2021.09.01 සිට 2021.11.30 දක්වා කාලය සඳහා තුන්වන අන්තර් හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 1,851,515.49 කි. මෙම හිමිකම් පෑම සඳහා රක්ෂණ සමාගම ඇමරිකානු ඩොලර් 794,082.16 ක් සහ රු. 13,825,603.90 ක් ගෙවීමට එකඟ වී ඇති අතර එම මුදල රක්ෂණ සමාගමෙන් 2022.09.07 දින සෘජුවම භාණ්ඩාගාරයට ලැබී ඇත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පිළිගත් මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	1,437,359.04	ඇ.ඩො. 794,082.16 සහ රු. 13,825,603.90	තවදුරටත් ගෙවීම් කිරීම සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත.
සාම්පල පරීක්ෂා කිරීමේ සහ එකතු කිරීමේ පිරිවැය	43,853.35	ප්‍රතික්ෂේප විය	රක්ෂණ සමාගම එය ප්‍රතික්ෂේප කර ඇති අතර හානි ඇස්තමේන්තු වාර්තාවක් ඇතුළත් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.
එකතුව	1,481,212.39		
පරිපාලන පිරිවැය 25%	370,303.10	ප්‍රතික්ෂේප විය	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් ගෙවීම සඳහා අමතර තොරතුරු ලබා දී ඇත.
ස.ප.ආ.අ. එකතුව	1,851,515.49	ඇ.ඩො. 794,082.16 සහ රු. 13,825,603.90	

4 සිව්වන අන්තර් හිමිකම් පෑම

2021.12.01 සිට 2022.02.28 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් සිව්වන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 1,226,333.63 කි. මෙම හිමිකම් පෑම සඳහා රක්ෂණ සමාගම ඇමරිකානු ඩොලර් 633,456.71 ක් සහ රු. 6,492,065.62 ක් ගෙවීමට එකඟ වී ඇති අතර එම මුදල රක්ෂණ සමාගමෙන් 2022.09.07 දින භාණ්ඩාගාරයට සෘජුවම ලැබුණි.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පිළිගත් මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	981,066.90	ඇ.ඩො. 633,465.71 සහ රු. 6,492,065.62	තවදුරටත් ගෙවීම් කිරීම සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත.
එකතුව	**981,066.90**		
පරිපාලන පිරිවැය 25%	245,266.73	ප්‍රතික්ෂේප විය	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් ගෙවීම සඳහා අමතර තොරතුරු ලබා දී ඇත.
ස.ප.ආ.අ. එකතුව	**1,226,333.63**		

5. පස්වන අන්තර් හිමිකම් පෑම

2022.03.01 සිට 2022.03.31 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පස්වන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 243,698.66 කි. මෙම හිමිකම් පෑම සඳහා රක්ෂණ සමාගම ඇමරිකානු ඩොලර් 243,698.66 ක් සහ රු. 2,464,407.02 ක් ගෙවීමට එකඟ වී ඇති අතර එම මුදල 2023.02.28 දින රක්ෂණ සමාගමෙන් භාණ්ඩාගාරය වෙත සෘජුවම ගෙවා ඇත.

6. හයවන අන්තර් හිමිකම් පෑම

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පිළිගත් මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	335,003.51		තවදුරටත් ගෙවීම් කිරීම සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත
එකතුව	335,003.51		
පරිපාලන පිරිවැය 25%	83,750.88	ප්‍රතික්ෂේප විය	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් ගෙවීම සඳහා අමතර තොරතුරු ලබා දී ඇත.
ස.ප.ආ.අ. එකතුව	418,754.38.	ඇ.ඩො. 243,698.66 සහ රු. 2,464,407.02	

2022.04.01 සිට 2022.05.31 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හයවන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 486,043.80 කි. මෙම හිමිකම් පෑම සඳහා රක්ෂණ සමාගම ඇමරිකානු ඩොලර් 238,892.45 ක් සහ රු. 5,214,462.74 ක් ගෙවීමට එකඟ වී ඇති අතර එම මුදල රක්ෂණ සමාගම විසින් 2023.02.28 වන විට භාණ්ඩාගාරයට ගෙවා නොමැත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පිළිගත් මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	388,835.04	238,892.45 $ and Rs. 5,214,462.74	තවදුරටත් ගෙවීම් කිරීම සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත.
එකතුව	388,835.04		
පරිපාලන පිරිවැය -25%	97,208.76	ප්‍රතික්ෂේප විය	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් ගෙවීම සඳහා අමතර තොරතුරු ලබා දී ඇත.
මුළු එකතුව	486,043.80		

7. හත්වන අන්තර් හිමිකම් පෑම

2022.06.01 සිට 2022.07.31 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් හත්වන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 482,743.27 කි. මෙම හිමිකම් පෑම සඳහා රක්ෂණ සමාගම ඇමරිකානු ඩොලර් 255,129.80 ක් සහ රු. 5,789,470.52 ක් ගෙවීමට එකඟ වී ඇති අතර එම මුදල රක්ෂණ සමාගම විසින් 2023.02.28 වන විට භාණ්ඩාගාරයට ගෙවා නොමැත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පිළිගත් මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	386,194.61	ඇ.ඩො.255,129.80 සහ රු. 5,789,470.52	තවදුරටත් ගෙවීම් සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත. කෙසේ වෙතත් තවදුරටත් ගෙවීම් සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දිය යුතුය
එකතුව	386,194.61		
පරිපාලන පිරිවැය 25%	96,548.65	ප්‍රතික්ෂේප විය	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් ගෙවීම සඳහා අමතර තොරතුරු ලබා දී ඇත.
මුළු එකතුව	482,743.27.		

8. අටවන අන්තර් හිමිකම් පෑම

2022.08.01 සිට 2022.08.31 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් හත්වන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 257,672.67 කි. මෙම හිමිකම් පෑම සඳහා රක්ෂණ සමාගම ඇමරිකානු ඩොලර් 140,929.62 ක් සහ රු. 2,847,110.77 ක් ගෙවීමට එකඟ වී ඇති අතර එම මුදල රක්ෂණ සමාගම විසින් 2023.02.28 වන විට භාණ්ඩාගාරයට ගෙවා නොමැත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පිළිගත් මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	206,138.13	ඇ.ඩො.140,929.62 සහ රු. 2,847,110.77	තවදුරටත් ගෙවීම් සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත. තවදුරටත් ගෙවීම සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දිය යුතුය. දීර්ඝ කාලයක් සහිත ගෙවීම් සඳහා අවශ්‍ය අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දී ඇත. තවදුරටත් ගෙවීම සඳහා අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් යැවිය යුතුය.
එකතුව	206,138.13		
පරිපාලන පිරිවැය 25%	51,534.53	ප්‍රතික්ෂේප විය	ඇස්තමේන්තුගත පිරිවැය හේතුවෙන් රක්ෂණ සමාගම ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත්, ගෙවීම සඳහා අමතර තොරතුරු සැපයිය යුතුය. ගෙවීම සඳහා එම තොරතුරු සපයා ඇත.
මුලු එකතුව	257,672.67.		

9. නවවන අන්තර් හිමිකම් පෑම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද නවවන අන්තර් හිමිකම් පෑම වන්නේ මධ්‍යම පරිසර ආරක්ෂණ අධිකාරිය සහ වනජීවී සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2021.05.20 සිට 2022.12.31 දක්වා කාලය සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත් ප්‍රතිපූරණ මුදලයි. නවවන අන්තර් හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 305,825.40 කි. කෙසේ වෙතත්, 2023.02.28 වන දින වන විටත් රක්ෂණ සමාගම මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කර නොමැත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පැහැදිලි කිරීම
මධ්‍යම පරිසර අධිකාරිය	44,232.25	2023.02.28 දින වන විටත් රක්ෂණ සමාගම මේ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත.
වනජීවී සම්පත් දෙපාර්තමේන්තුව	261,593.15	
එකතුව	305,825.40	
පරිපාලන පිරිවැය 25%	0	
මුළු එකතුව	305,825.40	

10. දහවන අන්තර් හිමිකම් පෑම

2022.09.01 සිට 2022.09.30 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය දහවන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 257,548.67 කි. කෙසේ වෙතත්, 2023.02.28 දින දක්වා රක්ෂණ සමාගම මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කර නොමැත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	206,038.94	2023.02.28 දින වන විටත් රක්ෂණ සමාගම මේ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත.
එකතුව	206,038.94	
පරිපාලන පිරිවැය 25%	51,509.73	
මුලු එකතුව	257,548.67	

11. එකොළොස්වන අන්තර් හිමිකම් පෑම

2022.10.01 සිට 2022.10.31 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය එකොළොස්වන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 258,825.68 කි. කෙසේ වෙතත්, 2023.02.28 දින වන විටත් රක්ෂණ සමාගම මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කර නොමැත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	207,060.54	2023.02.28 දින වන විටත් රක්ෂණ සමාගම මේ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත.
එකතුව	207,060.54	
පරිපාලන පිරිවැය 25%	51,765.14	
මුලු එකතුව	258,825.68	

12. දොළොස්වන අන්තර් හිමිකම් පෑම

2022.11.01 සිට 2022.11.30 දක්වා කාලය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය දොළොස්වන අන්තර් හිමිකම් පෑම ඉදිරිපත් කර ඇත. මෙම හිමිකම් පෑමේ වටිනාකම ඇමරිකානු ඩොලර් 260,063.40 කි. කෙසේ වෙතත්, 2023.02.28 වන දින වන විටත් රක්ෂණ සමාගම මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කර නොමැත.

පිරිවැය	ඉල්ලුම් කරන ලද මුදල	පැහැදිලි කිරීම
වෙරළ පිරිසිදු කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පිරිවැය	208,050.72	2023.02.28 දින වන විටත් රක්ෂණ සමාගම මේ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත.
එකතුව	208,050.72	
පරිපාලන පිරිවැය 25%	52,012.68	
මුලු එකතුව	260,063.40	

MV X-Press Peral නෞකා අනතුරට අදාළව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් දරන ලද වියදම්.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය නැව් අනතුරුවලින් සිදුවන පාරිසරික හානිය වැළැක්වීම සඳහා කටයුතු කරන නිසි ආයතනයයි. ඒ අනුව, සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ පාලනය කිරීම සහ අවම කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. මේ සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී දැරූ වියදම් පහත පරිදි වේ.

2022 වසරේදී MV එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරට අදාළව දැරූ වියදම් පිළිබඳ විස්තර

අනු අංකය	පිරිවැය	අගය
1	ප්‍රජාව සඳහා ගෙවීම්	124,006,500.00
2	භාණ්ඩ පිරිසිදු කිරීම්	4,016,407.75
3	වෛද්‍ය වියදම්	1,950,642.92
4	ලිපිද්‍රව්‍ය වියදම්	685,983.00
5	වෙනත් වියදම්	949,854.00
6	වෙරළ පිරිසිදු තිරීමේ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම	2,750.00
7	ට්‍රැම්ල් මෙහෙයුම් කටයුතු	23,629.73
8	උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	70,717.00
9	කාර්යය මත පදනම්ව බඳවා ගන්නා ලද නිලධාරීන්	1,198,306.45
10	වෙරළ සමීක්ෂණ	2,126,380.00
11	ගබඩා කිරීම සහ බැහැර කිරීම	30,492,312.17
12	පිරිසිදු කිරීමේ උපකරණ	3,713,646.50
13	ප්‍රවාහනය	39,158,811.68
14	ආහාර පාන වර්ග	14,261,077.34
15	නවාතැන්	17,581,300.00
16	පර්යේෂණ වියදම්	977,224.76
17	විශේෂ කමිටුව	23,100.00
18	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් සඳහා ප්‍රවාහනය	372,868.60
19	පිරිසිදු කිරීම් සඳහා සහභාගී වූ හමුදාවන්ට දරන ලද වියදම්	26,444,250.00
20	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා වන අනෙකුත් වියදම්	36,183,891.13
21	MV එක්ස්ප්‍රස් පර්ල් - අනෙකුත් වියදම්	6,380.00
	එකතුව	304,246,033.03

43. 2020 වසරේදී ජපානයේ නිෂ්පාදනය කරන ලද මීටර් 300ක් දිග එම් නිව් ඩයමන්ඩ් නෞකාව, කුවේට් සිට ඉන්දියාවේ ප්‍රදීප් වරායට බොරතෙල් මෙට්‍රික් ටොන් 300,000ක් රැගෙන යමින් සිටියදී, 2020 සැප්තැම්බර් 23 වන දින අනතුරකට ලක් විය.

මෙම නෞකාව කුවේට් සිට බොරතෙල් මෙට්‍රික් ටොන් 277,144.92 ක් ප්‍රවාහනය කරමින් සිටි අතර 2020 සැප්තැම්බර් 06 වන දින ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේදී නෞකාවේ බොයිලේරුවේ පිපිරීමක් හේතුවෙන් නෞකාව අනතුරට ලක් විය.

2020 සැප්තැම්බර් 06 වන දින, අනතුරට ලක් වූ නෞකාවෙන් සාගර පරිසරයට තෙල් කාන්දු වන බවට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට තොරතුරු ලැබුණි. ඒ අනුව, 2020 සැප්තැම්බර් 08 වන දින විද්‍යාඥයින් කණ්ඩායමක් නෞකාව අවට ප්‍රදේශය පරීක්ෂා කළ අතර, එම ප්‍රදේශයේ තෙල් තට්ටුවක් පවතින බවට නිරීක්ෂණය කරන ලදී.

අනතුර සිදුවන අවස්ථාවේ, අදාළ පාර්ශවයන්ගේ සහාය ඇතිව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් තෙල් කාන්දුව පිළිබඳ ජාතික සැලැස්ම ක්‍රියාත්මක කරන ලදී. තෙල් කාන්දුව නිසා ඇති වූ දූෂණය පාලනය කිරීමට සහ අහිතකර පාරිසරික බලපෑම් සාර්ථකව කළමනාකරණය කිරීමට එමගින් හැකි විය.

දූෂණය වැළැක්වීම සහ කළමනාකරණය කිරීම පිණිස, වරායට සහ ගොඩබිමට තෙල් පැමිණීම වැළැක්වීම සඳහා තෙල් විසරණ භාවිතා කිරීම, පාවෙන තෙල් සහ අපද්‍රව්‍ය ඉවත් කිරීම සහ පිරිසිදු කිරීම් කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

මේ සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයේ අපරාධ නඩු විභාගයක් පැවති අතර එහිදී නෞකාවේ කපිතාන්වරයාට එරෙහිව නඩුවක් ගොනු කරන ලදී. ඒ අනුව, සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතේ අපරාධ වගකීම යටතේ ඔවුන්ට රුපියල් මිලියන 12 ක දඩයක් නියම කරන ලදී. එම මුදල වසර තුළ ලැබුණි.

එම නිව් ඩයමන්ඩ් නෞකාවෙන් තෙල් කාන්දු වීම නිසා ඇති වූ පාරිසරික හානිය තක්සේරු කිරීම සඳහා විවිධ ආයතන සහ විශ්වවිද්‍යාල නියෝජනය කරන විද්‍යාඥයින් පහළොස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පත් කරන ලදී.

නෞකාවෙන් පරිසරයට සිදු වූ හානිය සහ හානිය යථා තත්ත්වයට පත් කිරීම සම්බන්ධ වාර්තාවක් සකස් කිරීමේ කාර්යය මෙම කමිටුවට පවරා ඇති අතර, ඔවුන් අදාළ වාර්තාව සකස් කර නීතිපතිවරයාට ලබා දී ඇත. එම වාර්තාව මත පදනම්ව, නඩු අංක CHC13/2022REM යටතේ රු. 3,986,944,720.14 හෙවත් ඩොලර් 22,149,692.89 ක මුදලක් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත. මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

2022 වර්ෂයේදී, එම නිව් ඩයමන්ඩ් නැව් අනතුරට අදාළව නීති කෘත්‍ය සඳහා සහ වාර්තා සකස් කිරීම සඳහා වියදම් ලෙස අධිකාරිය රු. 400,037.00 ක් වැය කර ඇත.

10. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්ඊඑච්/ඩී/එම්ඊපීඒ/එෆ්ඒ/02/2023/57 — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதி / Date } 2024 ජූලි 30 දින

සභාපති

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) MV X Press Pearl නෞකා අනතුර සම්බන්ධ රාජකාරි ඉටුකළ නිලධාරීන්ට අතිරේක දීමනාවක් ගෙවීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.62,196,986 ක

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මුදලක් වෙන් කර තිබූ අතර 2023 වර්ෂයේදී රු.17,991,433 ක මුදලක් ගෙවා තවදුරටත් ගෙවීම් කිරීමට රු.7,292,931 තිබුණද වර්ෂය අවසානයේ ගිණුම්වල ගෙවිය යුතු වියදම් ලෙස රු.44,205,553 ක් පෙන්නුම්කර තිබීමෙන් රු.36,912,622 ක අධිවෙන් කිරීමක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ඇති රු.5,469,574 ක් වටිනා ලීටර් 7,500 ක ඔයිල් ස්පිල් ඩිස්පර්සන්ට් තොගය 2023 මාර්තු 23 දින වන විට යල් පැන තිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 38 ඡේදය ප්‍රකාරව එම වටිනාකම කපාහැරීම වෙනුවට තොගයට ඇතුළත් කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තොගය හා ලාභය අධිගණනය වී තිබුණි.

(ඇ) ප්‍රාග්ධන ව්‍යාපෘති සහා ධාරිතා සංවර්ධනය සඳහා ලැබී සමාලෝචිත වර්ෂය අවසාන දිනට තවදුරටත් ගෙවිය යුතුව තිබූ රු. 13,834,233 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 50 හි ඡේදය ප්‍රකාරව වගකීමක් ලෙස හඳුනා නොගෙන කෙරීගෙන යන වැඩ ලෙස සමුච්චිත අරමුදල යටතේ දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 44 සිට 49 දක්වා වූ ඡේද වලට අනුව හුවමාරු නොවන ගණුදෙනු වලින් වන අයභාරය හඳුනාගැනීම හා මැනීම කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු. 30,871,230 කින් රු.10,158,619 ක් සහ 2021 හා 2022 වර්ෂවල රසායනාගාර ව්‍යාපෘතියක් සඳහා විදේශ පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ රු.14,182,487 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඉ) පූර්ව වර්ෂ තුල ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදානයන් සම්බන්ධයෙන් උක්ත ප්‍රමිතියේ 116 සිට 123 දක්වා වූ සංක්‍රාන්ති විධිවිධාන අනුව කටයුතු කර නොතිබීමෙන් තවදුරටත් අයභාරය ලෙස හඳුනාගත යුතු රු.158,722,279 ක් විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සමුච්චිත අරමුදලේ දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19 හි 61 ඡේදය ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමක් ලෙස සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ආයු ගණන ශිල්ප ක්‍රම භාවිතයෙන් නිශ්චය කළයුතු වුවත් එසේ නිශ්චය නොකර අධිකාරියේ සේවකයන් 170 දෙනෙක් සඳහා 2023 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික ලෙස රු.37,115,913 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) මෘදු පිටපතකින් පවත්වාගෙන යන අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම් අයිතම වශයෙන් නොදක්වා කාණ්ඩ වශයෙන් දක්වා තිබීමෙන් වෙනම හඳුනාගත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නොහැකිවීමත්, වත්කම් අත්පත් කර ගත් දිනය හඳුනාගත නොහැකිවීමත් හේතුවෙන් රු.25,474,490 ක් වූ වාර්ෂික ක්ෂය වටිනාකමෙහි නිරවද්‍යතාවය සනාථ කරගත නොහැකි වූ අතර පෙර වර්ෂය අවසාන වත්කම් සමීක්ෂණ වාර්තා නිවැරදි වර්ගීකරණය අනුව සාරාංශ ගත කර ස්ථාවර වත්කම් උපලේඛනයට අනුව ඉදිරිපත් කර නොතිබීමත්, සමාලෝචිත වර්ෂයට අදාළ වත්කම් සමීක්ෂණය කර නොතිබීමත් හේතුවෙන් වර්ෂය අවසානයේ රු.168,357,986 ක් වූ දේපල, පිරියත හා උපකරණ වටිනාකමෙහි නිරවද්‍යතාවය ද සනාථ කරගත නොහැකි විය.

(ඍ) රජයේ ප්‍රාග්ධන ප්‍රදානවලින් දේපළ පිරියත හා උපකරණ මිළදී ගැනීම සඳහා ලැබෙනු ලබන මුදල් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් විලම්භිත ආදායම් ගිණුමට මාරු කර වර්ෂයේ ක්ෂය වියදම විලම්භිත ආදායම් ගිණුම මඟින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට මාරු කිරීම අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වීමෙන්, සමාලෝචිත වර්ෂය අවසානයට දේපළ පිරියත හා උපකරණවල ශුද්ධ අගය විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂයට සමාන විය යුතු වුව ද, එම ගිණුම් දෙක අතර රු.522,912 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) මෘදුකාංග ව්‍යාපෘති 02ක් සඳහා හා දකුණු පළාත් කාර්යාලයේ CCTV පද්ධතිය අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවූ රු.1,005,250 ක මුදල අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඒ) 2024 වර්ෂයේ විශ්‍රාම යාමට නියමිත සේවකයන් 3 දෙනෙකුට අදාළ එකතුව රු.1,799,923 ක පාරිතෝෂිත වෙන්කිරීම හා 2023 වර්ෂයේ ඉල්ලා අස්වී තිබූ නිලධාරීන් 3 දෙනෙකුට අදාළව 2023 දෙසැම්බර් 31 වන විටත් නොගෙවන ලද රු.608,915 ක පාරිතෝෂික මුදල වශයෙන් එකතුව වූ රු.2,408,838 ක් දිගුකාලීන වගකීම්වලින් ඉවත් කර ජංගම වගකීමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඔ) රසායනාගාර ආදායම්, බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අයදුම්පත් ගාස්තු, දඩ මුදල් අයකිරීම්වලින් ලද ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම රු.26,891,126 ක් වුවද, අධිකාරියේ එම ආදායම් රැස්කරන අංශ හා උප කාර්යාල වලින් ලබාගත් තොරතුරු අනුව ආදායම රු.28,376,522 ක් වූයෙන් ඒ අතර රු.1,485,396 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) 2018 මාර්තු 30 දින අධිකාරිය වෙත පවරා දී තිබුණු ගාල්ල කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල සඳහා "Design & Build" පදනම මත ඉදිකිරීම් කටයුතු සිදුකළ ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයට ගෙවිය යුතු රැඳවුම් මුදල

රු.5,660,215 ක් වුවද, එය රු.12,636,098 ක් ලෙස රු.6,975,883 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) මිරිස්ස ධීවර ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් උපදේශන සේවා සැපයීමට අදාළව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්‍යංශයෙන් අයවිය යුතු රු.1,945,847 ක මුදල ගිණුම් ගත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම හා ලැබිය යුතු මුදල් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීමද කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ

ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ 1.2 (ඈ) හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව		නිරීක්ෂණ
(අ)	2023 පෙබරවාරි 27 වන දිනැති අංක අමප/23/0386/605 / 012-1 අමාත්‍ය මණ්ඩල තීරණය	සාමාන්‍යාධිකාරි තනතුර බාහිර පදනමින් ද, අනෙකුත් අංශවල කළමනාකරු තනතුරු 05 ක් සඳහා අභ්‍යන්තර පදනමින් ද පුරප්පාඩු පිරවීමටත්, එසේ නොහැකි වන්නේ නම් අමාත්‍ය මණ්ඩල සටහනක් මඟින් අපේක්ෂිත සංශෝධන සිදුකර ගැනීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දන්වා එවා තිබුණු නමුත් එලෙස කටයුතු නොකර නීති කළමනාකරු ඇතුළු කළමනාකරු තනතුරු 04 ක් බාහිර පදනම මතත්, සාමාන්‍යාධිකාරි තනතුර වසර 2 1/2 ක කාලයක් වැඩ බැලීමේ පත්වීමක් දැරූ නිලධාරියා වෙත අභ්‍යන්තර පදනම මතත් 2024 අප්‍රේල් 03 දින සිට ස්ථිර පත්වීම ලබාදී තිබුණි.

(ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක පිඊඩී/01/ 2021 දරන රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත

(i)	3.6 ඡේදය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ ඵලදායී කාර්යසාධන ඇගයීම් පද්ධතියක් අධිකාරිය වෙත හඳුන්වා දී නොතිබුණි.
(ii)	6.7 ඡේදය	සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති ස්ථාවර වත්කම් සහ ගබඩා භාණ්ඩ සත්‍යාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	**නිරීක්ෂණ**
(අ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 10(1) හා (2) උපවගන්තිය	10(1) උපවගන්තිය පරිදි නියමයක් සිදු කිරීම සඳහා 2(1) උප වගන්තිය යටතේ නියෝග සාදා නොතිබීම හේතුවෙන් එම උප වගන්තිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත සමුද්‍ර දූෂණයක් වැළැක්වීමට, අඩු කිරීමට, පාලනය කිරීමට හෝ නතර කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් දඩ අයකර ගැනීමට තිබූ අවස්ථා අහිමි වී ගොස් තිබුණි.
(ආ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 17 (7) වගන්තිය	සමුද්‍ර දූෂණ වැළැක්වීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධව අධිකාරිය අවශය යයි සලකනු ලබන විශේෂඥ දැනුම ඇති බාහිර පාර්ශවයකගේ දැනුම ලබා ගත හැකි වුවද, එසේ විශේෂඥ සභය ලබාගෙන නොතිබීමෙන් අන්තර්ජාතික වශයෙන් පවතින නිර්ණායක පරිදි මෙම කාර්ය දීර්ඝ කාලීනව කිරීමේ ඇති පාරිසරික වැදගත්කම, වෙරළ තීරයේ ස්ථායීතාවයට වන බලපෑම හා නවදුරටත් මෙම කාර්ය

කොපමණ කාලයක් කළ යුතුද යන්න පිළිබඳව තීරණයක් ගැනීමෙන් තොරව, රක්ෂණ සමාගමේ අභිමතය ද ලබා නොගෙන වෙරළේ ප්ලාස්ටික් පබලු ඇහිදීම අඛණ්ඩව සිදුකරගෙන යමින් තිබුණි. තවද, 2021 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රජා දායකත්වයෙන් දිස්ත්‍රික්ක 4 ක වෙරළ කලාප වල ප්ලාස්ටික් පබලු එකතු කිරීම සිදු කරන 158 දෙනෙකු සඳහා රු.20,116,500 ක දීමනා ගෙවා තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ගාල්ල විද්‍යාගාරය සඳහා රු.1,888,000 ක් වටිනා Analytical Balance උපකරණයක් 2024 මාර්තු 11 දින මිල දීගෙන තිබුණු අතර එම උපකරණය පිරිවිතරවලට අනුකූල නොවීමෙන් සැපයුම්කරු වෙත නැවත භාර දී තිබු නමුත් මෙම වාර්තාවේ දිනය දක්වාම නැවත සැපයීම් කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරියේ බැංකු ජංගම ගිණුම් වල සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති මුදල් ශේෂය රු. මිලියන 290 ක් ද, වර්ෂය අවසානයේ පැවති මුදල් ශේෂය රු. මිලියන 364 ක් ද විය. අධිකාරියේ සාමාන්‍ය මාසික ගෙවීම් අවශ්‍යතාවය සලකා අතිරික්ත මුදල වඩා වාසිදායක ආකාරයට ආයෝජනය කිරීමට කටයුතු නොකර ඉතා කෙටි කාලීන ආයෝජනයන්හි යෙදවීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.104,809,962 ක ගෙවිය යුතු ශේෂය තුළ පැවති වර්ෂ 5 ඉක්ම වූ රු.12,636,097 ක්, වර්ෂ 3 ඉක්ම වූ රු.3,006,832 ක් හා වර්ෂ 2 ඉක්ම වූ රු.1,757,365 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී අනතුරට පත්වූ නැවකින් ලැබුණු රු.මිලියන 10 ක වන්දියක් හා 2022 වර්ෂයේදී රඳවාගත් ඉපැයීම් වලින් රු.මිලියන 100 ක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල නමින් ගිණුමකට බැර කර එම මුදල භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරමින් තිබුණු අතර ආයෝජන පොලී එකතුවීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලේ ශේෂය රු.119,486,831 ක් වී තිබුණි. එසේ වුවද, සමුද්‍රීය පරිසර දූෂණය වැලැක්වීම සම්බන්ධ කළයුතු කාර්යයන් හඳුනා නොගෙන මෙම අරමුදල නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2021 මැයි 20 දින කොළඹ වරායට නාවික සැතපුම් 9.5 ක් දුරින් සිදු වූ MV X Press Pearl නෞකා අනතුරට අදාළව අධිකාරිය විසින් අපරාධ වගකීම යටතේ 2022 නොවැම්බර් 15 දින පවරා තිබුණු නඩුව හා සිවිල් වගකීම යටතේ 2023 මැයි මාසයේදී සිංගප්පූරු වාණිජ අධිකරණයේ පවරා තිබුණු නඩුව මෙම වාර්තාවේ දිනය දක්වා අවසන් වී නොතිබුණි.

මෙම නෞකා අනතුරට අදාළව පහත සඳහන් කරුණුද නිරීක්ෂණය විය.

i. MV X-Press Pearl නෞකා අනතුරට අදාළව ශ්‍රී ලංකාව විසින් (අධිකාරිය සහ අනෙකුත් ආයතන ද ඇතුළුව) දරන ලද වියදම් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දක්වා වන කාලයට අදාලව අවස්ථා 17 ක දී ප්‍රතිපූර්ණය සඳහා නෞකාවේ රක්ෂණ සමාගමට යොමුකර තිබූ ඇ.ඩො මිලියන 50.4 කින් ඇ.ඩො මිලියන 14.6 ක් හා රු.මිලියන 931.8 ක් මහා භාණ්ඩාගාරයට ලැබී තිබුණු අතර වියදම් තොරතුරු ප්‍රමාණවත් නොවීම හා ඇස්තමේන්තුගත අගයන් වීම හේතුවෙන් ඇ.ඩො මිලියන 32.3 ක් ගෙවීම් ප්‍රතිපූර්ණය ප්‍රතික්ෂේප කර තිබුණි. රක්ෂණ ආයතනය වෙතින් ඇමරිකානු ඩොලර්වලින් වියදම් ප්‍රතිපූරණ ඉල්ලුම් කර තිබූ නමුත් රක්ෂණ ආයතනයෙන් මිලියන 931.8 ක් රුපියල් වලින් භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූරණ කර තිබීම ද ගැටළු සහගත විය.

ii. MV - X Press Pearl නෞකා අනතුරෙන් පසුව Big blue Machine භාවිතාව සම්බන්ධයෙන් යන්ත්‍රය සැපයූ ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස්පත් අනුව වටිනාකම ඇ.ඩො. 243,750 ක් විය. ප්‍රතිපූරණය සඳහා ඇ.ඩො. 255,000 ක් ඉල්ලුම් කර තිබුණද එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර රක්ෂණ ආයතනය විසින් එම මුදල වෙනම සැපයුම්කරු වෙත ගෙවා ඇති බව 2021 නොවැම්බර් 08 දින නීතිපති වෙත දන්වා එවා තිබුණි. ඒ පිළිබඳ රක්ෂණ ආයතනයෙන් සෘජු තහවුරුකිරීමක් කර ගැනීමට අධිකාරිය කටයුතු නොකර සහ භාණ්ඩාගාරයට ලැබෙන ප්‍රතිපූර්ණයන් සනාථ කර නොගෙන හා ලේඛනගත සාක්ෂි පවත්වා නොගෙන වසරක කාල ප්‍රමාදයෙන් පසු 2022 නොවැම්බර් 03 දින එම යන්ත්‍රය සැපයූ ආයතනය වෙත රු.20,331,563 ක් අධිකාරිය මඟින් ගෙවා තිබීම මතභේදාත්මක විය.

iii. MV-X Press Pearl නෞකා අනතුර සම්බන්ධයෙන් වූ හානිය තක්සේරු කිරීම සඳහා පත් කල විද්වත් කමිටුවට ගෙවිය යුතු දීමනා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 2023 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 5 දෙනෙකුගෙන් සමන්විතව පත්කළ කමිටුව මඟින් දිනකට පැය 8 ක් සඳහා ඇ.ඩො.350 ක් බැගින් ඇමරිකානු ඩොලර් 584,500 ක් විද්වත් කමිටුවට ගෙවීමට, එම කමිටුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නම්කර තිබුණු ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිලධාරියාගේ නිර්දේශය ලබා නොගෙන තීරණය කර තිබුණි. එසේම විද්වත් කමිටුවේ සාමාජිකයින් රාජකාරියේ යෙදුණු කාලය මැනීමටත්, නිර්දේශ කළ එම රේටය ජාත්‍යන්තර රේටයක් ලෙස සනාථ කිරීම සඳහාත් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණු අතර 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ විද්වත් කමිටුවට ගෙවා තිබුණු රු.6.475.000 ක දීමනාව ගණනය කළ ආකාරය පිළිබඳව ද විගණනය වෙත සනාථ නොකරන ලදී.

iv. ප්‍රජා සහභාගීත්වයෙන් MV - X Press Pearl නෞකාවෙන් විසිරුණු පබලු ඇහිදීම සඳහා 2021 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් දක්වා දීමනා ලෙස රු.248.192.250 ක් හා උපකරණ. ප්‍රවාහන. ආහාර හා වෙනත් වියදම් සඳහා රු.553.824.237ක් වශයෙන් වියදම් දරා තිබුණි. දෛනිකව එකතු කරන ලබන මුළු පබළු ප්‍රමාණයෙහි සාමාන්‍ය අගය 2022 ට සාපේක්ෂව කි.ග්‍රෑම 44 සිට 2023 වනවිට කිලෝ ග්‍රෑම් 20 කට ආසන්න අගයක් දක්වා අඩුවී තිබුණු නමුත් 2023 වර්ෂයේ ප්‍රජා සහභාගීත්වය සඳහා දරන ලද පිරිවැයෙහි අඩුවීම රු.මිලියන 124 ක සිට රු.මිලියන 106 ක් දක්වා රු.මිලියන 18 ක් පමණක් විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති